වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்டக் அமைச்சு
Ministry of Plantation

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

தென்னை, கித்துல் மற்றும் பனை செய்கை மேம்பாடு மற்றும் அவை சார்ந்த கைத்தில் பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சு

State Ministry of Coconut, Kithul and Palmyrah Cultivation Promotion and Related Industrial Product Manufacturing & Export Diversification

2020



පොල් වගාකිරීමේ මණ්ඩලය
தென்னைப் பயிர்ச்செய்கைச் சபை
Coconut Cultivation Board

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායී පොල් නිෂ්පාදකයා කරවීම

இலக்கு

இலங்கையினை உலகத்தில் மிகவும் வினைத்திறனான மற்றும் உற்பத்தி திறனான தென்னை உற்பத்தியாளராக்குதல்

Vision

To make Sri Lanka globally the most efficient & effective Coconut Producer

මෙහෙවර

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟාකර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීමත් තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම අපගේ මෙහෙවරයි

செயற்பணி

இலங்கையில் உள்நாட்டு நுகர்வுத் தேவை மற்றும் ஏற்றுமதித் தேவையினை பூர்த்தி செய்தல், சுயபோசணை நிலைமையினை நெருங்கும் பொருட்டு வினைத்திறனான மற்றும் உற்பத்தி திறனாக ஆலோசனையாளர் மற்றும் பரவலாக்கல் சேவையின் ஊடாக தென்னை உற்பத்தியினை உயர்த்துதலும், தென்னங் காணிகளில் உற்பத்தித் திறனினை உயர்த்துவதன் ஊடாக தென்னைப் பயிர்ச்செய்கையாளர்களுக்கு உயர்ந்த வாழ்க்கை மட்டத்தினை வழங்குவதும் எங்களது செயற்பணியாகும்

Mission

To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement

වාර්ෂික වාර්තාව

2020

අරමුණ

- පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ගහණය වැඩි කිරීම තුළ පොල් ඵලදාව වැඩි කිරීම
- සත්ත්ව පාලන/ අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායීතාවය හා ගොවිපළ ආදායම වැඩි කිරීම
- පොල් වගාවේ මධ්‍ය හා සුළු පරිමාණ වගාවන්හි පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමු කරනු වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධාන ගත කර ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිත කර දිළිඳුකම පිටු දැකීම
- විරස්ථායී පොල් වගාවක් සඳහා කාබනික පොහොර යෙදීම ප්‍රවර්ධනය කිරීම
- රටේ ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා 2020 වන විට වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3000 දක්වා ඉහළ නැංවීම
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලු පොල් වතු ආදර්ශ පොල් උයන් තත්වයට පත් කිරීම හා 2020 වන විට ලාභය 20%කින් වැඩි කිරීම

ඉලක්ක

- සෑම පොල් වගාකරුවකු වෙත පොල් වගාවේ තාක්ෂණික දැනුම ගෙනයාම හා කුසලතා වර්ධනය කිරීම
- ඉල්ලුම පදනම් කරගත් ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම සහ උසස් තත්ත්වයේ යෙදවුම් ලබාදීම
- ශ්‍රී ලංකාව තුළ තිරසාර පොල් වගාවක් ස්ථාපනය කිරීම
- පොල් ඉඩම් සඳහා සුදුසු අතුරුබෝග වගාකිරීමෙන් පොල් ඉඩම්වල උපයෝගීතාවය ඉහළ දැමීම
- කප්රුක පුරවර වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම
- කාබනික හා අකාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම
- පොල් ඉඩම් තුළ පාංශු හා ජල සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම
- පළිබෝධ හා රෝගවලින් පොල් වගාවට වන හානිය අඩු කිරීම
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්, වගාකරුවන් දැනුවත් කිරීම සඳහා යොදා ගැනීම
- ගෘහස්ථ පරිභෝජනයට, පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය වන පොල් ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කිරීම

හැඳින්වීම

පොල් වගාකිරීමේ මණ්ඩලය, 1971 අංක 46 දරණ පොල් සංවර්ධන ආඥා පනතේ අංක 02 වගන්තිය යටතේ දිවයිනේ පොල් වගාවේ සංවර්ධනය අරමුණු කොට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 1972 මාර්තු මස 30 වෙනි දින ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගයකින් පිහිටුවනු ලැබීය.

2020 ජනවාරි මස 01 වෙනි දින සිට 2020 දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මෙම වාර්තාවට ඇතුළත් කොට ඇත.

එකී පනතේ ප්‍රකාරව මණ්ඩලයේ කාර්යභාරය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

- පොල් වගාකළ ඉඩම්වල ඵලදාව වර්ධනය කිරීම හා එලෙස වර්ධනය කිරීමෙහිලා සහාය වීම
- ඉඩම්වල පොල් වගාකිරීම, ඒවා වගාකිරීම වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීමට සහාය වීම.(තෘණ ඇතුළුව) වෙනත් වගාවන්ගෙන් අතුරු වගාව සඳහා සුදුසු පොල් වගා කළ ඉඩම් තෝරා ගැනීම හා එකී ඉඩම්වල අතුරු වගා වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය වීම
- පොල් වගාකළ ඉඩම්වල සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම හා විධිමත් කිරීම, ඊට සහාය වීම හා එහි නියුක්ත වීම
- පොල් වගාකළ ඉඩම්වල පොල් හා වෙනත් බෝග වැවීම සම්බන්ධයෙන් නිසි වගා ක්‍රම විස්තර කිරීම, ජනප්‍රිය කිරීම, වැඩි දියුණු කිරීම හා මෙහෙයවීම
- පොල් කර්මාන්තයට සහාය වීම, උපදේශක හා ව්‍යප්ති සේවකයින් පුහුණු කිරීම



අධ්‍යක්ෂ මණ්ඩලය 2020

- ජයන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
- ජේ.එම්.ටී. ජයසුන්දර මහත්මිය - වැවිලි අමාත්‍යාංශ නියෝජිත
- තරංගා ලියනගේ මහත්මිය - මුදල් අමාත්‍යාංශ නියෝජිත
- ඒ.ඊ. ප්‍රනාන්දුපුල්ලේ මහතා - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- සරත් එන් පෙරේරා මහතා - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- එස්.කේ.මල්ලවආරච්චි මහතා - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- සුරේෂ් සිල්වා මහතා - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- අනිල් කුමාර සේනාධීර මහතා - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
- ආචාර්ය සනාතනී රණසිංහ මහත්මිය - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික

සභාපතිතුමාගේ පණිවිඩය



සමස්ත ලෝකවාසීන් කොවිඩ් 19 වසංගතයෙන් පීඩාවට පත් කරමින් 2020 වර්ෂය උදාවිය. එහි බලපෑමට ශ්‍රී ලංකා වාසීන්ට මෙන්ම පොල් වගාකිරීමේ මණ්ඩලයටද මුහුණ දීමට සිදුවිය. අඩ සියවසක ආසන්න ඉතිහාසයකට උරුමකම් කියන පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉතිහාසය තුළ මෙවන් වකවානුවකට මුහුණ පා නොමැති තරම්ය. විශේෂයෙන්ම, පොල් වගාකිරීමේ මණ්ඩලය ව්‍යාප්ති සේවාවක් මූලික කොට ගෙන ක්‍රියාත්මක වන සේවා ආයතනයක් වන හෙයින් ක්ෂේත්‍ර රාජකාරි වල නියැලීම අනිවාර්ය වේ. එහෙත් පැවති සෞඛ්‍ය නිර්දේශ හා නිරෝධායන ඇඳිරි නීතිය, ප්‍රදේශ වසා දැමීම හා කාර්ය මණ්ඩලය ආසාදනය වීම වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීම දැඩි අභියෝගයට ලක් කරන ලදි. කෙසේ වෙතත් එම අභියෝගයන්ට මුහුණ දුන් අප කාර්ය මණ්ඩලය රට තුළ පැවති සෞඛ්‍ය නිර්දේශයන්ට අනුගත වෙමින් උපරිම සේවාවක් සඳහා කැපවීම අගය කල යුතුය.

පොල් පාරිභෝකයාටත් වගා කරුවාටත් අසාධාරණයක් නොවන පරිදි පොල් මිල පාලනය කර ගනිමින් දේශීය පරිභෝජනය සඳහා පොල් අවශ්‍යතාවයන් සපුරා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් මඟින් ලබා ගන්නා වාර්ෂික අපනයන ආදායම ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වාර්ෂික පොල් ඵලදාව ඉහළ නංවා ගැනීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන අභියෝගයයි. මේ සඳහා පොල් වගාවේ පලදාව ඉහල නැංවීම සඳහා වගා කරුවන් දිරි ගැන්වීම වෙනුවෙන් පෝෂක යෙදීම, ජල සම්පාදන, පාළු පැළ සිටුවීම හා පැළ ආරක්ෂණය වැනි දෑ සඳහා ආකර්ෂණීය සහනාධාර රැසක් හඳුන්වා දෙනු ලැබිය. මේ සඳහා රු.මි 490 ක් පමණ වැය කරන ලදි. එමෙන්ම දිවයිනේ පොල් වගා බිම් ප්‍රමාණය වර්ධනය කර ගැනීම සඳහා පොල් වගා කළ හැකි ගෙවතු ඇතුළු සෑම බිම් කොටසකම පොල් පැළයක් සිටුවීමට වගා කරුවන් උනන්දු කර අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දී ගුණාත්මක උසස් තත්වයේ පොල් පැළ මිලියන 02 ක් පමණ සිටුවීමට කටයුතු කරන ලදී. මේ සඳහා ජනවසම හා විහාර දේවාල ගම් පනත යටතේ ඇති ඉඩම් බදු පදනම මත ලබාගෙන පොල් වගා කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබුණ ද පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් එහි කටයුතු පමා විය.

අතිගරු ජනාධිපතතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීමේ අටියෙන් පොල් වගාවේ සංවර්ධන කටයුතු ද දිශානුගතව ක්‍රියාත්මක විය. මේ සඳහා ගරු වැවිලි අමාත්‍යතුමා හා ගරු රාජ්‍ය අමාත්‍ය තුමාගේ උපදෙස් හා මාර්ගෝපදේශකත්වය ඇතිව එම අමාත්‍යංශ ලේකම්තුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගය පිළිබඳව කෘතවේදීව සිහිපත් කරමි. 2020 වර්ෂයේ කටයුතු සාර්ථකව නිමකර ගැනීමට දායක වූ ගරු අධ්‍යක්ෂක මණ්ඩලයට හා ආයතනයේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

ජයන්ත වික්‍රමසිංහ
සභාපති
පොල් වගාකිරීමේ මණ්ඩලය

සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය



2020 වර්ෂය තුල පොල් වගාකිරීමේ මණ්ඩලයට තවත් අභියෝගාත්මක වර්ෂයක් වුයේ වෙනදා මෙන් කාලගුණික හෝ දේශගුණික වැනි පරිසර සාධක නිසාවෙන් නොව අනපේක්ෂිතව අපට බලපෑම් කල covid 19 ගෝලීය වසංගතය නිසාවෙනි.

2020 වර්ෂයේ ජාතික අයවැය යෝජනා මඟින් පොල් වගාකිරීමේ මණ්ඩලය සඳහා රු.මි. 800 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 වර්ෂයේ ඉලක්කය-න් අතර ප්‍රධාන වනුයේ පවතින පොල් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීමත් දිවයින තුළ පොල් වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීමත්ය. මෙමඟින් වාර්ෂික පොල් ඵලදාවේ පැහැදිලි වෙනසක් ඇති කළ හැකි අතර එමඟින් පොල් මිල පාලනයත් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම ඉහල නැංවීමත් කල හැකි බව විශ්වාස කරමි. එමෙන්ම ගෘහස්ථ පොල් පරිභෝජනයේදී ඇතිවන නාස්තිය අවම කිරීමටද අවධානය යොමු විය යුතුය.

පවතින වගාවේ පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා හදුන්වා දුන් පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන සඳහා රු.මි 130 ක් පමණ වැය කළ අතර එයින් පොල් ඉඩම් අක්කර 7,656 ක් පමණ සංවර්ධනය කිරීමට හැකියාව ලැබුණි. ජල සම්පාදන සහනාධාර සඳහා රු.මි 53 ක් පමණ වැය කළ අතර එයින් පොල් ඉඩම් අක්කර 2,099 ක් පමණ සංවර්ධනය කෙරුණි. ඒ අතර තවත් පොල් ඉඩම් අක්කර 1,447 ක් කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය යටතේ සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදි.

2020 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ගුණාත්මක බවින් යුතු පොල් පැළ මි. 02 ක් පමණ නිෂ්පාදනය කළ අතර එම පැළ ගෙවතු/නව/නැවත/යටි වගා හා පාළු පැළ සිටුවීම සඳහා යොදා ගැනුණි. වගා කරුවන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා විවිධ ව්‍යාප්ති වැඩ සටහන් 1,100ක් පමණ සිදු කර ඇත. ඒ සඳහා රු.මි 13 ක් පමණ වැය කර ඇත.

එමෙන්ම පොල් වගා රෝග පලිබෝධ මර්ධනය සඳහා කෘමිනාශක, පෙරමෝන, විලෝපික මයිටා-වන් සැපයීම සඳහා රු.මි 01 ක් පමණ වැය කර ඇති අතර පුහුණු වැඩ සටහන් සඳහා රු.මි 01 ක් වැය කර ඇත. වෙනත් වර්ෂයන්ට සාපේක්ෂකව 2020 වර්ෂයේ ඉලක්ක අගයන් ඉහළ අගයක නොපැවතියද වර්ෂ ආරම්භයේ අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමේ හැකියාව ලැබුණි.

ඒ සඳහා ගරු වැවිලි අමාත්‍ය තුමාගේ උපදෙස් හා මඟ මඟපෙන්වීම නොමසුරුව ලැබුණු බව ස්තුති පූර්වක ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම එම අමාත්‍යංශ ලේකම්තුමන්ලා හා කාර්ය මණ්ඩලය ලබා දුන් සහයෝගයට ඉතාමත් ස්තුතිවන්ත විය යුතුය. එමෙන්ම මෙම වර්ෂය වෙනුවෙන් මහඟු දායකත්වයක් සැපයූ පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය ස්තුති පුර්වකව සිහිපත් කරමි.

එම්.ජේ.එස්.රවිසිංහ
සාමාන්‍යාධිකාරි
පොල් වගාකිරීමේ මණ්ඩලය

පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකෙවින්

දිවයිනේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල 19ක්, පොල් සංවර්ධන නිලධාරී කාර්යාල 265ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන 03 ක්, තවාන් 39 ක්, ආදර්ශ පොල් උයන් 12 ක් හා බීජ නිෂ්පාදන ඒකකයකින් පොල් වගාකිරීමේ මණ්ඩලය සමන්විත වේ.



ප්‍රධාන කාර්යාලය

9/428, පොල් වගාකිරීමේ මණ්ඩලය,
කප්රුක පියස,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දුරකථන 011-2861331, 011-5635623
ෆැක්ස්- 011-5549507
විද්‍යුත් තැපෑල - ccb@sltnet.lk
වෙබ් අඩවිය - www.coconut.gov.lk

අනුමත ස්ථිර කාර්යය මණ්ඩලය 918 කි

සාමාන්‍යාධිකාරී	01
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	04
සහකාර සාමාන්‍යාධිකාරී	08
ප්‍රාදේශීය කළමනාකරුවන් හා විෂය භාර කළමනාකරුවන්	36
කණිෂ්ඨ කළමනාකරුවන්	95
භාෂා පරිවර්ථකයින්	02
කළමනාකරණ සහකාර තාක්ෂණික	
- පොල් සංවර්ධන නිලධාරීන්	300
- නේවාසික තවාන් භාර නිලධාරී	40
- තාක්ෂණික සහකාර	03
- පුහුණු නිලධාරී	01
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන	
- පොල් සංවර්ධන සහකාර	76
- කළමනාකරණ සහකාර	200
ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්	152
සමස්ත කාර්යය මණ්ඩල ශක්තිය	918 කි

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආයතනික ව්‍යුහය



පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය



පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

ප්‍රාදේශීය කාර්යාල 19ක්			
අනු අං.	ප්‍රාදේශීය කාර්යාලය	ලිපිනය	දුරකථන අංකය
01	අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය	තුන්වන පියවර, දහයියාගම හන්දිය, අනුරාධපුර.	025-2222543
02	අම්පාර ප්‍රාදේශීය කාර්යාලය	ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර	063-2222477
03	කළුතර ප්‍රාදේශීය කාර්යාලය	නාගොඩ, කළුතර	034-2222732
04	කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය	වරකාඋල්ල වලව්ව, කරඬුපන, නුවරපාර, කෑගල්ල.	035-2222120
05	කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය	වැහැර, කුරුණෑගල.	037-2222534
06	කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාලය	අංක20, පන්නල පාර, කුලියාපිටිය.	037-2281169
07	ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය	බැන්ඩියමුල්ල, ගම්පහ.	033-2222037
08	ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය	ලබුදුව, අක්මීමන, ගාල්ල.	091-2234501
09	ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය	කුඹුරුප්පිඩි, ත්‍රිකුණාමලය	026-2054018
10	පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය,	නව නගරය, පොළොන්නරුව.	027-2222377
11	මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය	මයිලම්බවැලි, තන්නමුනෙයි, මඩකලපුව.	065-2240103
12	මාතර ප්‍රාදේශීය කාර්යාලය	අංක 331/9,අනගාරික ධර්මපාල මාවත, නූපේ, මාතර.	041-2222060
13	මාතලේ ප්‍රාදේශීය කාර්යාලය	නුවර පාර,කොහොඹිලිවල, මාතලේ	066-2222047
14	මාරවිල ප්‍රාදේශීය කාර්යාලය	මුදුකටුව, මාරවිල.	032-2254237
15	මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය	හුලංදාව දකුණ, මොණරාගල.	055-2276058
16	යාපනය ප්‍රාදේශීය කාර්යාලය	අංක 595/10,නාවලර් පාර,නල්ලූර්, යාපනය	021-2284501
17	රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය	නව නගරය, රත්නපුර.	045-2228561
18	හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය	අංක 27,තංගල්ල පාර, හම්බන්තොට	047-2220144
19	වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය	අංක 25, පත්තිනියාර්,මහිලන්කුලම්, කාන්ඩිකුලම්, වව්නියාව	024-2050344

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු බීජ පොල් පැළ තවාන් 39ක්			
අනු අං.	ප්‍රාදේශීය කාර්යාලය	ලිපිනය	දුරකථන අංකය
01	අනුරාධපුර	**1. කලාවැව** පොල් පැළ තවාන, කලාවැව, විජිතපුර.	025-2264194
02	අම්පාර	**2. උහන** පොල් පැළ තවාන, පාලම්කඳවුර,උහන.	063-2250119
03	කළුතර	**3. කොරොස්දුව** පොල් පැළ තවාන, කොරොස්දුව, වාද්දුව.	038-2295126
04	කෑගල්ල	**4. මත්තමගොඩ** පොල් පැළ තවාන, මත්තමගොඩ, කන්නන්තොට.	035-2289105
		5. එරමිණිගොල්ල පොල් පැළ තවාන, එරමිණිගොල්ල, හිරිවඩුන්න.	035-2263006
05	කුරුණෑගල	**6. ඉබ්බාගමුව** පොල් පැළ තවාන, ඉබ්බාගමුව.	037-2235776
		7. වාරියපොළ පොල් පැළ තවාන, වාරියපොළ .	037-2267691
		8. නිකවැරටිය පොල් පැළ තවාන, නිකවැරටිය.	037-2260619
		9. පොල්ගහවෙල පොල් පැළ තවාන, සෙරපිස්වත්ත, පනලිය, පොල්ගහවෙල	037-2244367
		10. වෙන්නොරුව පොල් පැළ තවාන, මුතුගලවත්ත, වෙන්නොරුව	037-2249836
		11. දොඩන්ගස්ලන්ද පොල් පැළ තවාන, බලවත්තල වත්ත, දොඩන්ගස්ලන්ද.	037-2252625
06	කුලියාපිටිය	**12. බිංගිරිය** පොල් පැළ තවාන, ප්‍රසන්න ගම, බිංගිරිය.	032-2246425
		13. කන්දෙටිය පොල් පැළ තවාන, කන්දෙටිය, මාකඳුර,ගෝනවිල	031-2299386
		14. හෙට්ටිපොල පොල් පැළ තවාන, හෙට්ටිපොල.	037-2291332
		15. දියදොර පොල් පැළ තවාන, පහළ දියදොර.	037-2282537
		16. මහයාය පොල් පැළ තවාන, මහයාය.	031-2299938
07	ගම්පහ	**17. වල්පිට** පොල් පැළ තවාන, වල්පිට.	033-2272559
		18. කිරිදිවැල පොල් පැළ තවාන, කිරිදිවැල.	033-2267704
08	ගාල්ල	**19. බද්දේගම** පොල් පැළ තවාන, පෙඩස්රුවත්ත, හල්පාතොට, බද්දේගම, ගාල්ල.	091-2292745
		20. ලබුදුව පොල්පැළ තවාන, ලබුදුව, අක්මීමන, ගාල්ල.	091-2234501
09	ත්‍රිකුණාමලය	**21. කුඹුරුප්පිඩ්ඩි** පොල් පැළ තවාන, කුඹුරුප්පිඩ්ඩි, ත්‍රිකුණාමලය.	026-2054018
		22. සේරුවිල පොල් පැළ තවාන, සේරුවිල.	026-2054018
10	පොළොන්නරුව	**23. පරාක්‍රම සමුද්‍රය** පොල් පැළ තවාන, රිවඩ් අළුවිහාරේ උද්‍යානය,පරාක්‍රම සමුද්‍රය.	027-2224304
		24. උල්හිටිය පොල් පැළ තවාන, උල්හිටිය වත්ත, ගිරාඳුරුකෝට්ටේ	071-3208878
11	මඩකලපුව	**25. මයිලම්බවේලි** පොල් පැළ තවාන, මයිලම්බවේලි,තන්නමුනේයි, මඩකලපුව	065-2240924
12	මාතලේ	**26. පල්ලේකැලේ** පොල් පැළ තවාන, පල්ලේකැලේ, බලගොල්ල, කෙන්ගල්ල.	081-2063595
13	මාරවිල	**27. කිරිමැටියාන** පොල් පැළ තවාන, කිරිමැටියාන, ලුණුවිල.	031-2257504
		28. විල්පොත පොල් පැළ තවාන, විල්පොත, බත්තුළුඔය.	071-4305076
		29. අට්ටවිල්ලුව පොල් පැළ තවාන , අට්ටවිල්ලුව, කුරුණෑගල පාර, පුත්තලම.	077-9042439

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

14	මොණරාගල	**30.** හඳපානගල පොල් පැළ තවාන, හඳපානගල, වෙහෙරයාය.	055-2274665
		31. වැලිපිටිය පොල් පැළ තවාන, වැලිපිටියවත්ත, නන්පුරාව, බිබිල.	071-9313078
15	වව්නියා	**32.** මඩු පොල් පැළ තවාන, මන්නරම	024-2050344
16	යාපනය	**33.** කිලිනොච්චි පොල් පැළ තවාන, ඩී 3, පන්නන්කන්නි, කිලිනොච්චි.	076-2236584
		34. දේවිපුරම් පොල් පැළ තවාන, අංක 29/A කොටස, දේවිපුරම් පුදුකුඩිරිප්පු, මුලතිව්.	077-0784323
		35. අව්වුවේලි පොල් පැළ තවාන, වාසවිලාන් පාර, අව්වුවේලි, යාපනය	077-1110709
		36. අලම්පිල් පොල් පැළ තවාන, අලම්පිල්, මුලතිව්	077-4008366
17	රත්නපුර	**37.** ඇඹිලිපිටිය පොල් පැළ තවාන, තුංකම, ඇඹිලිපිටිය.	047-2230569
18	හම්බන්තොට	**38.** මැදමුලන පොල් පැළ තවාන, මැදමුලන, වීරකැටිය.	047-2246359
		39. මයුරපුර පොල් පැළ තවාන, මයුරපුර, හම්බන්තොට	071-5534017

ආදර්ශ බීජ පොල් උයන් 12ක්		
අනු අංකය	ලිපිනය	දුරකථන අංකය
01	**මහයාය** ආදර්ශ පොල් උයන, මාකඳුර , ගෝනවිල.	031-2299781
02	**ලේනව** ආදර්ශ පොල් උයන, හිරියාල, ලේනව.	037-4944425
03	**ඩෙසිවැලි** ආදර්ශ පොල් උයන, ඉලුක්වෙල, වැඋඩ	037-2299880
04	**රන්දෙණිය** ආදර්ශ පොල් උයන, වාරියපොළ.	037-5555217
05	**නාගන්සෝල** ආදර්ශ පොල් උයන, වන්නි,රස්නායකපුර.	076-6905199
06	**ඛෝපිටිය** ආදර්ශ පොල් උයන, ඛෝපිටිය.(වයඹ)	037-2288601
07	**ගර්ට්ලන්ඩ්** ආදර්ශ පොල් උයන, නාඹිරිත්තන්කඩවර, වැලිපැන්නගහමුල.	071-8997989
08	**කොහොඹාන** ආදර්ශ පොල් උයන, කොහොඹාන වත්ත, ගොනාගොල්ල.	076-6905205
09	**කොරෙයි** ආදර්ශ පොල් උයන, තිරුක්කෝවිල්.	067-3694530
10	**මුන්දලම** ආදර්ශ පොල් උයන, මුන්දලම.	032-2052355
11	**පාසිකුඩා** ආදර්ශ පොල් උයන, කල්කුඩා, පාසිකුඩා.	065-2050224
12	**පලෙයි** ආදර්ශ පොල් උයන, නුවර පාර, පලෙයි.	021-2050013

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු පුහුණු මධ්‍යස්ථාන 03ක්			
අනු අං.	පුහුණු මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංකය
01	**ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය**	සහකාර සාමාන්‍යාධිකාරී (පුහුණු), පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, පොල් වගාකිරීමේ මණ්ඩලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල.	031-2255048
02	**මැදමුලන දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය**	ස්ථාන භාර නිළධාරි, දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, පොල් වගාකිරීමේ මණ්ඩලය, මැදමුලන, වීරකැටිය	047-2257534
03	**යාපනය පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය**	ස්ථාන භාර නිළධාරි, පොල් පැළ තවාන, අරාලි පාර, අව්වුවේලි, යාපනය	021-3141245

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

බීජ නිෂ්පාදන ඒකකය			
01	බීජ නිෂ්පාදන ඒකකය	අංක 19, තම්මිට පාර, මීගමුව.	031-2226119

පොල් තාක්ෂණික උද්‍යානය			
01	පොල් සංස්කෘතික උද්‍යානය	පොල් තාක්ෂණික උද්‍යානය පාසිකුඩා ආදර්ශ පොල් උයන, කල්කුඩා.	065-2050224

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු සංචාරක නිවාස 07ක්			
අනු අංකය	සංචාරක නිවාසය	ලිපිනය	දුරකථන අංකය
01	මඩකලපුව	"කොකෝවිලා"පාසිකුඩා, පාසිකුඩා ආදර්ශ පොල් උයන, කල්කුඩා	076-6905225 065-2050224
02	අනුරාධපුර	"කොකෝවිලා"කටුකැලියාව, අනුරාධපුර	072-3756713 025-3243554
03	යාපනය	"කොකෝවිලා"පලෙයි, නුවර පාර, පලෙයි	078-3639872 021-2050013
04	කුලියාපිටිය	"කොකෝවිලා"බෝපිටිය, බෝපිටිය	076-6905225 037-2288601
05	මොණරාගල	"කොකෝවිලා"හඳපානාගල, හඳපානාගල පොල් පැළ තවාන, වෙහරයාය	055-2274665
06	කතරගම	"කොකෝවිලා"කතරගම, ඩිපෝව පාර, සංචාරක නිවාස පෙදෙස, කතරගම	055-2276058
07	ත්‍රිකුණාමලය	"කොකෝවිලා"නිලාවෙලි, කුඹුරුප්පිඩිඩි, ත්‍රිකුණාමලය	070-3009649

"කප්තුරුපාය" වෙළඳසැල් හා සේවා මධ්‍යස්ථාන 05ක්		
අනු අං.	ලිපිනය	දුරකථන අංකය
01	මහයාය ආදර්ශ පොල් උයන මාකඳුර,ගෝනවිල	031-2299781
02	බෝපිටිය ආදර්ශ පොල් උයන බෝපිටිය.(වයඹ)	037-2288601
03	පොල් වගාකිරීමේ මණ්ඩලය, "කප්රුක පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.	011-2861331
04	ඩෙසිවැලි ආදර්ශ පොල් උයන, ඉලුක්වේල, වැලිඔය	037-2299880
05	අම්පාර ප්‍රාදේශීය කාර්යාලය, ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර	063-2222477

ඇතුළත පිටු

01. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන්	01
02. ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්	37
03. පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය	77
04. අභ්‍යන්තර විගණන අංශය	80
05. මූල්‍ය කළමනාකරණ අංශය	83
06. විගණකාධිපතිගේ වාර්තාව	89

1.0 පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන්

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවයසපුරාලමින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත්කරලීමේහාරවූර වගකීම ප්‍රධාන වශයෙන් පැවරී ඇත්තේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සහ සංවර්ධන අංශය වෙතවේ. මෙම ක්‍රියාවලිය වඩාත් විධිමත්ව සහ ඵලදායීතාවයෙන්යුක්තව සපුරා ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති සහ සංවර්ධන)ගේ සෘජු අධික්ෂණය යටතේ ක්‍රියාත්මක දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල 19ක් පවතී. මෙම ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත පොල් සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත 225කට ආසන්න ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් මඟින් සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වශයෙන් පොල් වගාවේ නියැලී සිටින වගාකරුවන් වෙත අවශ්‍ය තාක්ෂණික උපදෙස් සහ යෙදවුම් ලබාදීම සිදු කරයි.

වාර්ෂිකව පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන්වෙන්කෙරෙන ප්‍රතිපාදන අනුව සහ වැවිලි අමාත්‍යාංශයේ සහ පොල්, කිතුල්, තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මඟපෙන්වීම මත වාර්ෂික සංවර්ධන වැඩසටහන් සැලසුම් කරනු ලබන අතර ඒ අනුව 2020 වර්ෂයේදී පහත සඳහන් සහනාධාර සහ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1.1 ක්‍රමවත් පොල් වගාව යටතේ පැළ සිටුවීම

මෙම සහනාධාරය යටතේ පොල් වගාකරුවන්ට නව වගාවක්, යටිවගාවක් හෝ නැවත වගාවක් ඇති කිරීම සඳහා නොමිලේ පොල් පැළ ලබා දෙන අතර අවම අක්කර ¼සිට උපරිම අක්කර 15 දක්වා වගාකිරීමට පොල් පැළ ලබාදේ. එසේම මෙම පැළ වගාකරු වෙත ප්‍රවාහනය කර දෙනු ලබන අතර පැළ නිකුත් කිරීමට පෙර පැළ සිටුවීම හා නඩත්තුව පිළිබඳ තාක්ෂණික උපදෙස් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ලබාදේ.2020 වර්ෂයේදී මෙම වැඩසටහන මඟින් පොල් පැළ 570,000 ක්සිටුවීමට ඉලක්ක කරන ලද අතර වර්ෂය අවසන් වන විට පැළ 934,089 ක්සිටුවීමටපොල් වගාකිරීමේ මණ්ඩලය සමත් විය.

වගු අංක **1.1. 2020** වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ක්‍රමවත් පොල් වගාව යටතේ පැළ සිටුවීමේ භෞතික ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	භෞතික ඉලක්කය (පැළ)	භෞතික ප්‍රගතිය (පැළ)
මොණරාගල	22000	39786
මාතර	4000	4200
කුරුණෑගල	182500	182664
කුලියාපිටිය	40000	144088
කෑගල්ල	14000	31163
ගම්පහ	20000	30685
කළුතර	20000	18739
මාරවිල	50000	130947
රත්නපුර	6500	30833
හම්බන්තොට	31000	74513
අනුරාධපුරය	27000	29360
ත්‍රිකුණාමලය	20000	29298
පොළොන්නරුව	10000	10156
අම්පාර	20000	39443
මාතලේ	14000	19244
ගාල්ල	22000	14098
මඩකලපුව	18000	30141
යාපනය	18500	37900
වව්නියාව	30500	36831
එකතුව	**570000**	**934,089**

1.2 ගෙවතු වගා වැඩසටහන

ශ්‍රී ලාංකිකයන්ගේ දෛනික පොල් පරිභෝජන අවශ්‍යතාවය තම ගෙවත්තෙන්ම නිෂ්පාදනය කිරීමට ගෙවතු හිමියන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙම සහනාධාර වැඩසටහන ක්‍රමවේද කිහිපයක් මඟින් ගෙවතු හිමියන්ට පොල් පැළ ලබා දීම සිදු කරනු ලැබේ.2020 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ පැළ 555,000ක්සිටුවීමට සැලසුම් කරන ලද අතර වර්ෂය අවසානය වන විට පැළ 488,805 ක් සිටුවන ලදි.

වගු අංක 1.2 : 2020 වර්ෂයේදී ප්‍රදේශීය කාර්යාල මට්ටමින් ගෙවතු වගා වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	භෞතික ඉලක්කය (පැළ)	භෞතික ප්‍රගතිය (පැළ)
මොණරාගල	14000	26,359
මාතර	2500	2,534
කුරුණෑගල	73500	74,025
කුලියාපිටිය	85000	17,682
කෑගල්ල	27000	22,775
ගම්පහ	51000	70,779
කළුතර	15000	22,611
මාරවිල	130000	41,879
රත්නපුර	8000	5,386
හම්බන්තොට	18000	13,836
අනුරාධපුරය	25000	46,573
ත්‍රිකුණාමලය	17000	19,224
පොළොන්නරුව	20000	24,496
අම්පාර	12000	19,165
මාතලේ	16000	32,934
ගාල්ල	20000	22,099
මඩකලපුව	6500	9,031
යාපනය	12500	15,287
වව්නියාව	2000	2,130
එකතුව	555,000	488,805

1.3 පාළු පැළ සිටුවීම මඟින් පොල් ඉඩමක පැවතිය යුතු ප්‍රශස්ථ පොල් ගස් සංඛ්‍යාව නඩත්තු කිරීම

අක්කරයක නඩත්තු කළයුතු ප්‍රශස්ත පොල් ගස් ගණන නොපැවතීමශ්‍රී ලංකාවේ පොල් වගාවේ ඉඩම්වල පොල් ඵලදායිතාව අඩුවීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. 2020 වසරේදී පොල් ඉඩම් පුනරුත්ථාපනය යටතේ පාළු සිටුවීම සඳහා ඉලක්කගත පැළ ප්‍රමාණය 165,000 විය. 2020 වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන යටතේ පොල් පැළ 215,373ක්සිටුවන ලදි.

වගු අංක 1.3 : 2020 වර්ෂයේදී ප්‍රදේශීය කාර්යාල මට්ටමින් පාළු පැළ සිටුවීමේ භෞතික ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පැළ)	ලබාදුන්පැළගණන
මොණරාගල	1000	2131
මාතර	1500	1378
කුරුණෑගල	44000	45262
කුලියාපිටිය	20000	19532
කෑගල්ල	6000	6355
ගම්පහ	15000	10433
කළුතර	6000	5075
මාරවිල	30000	76121
රත්නපුර	1500	22031
හම්බන්තොට	5000	2058
අනුරාධපුරය	5000	5026
ත්‍රිකුණාමලය	5000	2312
පොළොන්නරුව	3000	3286
අම්පාර	5000	2005
මාතලේ	3000	3035
ගාල්ල	5000	1743
මඩකලපුව	1500	1606
යාපනය	5500	4500
වව්නියාව	2000	1484
එකතුව	**165000**	**215373**

ඉහත නව/නැවත/යටි වගා වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන, පාළු පැළ සිටුවීමේ වැඩසටහන යටතේ පැළ 1,638,267 ක් බෙදා දී ඇත. එම පැළ රු.175/= ක වටිනාකමක් සහිත බිම් පැළයක් රු.75/= ට සහ රු.250/= ක වටිනාකමක් සහිත බඳුන් පැළයක් රු.150/= ට සහනදායී මිලකට වගාකරුවෙකුහටම්ලදී ගත හැක. ඒ අනුව බිම් පොල් පැළයක හා බඳුන් පොල් පැළයක සහනාධාර වටිනාකම රු.100/= ක් විය. ඊට අමතරව විශේෂ ගෙවතු වගා සහනාධාර යටතේ පොල් පැළ 346,317 වගාකරුවන් වෙත නොමිලේ ලබා දෙන ලදි. මේ අනුව 2020 වර්ෂයේ ලබා දුන් මුළු පොල් පැළ සංඛ්‍යාව 1,984,584 ක් විය. ඒ සඳහා රු.මි.238.19ක මුල්‍ය ප්‍රතිපාදන වැය කර ඇත.

1.4 පෙර වසර වල සිටුවන ලද පොල් පැළ අධීක්ෂණය සඳහා සහනාධාර ලබා දීම

නව/නැවත/යටි වගා සහනාධාර ක්‍රමය යටතේ 2017,2018සහ 2019වර්ෂයේ වගා කරන ලද පොල් පැළ සඳහා නඩත්තු සහනාධාරයක් ලබා දීමට සැලසුම් කරන ලදි. එම පැළ නියමිත පරිදි ප්‍රශස්ථ තත්වයෙන් වර්ධනය වීඇති දැයි පසු විපරම් කිරීම තුලින් නව/නැවත/යටි වගා සහනාධාර වැඩසටහනෙහි ඵලදායිතාවය වැඩි කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණයි.

මේ යටතේ 2020 වර්ෂයේදී පොල් පැළ 660,505ක් සඳහා රු.මි 33.11 ක සහනාධාර ලබා දී ඇත.

වගු අංක 1.4 : 2020 වර්ෂයේදී ප්‍රදේශීය කාර්යාල මට්ටමින් පෙර වසරවල සිටුවන ලද පොල් පැළ අධීක්ෂණ සහනාධාරය යටතේ භෞතික ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පැළ)	ලබාදුන්පැළගණන
මොණරාගල	126,000	64706
මාතර	15,000	5617
කුරුණෑගල	59,320	57994
කුලියාපිටිය	65,150	60422
කෑගල්ල	25,000	22033
ගම්පහ	80,080	57802
කළුතර	50,400	51029
මාරවිල	76,500	31465
රත්නපුර	20,000	19702
හම්බන්තොට	26,000	20770
අනුරාධපුරය	32,200	32249
ත්‍රිකුණාමලය	19,760	17477
පොළොන්නරුව	12,099	12099
අම්පාර	20,000	9558

මාතලේ	37,179	32027
ගාල්ල	26,400	23536
මඩකලපුව	40,000	33776
යාපනය	82,071	82071
වව්නියාව	30,000	26172
එකතුව	**843,159**	**660505**

1.5 පොල් ඉඩම්වල හා පොල් වගාවේ ඵලදායිතාවය ඉහල නැංවීමේ වැඩසටහන්

පොල් ඉඩම්වල හා පොල් වගාවේ ඵලදායිතාවය ඉහල නැංවීම තුලින් කෙටි හා දිගු කාලීන වශයෙන් පොල් අස්වැන්න වැඩි කිරීමත් පොල් ගොවියාගේ ජීවන තත්වය උසස් කිරීමත් යන අරමුණ සපුරාගැනීම සඳහා ක්‍රමවේද කිහිපයක් යටතේ පොල් වගාකරුවාට සහනාධාර සැපයීම මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව පහත සහනාධාර වැඩසටහන් ක්‍රියත්මක කරනු ලැබීය.

විවිධ පුනරුත්ථාපන ක්‍රම යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම

මෙම වැඩසටහන මඟින් පහත ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු සඳහා වගාකරුවාට සහනාධාර ලබා දෙයි.

- පොල් ඉඩම් වල තෙතමන සංරක්ෂණය සඳහා ලෙලි වලවල් ඉදිකිරීම
- පාංශු සංරක්ෂණය සඳහා ගල් වැටි සහ සමෝච්ඡ කාණු ඉදිකිරීම
- පොල් වගාව සඳහා කාබනික පොහොර යෙදීම
- පොහොර කවය නඩත්තුව සහ වසුන් කිරීම
- පොල් ගසට ඩොලමයිට් යෙදීම

ඉහත ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු ඉටු කිරීම සඳහා අක්කරයකට රු. 12,000 ක උපරිම සහනාධාර මුදලක් වගාකරුවාට ලබා දෙයි.2020 වර්ෂයේදී පොල් අක්කර 7109 ක් පුනරුත්ථාපනය කිරීමට ඉලක්ක කරන ලද අතර වර්ෂය අවසාන වන විට පොල් අක්කර 7656ක් ප්‍රගතියක් ලබා ගෙන රු.මිලියන130ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගන්නා ලදි.

වගු අංක 1.5 : 2020 වර්ෂයේදී ප්‍රදේශීය කාර්යාල මට්ටමින් පොල් ඉඩම් පුනරුත්ථාපනය යටතේ ගෙවීම් නිර්දේශ කරන ලද ඉඩම් ප්‍රමාණය.

ප්‍රාදේශීයකාර්යාලය	**ඉලක්කය (අක්කර)**	**ගෙවීම් නිර්දේශකිරීම (භෞතික ප්‍රගතිය අක්කර)**
මොණරාගල	200	143
මාතර	155	147
කුරුණෑගල	1427	1380

කුලියාපිටිය	727	701
කෑගල්ල	165	182
ගම්පහ	638	1049
කළුතර	220	219
මාරවිල	500	617
රත්නපුර	357	311
හම්බන්තොට	444	442
අනුරාධපුරය	281	281
ත්‍රිකුණාමලය	232	213
පොළොන්නරුව	190	190
අම්පාර	40	173
මාතලේ	326	429
ගාල්ල	213	197
මඩකලපුව	140	120
යාපනය	753	753
වව්නියාව	101	112
එකතුව	**7109**	**7656**

1.6 නල ජල සහනාධාර වැඩසටහන

නියඟයෙන් පොල් ගස ආරක්ෂා කිරීමටත්, වැඩි පොල් ඵලදාවක් ලබා ගැනීමටත් පොල් ගස සඳහා නිරන්තර ජල සැපයුමක් අවශ්‍ය වේ. ඒ අනුව අහිතකර දේශගුණික තත්ව යටතේදී පොල් වගාව ආරක්ෂා කිරීම සඳහා පොල් ඉඩමේ ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීමට සහනාධාර ක්‍රමයක් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලදි.

මේ යටතේ පොල් පර්යේෂණ ආයතනයේ අඩු වියදම් ජල සම්පාදන ක්‍රමය ලෙස නිර්දේශකරන ලද නල ජල සම්පාදනපද්ධති සඳහා සහනාධාර ලබා දෙනු ලැබීය. එහිදී පොල් අක්කරයක ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කිරීමට උපරිම රු 20,000ක සහනාධාරයක් ලබා දෙන ලදි.

2020 වර්ෂයේදී පොල් ඉඩම්වල නල මඟින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීමේ සහනාධාර යටතේ අක්කර 2099ක් ජල සම්පාදන පද්ධති ඉදිකරන ලද අතර ඒ සඳහා රු.මි.53.51ක් වැය කර ඇත.

මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් නිරූපණය වේ.

වගු අංක 1.6 : 2020 වර්ෂයේදී ප්‍රදේශීය කාර්යාල මට්ටමින් ජල නල සහනාධාරය යටතේ ගෙවීම් නිර්දේශ කිරීමේ ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (අක්කර)	ගෙවීම් නිර්දේශකිරීම (භෞතික ප්‍රගතිය අක්කර)
මොණරාගල	70	106
මාතර	25	19
කුරුණෑගල	360.5	295
කුලියාපිටිය	140	129
කෑගල්ල	50	50
ගම්පහ	100	101
කළුතර	42	44
මාරවිල	365	359
රත්නපුර	41	52
හම්බන්තොට	142	142
අනුරාධපුරය	137	137
ත්‍රිකුණාමලය	52.5	54
පොළොන්නරුව	117	117
අම්පාර	150	176
මාතලේ	86	85
ගාල්ල	32	32
මඩකලපුව	131	48
යාපනය	90	90
වව්නියාව	71	63
එකතුව	**2202**	**2099**

1.7 වැවිලි සවිය පුහුණු ශ්‍රමික බලකා ව්‍යාපෘතිය

පොල් වගාවට අවශ්‍ය යෙදවුම් වගාකරුවාට ලබා දීම තුලින් සිදු කරන ව්‍යාප්ති ක්‍රමවේදය දැනට පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් බහුලව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ක්‍රමවේදයට අමතරව

පුහුණු ගොවීන් මඟින් වඩාත් පහසුවෙන් වගාකරුවන්ට සමීප ව්‍යාප්ති සේවයක් ලබා දීමේ අරමුණ සහිතව වැවිලි සවිය පුහුණු ශ්‍රමික බලකාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීය.

මේ යටතේ 2020 වර්ෂයේදී වැවිලි සවිය පුහුණු ශ්‍රමිකයින් ඉඩම් 264 ක ප්‍රමාණයක වගාකරුවන් වෙත හඳුන්වාදී ඔවුන් විසින් ලබාගත් දැනුම අදාළ පොල් ඉඩම් සංවර්ධනය සඳහා යොදවන ලදි. තවද ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන් 47ක් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වා ඇත. මේ සඳහා රු.මි1.00 වැය කර ඇත.

1.8 විලෝපිත මයිටා පැකට් බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

පොල් මයිටා පාලන වැඩසටහන යටතේ 2020 වර්ෂයේදී සියළුම ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ ආවරණය කරමින් විලෝපිත මයිටා පැකට් 269,615ක් බෙදා දෙන ලදි. මෙහිදී විලෝපිත මයිටා පරපෝෂී පැකට් සහනදායී මිලකට වගාකරුවන් හට ලබාගැනීමට අවස්ථාව උදාවිය.

ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්නට ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබන මයිටාවන් පාලනය කිරීමට, කේන්ද්‍රගතව නිෂ්පාදනය කල පරපෝෂිතයන් බෙදාහැරීම සහ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල ගබඩා පහසුකම් ඉදිකිරීමේ අරමුණින් 2020 වර්ෂයේදී විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. මේ යටතේ 2020 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල 5ක මයිටා පරපෝෂී පැකට් ගබඩා කිරීමට ගබඩා පහසුකම් දියුණු කරන ලද අතර මේ යටතේ රු.මි. 5.29 ක මූල්‍ය ප්‍රතිපාදන වැය කරන ලදි.

1.9 වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ මාතර දිස්ත්‍රික්කයට අයත් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් මුලින්ම වාර්තා වූ වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී තත්ත්වය පසු කාලීනව ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වලින්ද වාර්තා විය. වෛරසයකට බොහෝදුරට සමාන ෆයිටොප්ලාස්මා ව්‍යාධිකාරකය මඟින් මෙම රෝගය ඇති කෙරෙන අතර දැනට ලෝකයේ කිසිදු රටක ෆයිටොප්ලාස්මා සඳහා නිසි ප්‍රතිකාරයක් සොයාගෙන නොමැත.

මෙම රෝගය හඳුනා ගැනීමෙන් පසුව පොල් පර්යේෂණ ආයතනය, ශාක ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීමේ නෛතික බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ එක්ව මාතර, හම්බන්තොට හා ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා කොට්ඨාස 408ක් රෝග කලාප වශයෙන් නම් කර ඇත.

එසේම රෝගය පිටතට බෝවීම වැලැක්වීම සඳහා ගාල්ල දෙනියාය සිට හක්මන හරහා තංගල්ල දක්වා වන මාර්ගයක කි.මී.86 ක් දිග කි.මී. 3 පළල රෝග වැලක්වීමේ කලාපයක් නම් කරන ලදී. මෙම කලාපයේ සියළුම රෝගී ගස් ගලවා දමන අතර මෙම කලාපයේ මායිම් වලින් පිටට පොල් ගසේ හි කිසිදු ජීවද්‍රව්‍යයක් ගෙනයාම ශාක ආරක්ෂක පනත යටතේ තහනම් කරන ලදී. එසේම කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් මෙම කුලයට අයත් අනෙකුත් භෝගයන් ප්‍රවාහනය සඳහා ද මෙම තහනම පනවා ඇත.

මෙම රෝගය මර්දනය සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති බැවින් පොල් පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි 2008 වසරේ සිට රෝගී පොල් ගස් ඉවත් කිරීම ආරම්භ කරන ලදී.

2020 වසර තුලදී පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ග්‍රාම නිලධාරී වසම් 149 ක් පරීක්ෂා කර රෝගී ගස් 14457 ක් හඳුනාගෙන ඇත. එයින් රෝගී ගස්13724ක් මේ වන විට ඉවත් කර ඇත. වන්දි වශයෙන් ලබා දී ඇති මුදල රු.මි. 28.302කි.

වගු අංක 1.7 : 2020 වර්ෂයේදී වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන යටතේ ප්‍රගතිය.

දිස්ත්‍රික්කය	පරීක්ෂා කළ ග්‍රාම නිලධාරී වසම් ගණන	සලකුණු කළ ගස් ගණන	ඉවත් කළ ගස් ගණන	ගෙවීම් කළ ගස් ගණන	ගෙවූ මුදල (රු.මි.)
මාතර	116	13284	12885	7,888	23,597,000.00
හම්බන්තොට	16	997	582	1133	3,364,500.00
ගාල්ල	17	176	257	446	1,341,000.00
එකතුව	**149**	**14457**	**13724**	**9,467**	**28,302,500.00**

1.10 ව්‍යාප්ති වැඩසටහන

ප්‍රධාන කාර්යාලයේ ව්‍යාප්ති හා සංවර්ධන අංශය විසින් වාර්ෂිකව සැලසුම් කරනු ලබන ජාතික මට්ටමේ ව්‍යාප්ති වැඩසටහන් ප්‍රාදේශීය කළමනාකරුගේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්ෂේත්‍ර මට්ටමින් පොල් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. එමෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි ව්‍යාප්ති හා සංවර්ධන අංශය සහ තොරතුරු ඒකකය ජාතික මට්ටමින් ව්‍යාප්ති සේවා මෙහෙයවනු ලබයි.

2020 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු ඉලක්ක කර ගන්නා ලදි.

1. පොල් වගාවේ ඵලදායිතාවය වැඩි කිරීම
2. කෘමි හා පළිබෝධ මඟින් පොල් වගාවේ සිදු වන හානිය අවම කිරීම
3. පොල් පැළ සිටුවීම සහ නඩත්තුව පිළිබඳ දැනුම වගාකරුවාට ලබා දීම
4. පොල් ඉඩමේ ජලය ආරක්ෂා කිරීම හා ජලය සම්පාදන කටයුතු ස්ථාපිත කිරීම
5. පොල් ඉඩමේ අතුරු වගාව හා සත්ව පාලනය

2020 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලය ව්‍යාප්ති වැඩසටහන් 6,672 දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් වගාකරුවන් හමුවීම් 223,022 සිදු කර ඇත. මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රු.මි 8.23 කි.

වගු අංක 1.8 : 2020 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ව්‍යාප්ති වැඩසටහන් වල ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	වාණිජ පොල් ඉඩම් සංවර්ධනය සඳහා කරන ව්‍යාප්ති වැඩසටහන්		ගම්මාන පාදක කරගත් පොල් ඵලදාව ඉහළ නැංවීමේ විශේෂ ව්‍යාප්ති වැඩසටහන්		සහනාධාර සමඟාමී ව්‍යාප්ති වැඩසටහන		රෝග පළිබෝධ මර්දන ව්‍යාප්ති වැඩසටහන	
	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
මොණරාගල	5	5	9	11	11	14	4	5
මාතර	10	11	17	25	16	29	7	18

කුරුණෑගල	18	20	20	16	14	10	39	53
කුලියාපිටිය	11	8	15	11	16	15	27	9
කෑගල්ල	7	7	11	11	16	16	11	11
ගම්පහ	7	11	10	13	15	15	17	19
කළුතර	6	4	13	14	17	17	8	4
මාරවිල	11	15	20	29	20	18	16	19
රත්නපුර	6	5	10	11	16	15	6	5
හම්බන්තොට	10	8	11	10	13	9	7	11
අනුරාධපුර	11	11	15	25	16	63	13	24
ත්‍රිකුණාමලය	11	26	12	15	14	15	14	22
පොළොන්නරුව	8	6	14	16	15	38	9	10
අම්පාර	7	4	11	14	16	18	5	4
මාතලේ	11	8	13	12	16	22	8	9
ගාල්ල	6	2	11	12	15	15	7	4
මඩකලපුව	6	7	11	11	15	13	5	14
යාපනය	7	7	15	21	17	19	8	7
වව්නියාව	6	8	10	10	12	14	4	6
එකතුව	**164**	**173**	**248**	**287**	**290**	**375**	**215**	**254**

1.11"කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය

"කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය, 1998 වසරේ සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් දිවයිනේ ප්‍රමුඛතම මුල්‍යාතන වල සහභාගීත්වය ඇතිව පොල් වගාකරුවන්ගේ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය මූල්‍යාධාර හා තාක්ෂණික මඟ පෙන්වීම් ලබා දීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සහනදායී ණය ක්‍රමයකි.

ණය ක්‍රමය පොල් වගාකරුවන්ගේ ඉඩම් වල පූර්ණ සංවර්ධනය අපේක්ෂා කරන අතර, එමඟින් වාණිජ කෘෂිකර්මය පොල් ඉඩම් ආශ්‍රිතව ප්‍රවර්ධනය කිරීමත් , රටේ සංවර්ධනයට පොල් වගා ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි කිරීමත්, ක්ෂේත්‍රයේ පොල් වගාකරුවන්ගේ හා රැකියා නියුක්තිකයන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීමත්, මූලික පරමාර්ථ කොටගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ණය ක්‍රමය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය සමඟ මහජන බැංකුව හා ලංකා බැංකුව යන රාජ්‍ය වාණිජ බැංකු , ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සණස සංවර්ධන බැංකුව හා ජාතික සංවර්ධන බැංකුව යන සංවර්ධන බැංකු හා හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, කොමර්ෂල් බැංකුව,

සම්පත් බැංකුව හා යුනියන් බැංකුව යන පෞද්ගලික වාණිජ බැංකු ගිවිසුම් ගත පාර්ශවකරුවන් ලෙස ණය මූල්‍යාධාර ලබා දීමේ කටයුතු සඳහා දායක වේ.

මෙමඟින් පොල් ඉඩම් සංවර්ධනය ආශ්‍රිතව නැවත වගාව ,නව වගාව, ඉඩම් පුනරුත්ථාපනය, අතුරුභෝග වගාව, සත්ත්ව පාලනය, ජල සම්පාදන පද්ධති පිහිටුවීම, කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අතුරු වගා තවාන් පිහිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබාදෙනු ඇත.

මේ තුලින් 9% ක පොලී අනුපාතය යටතේ ණය මූල්‍යාධාර ලබාදෙන අතර, සාර්ථකව සංවර්ධන කටයුතු සිදුකරන වගාකරුවන් වෙත පළමු වසරේ 100% ක් ද, දෙවන වසරේ සිට 05 වන වසර දක්වා 50% ක් ද වශයෙන් පොලී සහන ප්‍රතිදාන ලබා දේ. එමඟින් සඵල පොලී අනුපාතය 3.7% ක් වැනි අඩු පොලී අනුපාතයකට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව සාර්ථක වගාකරුවන් වෙත සලසා ඇත.

මෙම ණය මූල්‍යාධාර හා ඒකාබද්ධව නොමිලේ තාක්ෂණික උපදේශන සේවා සහ ණය ව්‍යාපෘති සකසා දීම සිදු කෙරෙන අතර , එමඟින් වගාකරුවන්ට සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය අමතර සේවා සැලසීම ද සිදු වේ.

2020 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය අනුව, වගාකරුවන් 338ක් වෙත ඉඩම් අක්කර 1447ක් සංවර්ධනය සඳහා රු.මිලියන 129.58ක් ලබා දී ඇත. ඒ සඳහා මෙම වසර තුළදී රුපියල් මිලියන 133.36ක ප්‍රතිමූල්‍යපහසුකම් අදාල මූල්‍යායතන වෙත ලබා දී ඇති අතර, වගාකරුවන් සඳහා රුපියල් මිලියන 16.52ක පොලී සහන ප්‍රතිදාන ගෙවීම් සිදු කර ඇත. බොහෝ ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශවල ඉලක්ක ඉක්මවා ප්‍රගතියක් අත් කර ගෙන ඇත. මේ අනුව ඉලක්ක හා සාපේක්ෂව සමස්ත ප්‍රගතිය 100% ඉක්මවා ඇත.

වගු අංක 1.9. 2020 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (අක්කර)	ප්‍රගතිය (අක්කර)
මොණරාගල	30	27
මාතර	50	91
කුරුණෑගල	250	256
කුලියාපිටිය	100	105
කෑගල්ල	30	41
ගම්පහ	75	78
කළුතර	40	51
මාරවිල	290	291
රත්නපුර	40	47
හම්බන්තොට	80	80
අනුරාධපුරය	40	48
ත්‍රිකුණාමලය	10	-
පොළොන්නරුව	25	29

අම්පාර	60	71
මාතලේ	50	82
ගාල්ල	40	41
මඩකලපුව	45	42
යාපනය	125	51
වව්නියාව	30	17
එකතුව	1410	1447

වගු අංක 1.10. 2020 වර්ෂයේදී ප්‍රතිමූලාශ්‍ර පහසුකම් මූල්‍යආයතන වෙත ලබාදීමේ ප්‍රගතිය

බැංකුව	**ප්‍රතිමූල්‍ය වටිනාකම(රු.)**
ලංකා බැංකුව	52,782,000.00
මහජන බැංකුව	14,696,150.00
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	29,853,000.00
කොමර්ෂල් බැංකුව	15,307,000.00
සම්පත් බැංකුව	2,267,304.00
සෙලාන් බැංකුව	800,000.00
හැටන් නැෂනල් බැංකුව	13,913,000.00
යුනියන් බැංකුව	-
සණස සංවර්ධන බැංකුව	3,749,000.00
එකතුව	133,367,454.00

‘‘කප්රුක ආයෝජන’’ ණය ක්‍රමය පොල් වගාකරුවන් අතර හා විවිධ අධිකාරීන් අතර ඉහළ පිළිගැනීමට ලක් වී ඇති අතර, ඒ තුළ වැඩිවෙමින් පවතින ණය ඉල්ලුම සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමත්, වැඩිවන සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත්ව ලබා ගැනීමත්, ඒ තුළින් වගාකරුවන්ගේ අපේක්ෂිත සේවාවන් ප්‍රශස්ත මට්ටමින් ලබා දීමත් ඉදිරි සංවර්ධන අරමුණු අතර වේ.

1.12 කප්රුක අරමුදල

(2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා ක්‍රියාකාරකම් වල ප්‍රගතිය)

1.12.1. කප්රුක නිපැයුම් පියස විවෘත කිරීම

මාතලේ, කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයන්හිකප්රුක නිපැයුම් පියස විවෘත කිරීම සිදු කිරීම.

1.12.2.ආදායම්උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

A සහ B ශ්‍රේණිගත කිරීම යටතේ පවතින එනම්, ක්‍රියාකාරී මට්ටමේ පවතින සමිති සඳහා පමණක් කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය මඟින් ව්‍යාපෘති ණය ලබා දීම සිදු කෙරේ. ඒ අතුරින් 2020 වර්ෂයේ දි භාණ්ඩාගාර ප්‍රතිපාදන තුළින් කප්රුක සමිති 14ක් සඳහා ණය ලබා දී ඇත.

වගු අංක 1.11. 2020 වර්ෂයේදී කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය මඟින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ කර්මාන්ත ණය ලබා දීමේ ප්‍රගතිය

ණය ලබා දීමේ මුල්‍ය ප්‍රභවය	සමිති සංඛ්‍යාව	ව්‍යාපෘති ලාභීන් සංඛ්‍යාව	ලබා දී ඇති මුළු මුදල රු.	ව්‍යාපෘතියේ ස්වභාවය	ව්‍යාපෘතිලාභීන් සංඛ්‍යාව
භාණ්ඩාගාර ප්‍රතිපාදන	14	14	2,800,000.00	පොල් තෙල් නිෂ්පාදනය	12
				ලණු ඇඹරීම	01
				ඇඟිලි කොසු නිෂ්පාදනය	01

කප්රුක සමිති සාමාජිකයන්ගේ ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණින් කප්රුක සමිති 10ක් සඳහා ජීවනෝපාය සංවර්ධන ණය ලබා දීම සිදු කරන ලදී.

වගු අංක 1.12. 2020 වර්ෂයේදී කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය මඟින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ජීවනෝපාය සංවර්ධන ණය ලබා දීමේ ප්‍රගතිය

අනු අංකය	ප්‍රාදේශීයකාර්යාලය	කප්රුක ප්‍රාථමික සමිතියේ නම	ව්‍යාපෘතිලාභීන් සංඛ්‍යාව	ලබාදුන් මුදල් ප්‍රමාණය(රු.)
1	කුලියාපිටිය	කුඹල්වල පුබුදු කප්රුක ප්‍රාථමික සමිතිය	12	240,000.00
2	කුලියාපිටිය	වහුමුව ජයමඟ කප්රුක ප්‍රාථමික සමිතිය	9	430,000.00
3	කුලියාපිටිය	කොවුල්වැව ගැමුණු කප්රුක ප්‍රාථමික සමිතිය	7	350,000.00
4	කෑගල්ල	කහනාවිට ශ්‍රී විජය කප්රුක ප්‍රාථමික සමිතිය	5	200,000.00
5	කෑගල්ල	පෝඩාපේ ශක්ති ප්‍රා/ක. සමිතිය	12	475,000.00
6	කුලියාපිටිය	කහටවිල ප්‍රබෝධ කප්රුක ප්‍රාථමික සමිතිය	6	300,000.00
7	හම්බන්තොට	පල්ලේගම පැරකුම්කප්රුක ප්‍රාථමික සමිතිය	15	505,000.00
8	හම්බන්තොට	මුල්කිරිගල/උ.එකමුතු කප්රුක ප්‍රාථමික සමිතිය	15	575,000.00
9	හම්බන්තොට	මැදගම ප්‍රගතිකප්රුක ප්‍රාථමික සමිතිය	10	450,000.00
10	කෑගල්ල	හකුරුගම්මන ප්‍රාර්ථනා කප්රුක ප්‍රාථමික සමිතිය	6	325,000.00
	මුළු එකතුව		**97**	**3,850,000.00**

1.12.3. කප්රුක සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම

කප්රුක සමිති සඳහා මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙසින්, ඔවුන්ගේ අමුද්‍රව්‍ය එකතුකරන මධ්‍යස්ථානයක් ලෙසත්, තොරතුරු මධ්‍යස්ථානයක් ලෙසත් සහ ප්‍රජා වෘත්තීය මධ්‍යස්ථානයක්

ලෙසත් වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය මඟින් සුදර් ඔලි ප්‍රාථමික කප්රුක සමිතිය මඟින් මෙම සම්පත් මධ්‍යස්ථානය 2020 වර්ෂයේදී පිහිටුවා ඇත.

1.12.4. කප්රුක නිෂ්පාදන ප්‍රචලිත කරවීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම

2020 වර්ෂයේ ජනවාරි 24, 25 යන දිනවල දීකප්රුක අරමුදල මඟින් කෑගල්ල පින්නවල අලි අනාථාගාරය අසල විදේශ සංචාරකයින් සඳහා ප්‍රදර්ශනයක් ප්‍රාදේශීය වශයෙන් කප්රුක සමිති සාමාජිකයින්ගේ කප්රුක නිෂ්පාදන ඉදිරිපත් කෙරුණි.



රූපය 1.1 : 2020 වර්ෂයේ පැවති ප්‍රදර්ශනය

1.12.5. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

කොහු ලණු කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා කොහු ලණු කර්මාන්තයේ නිරතවන කප්රුක සමිති සාමාජිකයන් සඳහා කොහු ලණු මැෂින්ලබාදීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ 2020 වර්ෂයේ පැවැත්විණි.

පොල් සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය ඇතිව කෑගල්ල සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හි පොල් ආශ්‍රිත මහා පරිමාණ කර්මාන්තකරුවන්, කප්රුක සමිති සාමාජිකයන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2020.09.04 දින පවත්වන ලදී.

පොල් සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය ඇතිව කළුතර ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයෙහි පොල් ආශ්‍රිත මහා පරිමාණ කර්මාන්තකරුවන්, කප්රුක සමිති සාමාජිකයන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2020 වර්ෂයේ පවත්වන ලදී.

1.13 පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය

1.13.1 පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පිළිබඳ හැඳින්වීම

1.13.1.1 හැඳින්වීම

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පොල් පර්යේෂණ ආයතනයට යාබද බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල යන ස්ථානයේ පිහිටා ඇත.

පොල් වගාකිරීමේ මණ්ඩලය තුළ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය ස්ථාපනය කර පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ වනුයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන් පුහුණු කිරීමයි. මෙහිදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉතාමත් වැදගත්ම කණ්ඩායම වන ව්‍යාප්ති නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වැඩිදියුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායි ලෙස පොල් වගාකරුවන් වෙත හා කර්මාන්තකරුවන් වෙතපොල්වගාව පිළිබඳ තාක්ෂණය සම්ප්‍රේෂණය කිරීමට පසුබිම සලසා දේ.

ඊට අමතරව පොල් වගාකිරීමේ මණ්ඩලයේ තාක්ෂණික නොවන නිලධාරීන්ද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය තුළ පුහුණු කෙරේ. ඒ තුළින් ඔවුන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම තුළින් මානව සම්පත සංවර්ධනය කර ආයතනයේ සිදුකරන රාජකාරීන් පහසුවෙන් හා කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කෙරේ.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ අභ්‍යන්තර නිලධාරීන් පුහුණු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ නිරතව සිටින විවිධ ඉලක්කගත කණ්ඩායම් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයට ගෙන්වා පුහුණු කිරීමද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු නිලධාරීන් විසින් පුහුණු අවශ්‍යතා සහිත කණ්ඩායම් හා පුද්ගලයින් වෙත ගොස් පුහුණු කිරීම්ද සිදුකෙරේ.

එහිදී ක්ෂේත්‍රයෙන් හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව පොල් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලා සැලසුම් කර ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීමෙන් පොල් වගා තාක්ෂණය ඔවුන් වෙත සෘජුවම සම්ප්‍රේෂණය කිරීමත් සිදුවේ.

පුහුණු කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලකිය යුතු මට්ටමින් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සතුව පවතී. ඒ සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සතුව අක්කර 7 ක භූමි භාගයක්ද පුහුණුලාභීන් 36 දෙනෙකු සඳහා නවාතැන් සැපයිය හැකි නේවාසිකාගාරයක්ද ඇත. සියලුම සන්නිවේදන උපාංගයන්ගෙන් සමන්විත දේශන ශාලාවක්ද 100 දෙනෙකුට අසුන්ගත හැකි ශ්‍රවණාගාරයක්ද ඇත. තවද පුහුණුලාභීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි 26 දෙනෙකුට අසුන්ගත හැකි බස් රථයක්ද, කැබ් රථ 2ක් ද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සතුව ඇත.

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය තුළ පොල් වගා සංවර්ධනය සඳහා වූ සියලුමවිෂයන් ආවරණය කළ හැකි ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට විශේෂිත අධ්‍යාපන සුදුසුකම් හා අත්දැකීම් ඇති නිලධාරීන් කණ්ඩායමක් ඇත.

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පොල් පර්යේෂණ ආයතනය සමීපයේ පිහිටීම නිසා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය තුළ සිදුකරන පුහුණු කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික තොරතුරු නිරන්තරයෙන් හුවමාරු කර ගත හැකි වේ. එසේම පොල් වගාකිරීමේ මණ්ඩලයේ රටපුරා විසිරී තිබෙන ව්‍යාප්ති ජාලය මඟින් ක්ෂේත්‍රයෙන් හඳුනාගන්නාගැටළු පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය පොල් පර්යේෂණ ආයතනය වෙත යොමු කිරීමට තිබෙන හැකියාවද එම ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දීමේ හැකියාවද තිබේ. තවද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය වෙත පොල් වගාවේ විශේෂ ගැටළු රැගෙන එන වගාකරුවන් පොල් පර්යේෂණ ආයතනය වෙත පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් යොමු කෙරේ. තවද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ විෂයානුබද්ධ නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරගැනීම සඳහා පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් සමග දැනුම හුවමාරු කරගැනීමේපහසුවද සැලසී තිබේ. ඊට අමතරව ඔවුන් සමග පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුවද පවතී.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ ජාතික ව්‍යාප්ති වැඩසටහන යටතේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හරහා ව්‍යාප්තිහා පුහුණු වැඩසටහන් සිදුකෙරේ. මේ යටතේ රෝග හා පළිබෝධ

කළමනාකරණ වැඩසටහන් හා ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන් අඛණ්ඩව සිදුකරයි. පොල් වගාවේ රෝග හා පළිබෝධ මර්ධනය සඳහා ක්‍රියාත්මක කරනවිශේෂ වැඩසටහන් රැසක් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් මෙහෙයවීම සිදු කරයි.පොල් වගාවේ ප්‍රධාන පළිබෝධ වන රතු කුරුමිණි හානිය ,කළු කුරුමිණි හානිය, මයිටා හානිය, පොල් දළඹු හානියහා ප්ලෙසිස්පාකෘමී හානියමර්දනය සඳහා විශේෂ වැඩසටහන් ඒ අතරින් ප්‍රමුඛ වේ. මීට අමතරව දිවයින පුරා පිහිටා තිබෙන විලෝපික මයිටා නිෂ්පාදනාගාර හා පොල් දළඹු පරපෝෂිත විද්‍යාගාරයන්හි කටයුතු අධ්‍යක්ෂණය ද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කෙරේ.

එමෙන්ම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය දායකත්වයද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් ලබා දෙයි. ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය අත් පත්‍රිකා, පුවරු, පොස්ටර්, වීඩියෝ පට ආදී පුහුණු මෙවලම් සකස් කිරීම්, මුද්‍රණය හා බෙදා හැරීමපොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කෙරේ. තවද ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම හා ඇගයීමට අවශ්‍ය පෝරම ආදිය සකස් කිරීම මුද්‍රණය හා බෙදාහැරීමද පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කෙරේ. ජාතික මට්ටමේ ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන් සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සෘජු දායකත්වයක් ලබා දෙයි. එසේම මෙම වැඩසටහන් සෘජුවම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය මඟින් හෝ එහි මහපෙන්වීම සහ සම්පත් ලබාදී ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදුකරයි.

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයකි. ඒ අනුව පාඨමාලා පැවැත්වීමට හා සහතික ලබා දීම සඳහා වෘත්තිය වලංගුභාවය ආයතනය සතුවේ.

1.13.1.2 අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ පොල් වගාකරුවා වෙත තාක්ෂණය ලබාදීමේ ප්‍රමුඛ ආයතනය වීම.

1.13.1.3මෙහෙවර

ශ්‍රී ලංකාවේ පොල් වගාකරුවන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම තුළින් පොල් ඉඩම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා, පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලුම තාක්ෂණික නිලධාරීන්ගේ දැනුම වැඩිකිරීම, කුසලතා වර්ධනය කිරීම හා ආකල්ප වර්ධනය කිරීම.

- සියලුම වගාකරුවන් සඳහා දීපව්‍යාප්තව පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විවිධ රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- විශ්වවිද්‍යාල සිසුන්, තාක්ෂණ විද්‍යාල සිසුන්, පාසැල් ගුරුවරුන් හා පාසැල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- e තාක්ෂණය හරහා වගාකරුවන් දැනුවත් කිරීම
- තාක්ෂණික අත්පත්‍රිකා හා පොත් ලිවීම, සැකසීම හා ප්‍රචාරය
- ප්‍රදර්ශනය හා විවිධ ප්‍රචාරක වැඩසටහන් මඟින් මහා පරිමාණ දැනුවත් කිරීම් අපගේ මෙහෙවර වේ.

1.13.1.4ආයතනයේ සැකැස්ම



1.13.2 2020 වර්ෂයේ පුහුණු වැඩසටහන් ප්‍රගතිය

1.13.2.1 පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම

2020 වර්ෂයේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 14ක් සැලසුම් කල අතර ඇස්තමේන්තු මුදල රු1,730,000.00ක් වේ.
ඉලක්ක ගත වැඩසටහන් අතරින් වැඩසටහන් 10ක් 2020 වර්ෂය තුළ සිදුකරනලදී. මෙම වැඩසටහන් සඳහා දින 65ක් වැයවීඇති අතර මේ සඳහා වැයවූ මුදල රු. 367,290.11 ක් සහ ප්‍රතිලාභීන් ගණන 438ක් වේ.

1.13.2.1.1 ව්‍යාප්ති ක්‍රමවේදය (I කොටස)

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සේවයේ යෙදි සිටින බිම් මට්ටමේ නිලධාරීන් වන පොල් සංවර්ධන නිලධාරීන් වර්තමානයට ගැලපෙන අයුරින් ව්‍යාප්ති සේවයේ යෙදවීමට නම් ඔවුන්ට ව්‍යාප්තිවිෂය පිළිබඳව මෙන්ම නවීන ලෝකයේ යොදා ගන්නා ව්‍යාප්ති ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් 2020 වර්ෂයේදී පුහුණු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාප්ති ක්‍රමවේද පුහුණු වැඩසටහනේ I කොටස දින 6ක කාලසීමාවක් තුළ ක්‍රියාත්මක කළ අතර එහිදී පුහුණුලාභීන්ට "නවව්‍යාප්තිකාරකයා" සංකල්පය පිළිබඳ හැඳින්වීම හා නව ව්‍යාප්තිකාරකයා පුහුණු මොඩියුලයේ නිපුණතා මොඩියුල 7ක් ආවරණය කරන ලදී.

එම පුහුණු මොඩියුල 7 තුළදී කෘෂි නවෝත්පාදක සංකල්පය හා කෘෂි නවෝත්පාදක පද්ධතිය තුළ ව්‍යාප්ති හා උපදේශන සේවාවන්ගේ භූමිකාව, ව්‍යාප්ති සේවයේ ඉතිහාසය, ව්‍යාප්තිප්‍රවේශයන්, ව්‍යාප්ති ක්‍රමවේද, ව්‍යාප්ති මෙවලම් හා නිවැරදිව ව්‍යාප්ති මෙවලම් තෝරාගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කරන ලදී. තවද පුහුණුලාභීන්ට කෘෂි ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම සිදුකරන ආකාරය ව්‍යාප්ති නිලධාරියෙකු සතුවිය යුතු වෘත්තීය ආචාරධර්ම, වැඩිහිටි අධ්‍යාපන ක්‍රමවේදයන්, සමාජ මනෝවිද්‍යාව හාවර්යාවන් වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය කරන ලදී.

මීට අමතර වව්‍යාප්ති හා උපදේශන සේවාවන් සඳහා අත්‍යවශ්‍ය සන්නිවේදන ක්‍රමවේදයන් හා නවෝත්පාදක පද්ධතිය සඳහා සන්නිවේදනයේ වැදගත්කම මෙන්ම කෘෂිකාර්මික සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම සිදුකරන ආකාරය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කරන ලදී. මෙම වැඩසටහන සඳහා පොල් සංවර්ධන නිලධාරීන්ට අමතරව ගොවිපළ සැලසුම් නිලධාරීන්ද සහභාගී විය.

පුහුණුලාභීන් කණ්ඩායම් හතරක් සඳහා මේ වැඩසටහන සිදුකරන ලදී. මෙම වැඩසටහන සඳහා දින 6ක කාලයක්වැයවී ඇති අතර මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 28ක් වේ.

1.13.2.1.2 ව්‍යාප්ති ක්‍රමවේදය II කොටස

ව්‍යාප්ති ක්‍රමවේදය II වන කොටස ද දින 6ක කාලයක් තුළ ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම මෙම වැඩසටහන ව්‍යාප්ති ක්‍රමවේදය I කොටසේ අධ්‍යයනය කරන ලද මොඩියුල 7ට අමතරව ඉතිරි නිපුණතා මොඩියුල 7ක් පිළිබඳ අධ්‍යයනය කරන ලදී.එහිදී ප්‍රජා බලමුළුගැන්වීම, ගැටළු නිරාකරණ ක්‍රමවේදයන්, කණ්ඩායම් ක්‍රමවේදයන්, ගොවි කණ්ඩායම් ක්‍රියාකාරීත්වය හා සංවර්ධනය පිළිබඳ දැනුවත් කරන ලදී. තවදුරටත් වෙළඳපල,වෙළඳපල අගය දාමයන් හා ගොවීන් අතර සම්බන්ධතාවය,

කෘෂි ව්‍යවසායකත්වය, ව්‍යාපාර සැලසුම්කරණය, මූල්‍ය කළමනාකරණය හා කෘෂි ව්‍යාප්ති සේවය සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු බලපාන ආකාරය පිළිබඳව ද පුහුණුලාභීන් අධ්‍යයනය කරන ලදී .

ව්‍යාප්ති නිලධාරීන් සඳහා අත්‍යවශ්‍ය ව්‍යාප්ති හා උපදේශන සේවාවන් ඇගයීම පිළිබඳ විශේෂ මොඩියුලයක් හා අවදානම් කළමනාකරණය පිළිබඳව ද පුහුණුලාභීන් දැනුවත් කරන ලදී. මෙම වැඩසටහනට 2020.08.24 සිට 2020.08.28 දක්වා පැවැත්වූ අතර ඒ සඳහා පොල් සංවර්ධන නිලධාරීන් හා ගොවිපළ සැලසුම් නිලධාරීන් 37 දෙනෙකු සහභාගි විය.

1.13.2.1.2 ග්‍රාමීය ජනතාවගේ දැනුම හා අදහස් ඇතුළත් කිරීම සඳහා සැලසුම් හා සංවර්ධන ව්‍යාපෘතිසඳහාවූ පුහුණු වැඩසටහන

මෙම වැඩසටහනේ අරමුණ වූයේ සහභාගිත්ව ගැමි ප්‍රවේශය (PRA- Participatory Rural Appraisal) පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා ගැනීමයි. ප්‍රායෝගිකව මෙම සංවර්ධන ප්‍රවේශය භාවිතා කරමින් ප්‍රජා සහභාගිත්ව ඇතිව එම ප්‍රජාවගේගැටළුහඳුනා ගැනීමට පුහුණු ලාභීන්ට අවස්ථාවක් සලස්වන ලදී. මේ සඳහා පුහුණු ලාභීන්ව ග්‍රාමීය ප්‍රදේශ වෙත යොමු කරන ලදී. පසුව ඔවුන් හඳුනාගත්ගැටළුවලට විසඳුම් ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම සිදු කරන ලදී. මෙම දින තුනක පුහුණු වැඩසටහන ද කණ්ඩායම් තුනක් සඳහා පවත්වන ලදී.

මෙම වැඩසටහන 2020.09.21 සිට 2020.09.25 දක්වා පැවැත්වූ අතරඒ සඳහා ද පොල් සංවර්ධනනිලධාරීන්හා ගොවිපළ සැලසුම් නිලධාරීන් 18 දෙනෙකු සහභාගිවිය.



රූපය 1.2 : ගැමි ප්‍රවේශයපිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමේ පුහුණු සැසිය

1.13.2.1.4 පර්යේෂණ හා ව්‍යාප්ති සංවාද

පොල් පර්යේෂණ ආයතනය මඟින් සොයා ගන්නා නව පර්යේෂණ දැනුම, නව යෙදවුම් හා නිර්දේශයන්ව්‍යාප්ති නිළධාරීන්ටහඳුන්වා දීම මෙන්ම පොල් වගා ක්ෂේත්‍රයේ ගැටළු පර්යේෂණ අංශ වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවත් ප්‍රධාන කාර්යභාරයකි. ඒ සඳහා වේදිකාවක් සකස් කර ගැනීම යන අරමුණ පෙරදැරිව පොල් වගාකිරීමේ මණ්ඩලය හාපොල් පර්යේෂණ ආයතනය එකතුව පර්යේෂණ හා ව්‍යාප්ති සංවාදය සැලසුම් කරයි.2020 වර්ෂය සඳහා එක් පර්යේෂණ හා ව්‍යාප්තිසංවාදයන්පවත්වන ලදී. ඒ සඳහා පොල් ත්‍රිකෝණයේමාරවිල, කුරුණෑගල, කුලියාපිටියයන ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත සියලුම ව්‍යාප්ති නිලධාරීන් හා ආදර්ශ පොල් උයන්වල කළමණාකරුවන් සඳහා 2020.12.09 වන දි ලුණුවිල,

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී මාර්ගස්ථ ක්‍රමයට (Zoom තාක්ෂණය ඔස්සේ) පවත්වන ලදී. මේ සඳහා නිලධාරීන් 107දෙනෙකු සහභාගී විය .

1.13.2.1.5 මූලික විමර්ශනය හා මුදල් රෙගුලාසි පරීක්ෂණ පිළිබඳ පුහුණුව

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉහළ කළමනාකරණය මඟින් හඳුනා ගත් පුහුණු අවශ්‍යතාවයට අනුව පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශියකළමණාකරුවන් හා ගිණුම් නිළධාරීන් සඳහා මූලික විමර්ශනය හා මුදල් රෙගුලාසි පරීක්ෂණපිළිබඳවදෙදින පුහුණු වැඩසටහන් 2020.07.06 හා 07 යන දිනයන්හීදී සාර්ථකව පවත්වා අවසන් කරන ලදී. මෙම පුහුණු වැඩසටහන සඳහා පුහුණුලාභීන් 35 සහභාගි විය.

1.13.2.1.6 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ පිළිබඳ පුහුණුව

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉහළ කළමනාකරණය මඟින් හඳුනාගත් පුහුණු අවශ්‍යතාවයට අනුව පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් සඳහා පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ එක්දින වැඩමුළුවක් 2020.07.31 දින ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයේදී පවත්වන ලද අතර මෙම වැඩසටහන් සඳහා පුහුණුලාභීන් ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 49 දෙනෙකු සහභාගී විය.

1.13.2.1.7 මොබයිල් විඩියෝ සකස් කිරීමේ පුහුණුව

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාලයකින් එක් පොල් සංවර්ධන නිලධාරියකු බැගින් නියෝජනය වන පරිදි පොල් සංවර්ධන නිලධාරීන් කණ්ඩායමක් තෝරාගෙන ජංගම විඩියෝ (mobile video) සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. එම වැඩසටහන 2020.08.17 හා 18 යන දිනයන්හීදී පැවත්වන ලද අතර ඒ සඳහා පොල් සංවර්ධන නිලධාරීන් 18 දෙනෙකු සහභාගි විය. මෙහිදී ජංගම විඩියෝ සැකසීම සඳහා සුදුසු මෙවලම්, දර්ශන රූගත කිරීම, සංස්කරණය කිරීම ආදි ක්ෂේත්‍රයන් පිළිබඳව අවබෝධයක් හා කුසලතාවයක්ලබාදීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

1.13.2.1.8 ඉඩම් අයිතිය හා ඊට අදාළ නෛතික ලියකියවිලි හා පසු පරීක්ෂාව පිළිබඳ පුහුණුව

අප ආයතනයේ ගොවිපළ සැලසුම් නිලධාරීන් හා ව්‍යාප්ති නිලධාරීන් සඳහා ඉඩම් අයිතිය සනාථ කිරීමේ ලියකියවිලි පරීක්ෂා කිරීම පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක් 2020.11.04 වන දින පවත්වන ලද අතර මෙම වැසටහන සඳහා නිලධාරීන් 32ක් සහභාගී විය.





රූපය 1.3 : **ඉඩම් අයිතිය** පිළිබඳ පුහුණු සැසිය

1.13.2.1.9 මූලික ව්‍යාප්ති සහ පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ඉදිරි සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සඳහා දැනුම සහ කුසලතාවය වර්ධනය කිරීමට ගොවිපළ සැලසුම් නිලධාරීන් හා ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීමේ මාර්ගස්ථ ක්‍රමයට පුහුණුවක් 2020.11.24, 2020.11.25 සහ 2020.12.02 යන තෙදින පැවැත්විණි.





රූපය 1.4 : **මූලික ව්‍යාප්ති සහ පරිපාලන ක්‍රියා පටිපාටි පිළිබඳ** පුහුණු සැසිය

1.13.2.1.10 පොල් දළඹු කළමනාකරණය පිළිබඳ පුහුණුව

පොල් දළඹු හානිය කළමනාකරණය කරගැනීම සඳහා පොල් සංවර්ධන නිලධාරීන්, ගොවිපළ සැලසුම් නිලධාරීන් හා ව්‍යාප්ති නිලධාරීන් සඳහා 2020.02.18 සහ 2020.02.24 යන දෙදින තුළ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් පැවැත්විණි. එහිදී, ක්ෂේත්‍රයේදී පොල් දළඹු හානිය හඳුනා ගැනීම, රාශි ගහන වාර්තා ලබා ගැනීම සහ පොල් දළඹු හානිය පාලන ක්‍රම පිළිබඳව දැනුවත් කරන ලදී.





රූපය 1.5 : **පොල් දළඹු කළමනාකරණය පිළිබඳ නිළධාරී පුහුණු** සැසිය

1.13.2.2 පොල් වගාකරුවන් සඳහා පවත්වන පුහුණු වැඩසටහන්

2020වර්ෂයේදී පොල් වගාකරුවන් හා අනෙකුත් බාහිර පාර්ශවයන් සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් පුහුණු වැඩසටහන් 33ක් සිදුකරනලදී. දින 45ක් ඇතුළත එම පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර ඒ සඳහා පොල් වගාකරුවන් 1,626 දෙනෙකු සහභාගි විය.

1.13.2.2.1 දෙදින පොල් වගා පුහුණු වැඩසටහන්

මෙම පුහුණු වැඩසටහනේදී පොල් වගාවට අදාළ සියලු තාක්ෂණික කරුණු පිළිබඳවමනා අවබෝධයක් මෙන්ම ප්‍රායෝගික අත්දැකීම ලබාගැනීමට අවස්ථාව සලසා දේ. මෙහිදී පොල් පැළයක් තෝරා ගැනීම, පැළ සිටුවීම, පෝෂණ කළමනාකරණය, පාංශු හා තෙතමන සංරක්ෂණ, රෝග හා පළිබෝධ මර්ධනය හා පොල් ඉඩමේ ඵලදායිතාව ඉහළ නැංවීම, අතුරු බෝග හා සත්ත්ව පාලනය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික කරුණු විස්තර කෙරේ. මෙම වැඩසටහන දෙදින නේවාසික පුහුණුවක් ලෙස පැවැත්වූ අතර 2020 වසරේදී පොතුහැර ප්‍රදේශයේ ගොවි කණ්ඩායමක් සඳහා 29.06.2020 හා 30.06.2020 යන දිනයන්හීදී මෙම පුහුණුව ලබා දෙන ලදී. ඒ සඳහා පුහුණුලාභීන් 36 දෙනෙකු පුහුණුව ලබා ගන්නා ලදී.

1.13.2.2.2 පස්දින පොල් වගා පුහුණු වැඩසටහන්

මෙය නේවාසික ප්‍රයෝගික පුහුණු පාඨමාලාවකි. කෘෂිකර්ම විද්‍යාව හදාරන සිසුන් හෝ ඒ සඳහා කැමැත්ත ඇති වෙනත් ක්ණ්ඩායම් සඳහා පොල් වතු කළමනාකරණයේදී අවශ්‍ය දැනුම හා විශේෂයෙන්ම ප්‍රයෝගික පුහුණුව ලබා දීම සඳහා සකස් කරන ලද පුහුණු වැඩසටහනකි. මෙම පුහුණුව අදාළ විශ්වවිද්‍යාලය හෝ තෘතියික අධ්‍යාපන ආයතනය සමඟ එකාබද්ධව පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සංවිධානය කෙරේ.

2020 පස් දින පුහුණු වැඩසටහන් 3 සාර්ථකව පවත්වා අවසන් කර ඇත. මේ සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන් කණ්ඩායම් 2ක් හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ බෝග විද්‍යාව හදාරණ අවසන් වසර සිසුන් කණ්ඩායමක් සහභාගී වී ඇති අතර ඒ සඳහා සහභාගී වූ පුහුණු ලාභීන්ගණන 50 දෙනෙකි.

වගු අංක 1.13 2020 වර්ෂයේදී පැවැත්වූ පස්දින පොල් වගා පුහුණු වැඩසටහන්හි ප්‍රගතිය

කණ්ඩායම	දිනය	සහභාගී වූ සංඛ්‍යාව
ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන්	02.11.2020-02.15.2020	26
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ බෝග විද්‍යාව හදාරණ අවසන් වසර සිසුන්.	08.30.2020-.09.02.2020	08
ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ NVQ හදාරණ සිසුන්	11.10.2020 - 11.13.2020	16





රූපය 1.6 : නේවාසික පස්දින පුහුණු සැසිය

1.13.2.2.3 පොල් වගාව පිළිබඳවඑක්දින ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්

පොල් වගාව පිළිබඳ විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ එක්දින ප්‍රායෝගික පුහුණු වැඩමුළු පැවැත්වීම සිදුකෙරේ. විවිධ ආයතන මඟින් සිදු කෙරෙන ඉල්ලීම් මත එවැනි පුහුණු වැඩමුළු පැවැත්වීමට පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරයි. 2020 වසරේදීමෙම වැඩසටහන යටතේ එක්දින ක්ෂේත්‍ර වැඩමුළු 7ක් පැවැත්වීය. මෙම වැඩසටහන් 7 සඳහා සහභාගී වූ සංඛ්‍යාව 408දෙනෙකි. එහි විස්තර පහත පරිදි වේ.

කෘෂිකාර්මික සිසුන් සඳහා එක්දින පොල් වගා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්

මෙම පුහුණු වැඩසටහන කෘෂිකර්ම විෂය ධාරාව හදාරණ විශ්වවිද්‍යාලයන්හි සිසුන් හා අනෙකුත් තෘතියික අධ්‍යාපන ආයතනයන්හි සිසුන් සඳහා සැකසූ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනකි. මෙහිදී පොල් වගාවේදී භාවිතා කරන සියලුම විෂය ක්ෂේත්‍රයන් ආවරණයවන ආකාරයට තාක්ෂණික කරුණු එක් දින ක්ෂේත්‍ර දිනයකින් ආවරණය කෙරේ.

එම සිසුන් හට පොල් වගාවේදී යොදා ගන්නා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා නිරාවරණයකිරීම හා ආදර්ශන මඟින් එම ක්‍රියාකාරකම් පැහැදිලි කිරීම තුළින් ප්‍රායෝගික දැනුම ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ. එවැනි ක්ෂේත්‍ර දින 7ක් 2020 වසරේදී පවත්වා කෘෂිකර්මය හදාරණ සිසුන් 408 දෙනෙකු පුහුණු කරන ලදී.

වගු අංක 1.14 2020 වර්ෂයේදී පොල් වගාව පිළිබඳව එක්දින ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන්හි ප්‍රගතිය

	කණ්ඩායම	දිනය	සහභාගී වූ සංඛ්‍යාව
01	ඇක්වායිනස් ආයතනයේ සිසුන් සඳහා ව්‍යාප්ති පුහුණු වැඩසටහන	1/16/2020	28
02	විශ්වවිද්‍යාල සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව	7/21/2020	50
03	පොල් වගාවේ රෝග පළිබෝධ පාලනය පිළිබඳ ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන	7/13/2020	30

04	කුරුණෑගල වැවිලි සමාගමේ නිලධාරීන් සඳහා පුහුණුව	9/4/2020	52
05	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා පොල් වගාව සඳහා පුහුණුව - කණ්ඩායම 1	9/17/2020	106
06	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා පොල් වගාව සඳහා පුහුණුවකණ්ඩායම 2	9/18/2020	108
07	වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ සිසුන් සඳහා පොල් වගාව හා වතු කළමනාකරණය පුහුණුව	10/6/2020	34



රූපය 1.7: කෘෂිකාර්මික සිසුන් සඳහා එක්දින පොල් වගා ක්ෂේත්‍ර පුහුණු සැසිය

1.13.2.2.4 <u>පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2019-2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව පොල් ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා</u>

1) පොල්ඉඩම් වල පෝෂක කළමනාකරණ හා පාංශු තෙතමන සංරක්ෂණය සඳහා ගොවීන් පෙළඹවීම.
2) පොල් ඉඩම් වල අතුරු බෝග වගාකිරීම සඳහාගොවීන්පෙළඹවීම.
3) පොල් ඉඩම්වල සත්ත්ව පාලනය සඳහා ගොවීන් දිරිගැන්වීම.
4) පොල් ඉඩම්වල ජලසම්පාදනය සඳහා ගොවීන් දිරිගැන්වීම.

පොල් ඉඩම් වල ඵලදායීතාවය වැඩිකිරීමේ අරමුණින් ඉහත වැඩසටහන් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රතිපාදන හා අධීක්ෂණය යටතේ ප්‍රාදේශියකර්යාල හරහා මෙම වැඩසටහන් එක්දින වැඩසටහන් ලෙස සංවිධානය කර පවත්වන ලදී.

1.13.2.2.4.1 පොල්ඉඩම් වල පෝෂක කළමනාකරණ හා පාංශු තෙතමන සංරක්ෂණය සඳහා ගොවීන් පෙළඹවීම

පොල් ඉඩම් වල පෝෂක කළමනාකරණ හා පාංශු තෙතමන සංරක්ෂණය වැඩසටහන සඳහා 2020 වර්ෂයේ සහනාධාර ලබාගන්නා වගාකරුවන්, කප්රුක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කර ඇති වගාකරුවන් හා ශ්‍රමබලකා සාමාජිකයන් මෙම වැඩසටහනට පුහුණුලාභීන් ලෙස තෝරා ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ වැඩසටහන් 8ක් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වා ඇත. මේ සඳහා ගොවීන් 433ක් සහභාගිවී ඇත.

වගු අංක 1.15 2020 වර්ෂයේ පැවැත්වූ පොල් ඉඩම් වල පෝෂක කළමනාකරණ හා පාංශු තෙතමන සංරක්ෂණ වැඩසටහනෙහි ප්‍රගතිය

	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන පැවැත්වූ දිනය	සහභාගීවූ සංඛ්‍යාව
01	කුරුණෑගල -ඉබ්බාගමුවගොවීන්	7/10/2020	47
02	කුලියාපිටිය ගොවීන්	3/13/2020	85
03	උමන්දාව රජ මහා විහාරය	10/30/2020	20
04	මාරවිල - ආරච්චිකට්ටුව ගොවීන්	9/8/2020	71
05	මාරවිල - දංකොටුව ගොවීන්	9/18/2020	65
06	කෑගල්ල - දැලිවල ගොවීන්	10/2/2020	65
07	ගම්පහ - මීරිගම ගොවීන්	11/27/2020	35
08	ගම්පහ - උඟරාපොළ ගොවීන්	9/8/2020	45
	එකතුව		433




රූපය 1.8: පොල් ඉඩම්වල පාංශු හා තෙතමන සංරක්ෂණ පුහුණු සැසිය

1.13.2.2.4.2 පොල් ඉඩම් වල අතුරු බෝග වගාකිරීම සඳහා ගොවීන් පෙළඹවීම

පොල් ඉඩම් වල අතුරු බෝග වගාකිරීම සඳහා ගොවීන් පෙළඹවීමේ වැඩසටහන සඳහා 2020 වර්ෂයේ සහනාධාර ලබාගන්නා වගාකරුවන්, කප්රුක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කර ඇති වගාකරුවන් හා ශ්‍රමබලකා සාමාජිකයන් මෙම වැඩසටහනට පුහුණුලාභීන් ලෙස තෝරා ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ වැඩසටහන් 5 ක් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වා ඇත.මේ සඳහා ගොවීන් 337 දෙනෙකු සහභාගිවී ඇත.

වගු අංක 1.16 2020 වර්ෂයේ පැවැත්වූ පොල් ඉඩම් වල අතුරු බෝග වගාකිරීම වැඩසටහනෙහි ප්‍රගතිය

	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන පැවැත්වුදිනය	සහභාගීවූ සංඛ්‍යාව
01	මාතර ගෙවින්	9/8/2020	54
02	මාතලේගොවීන්	9/11/2020	54
03	වලස්මුල්ල ගොවීන්	9/15/2020	112
04	කෑගල්ල ගොවීන්	9/11/2020	39
	එකතුව		259

1.13.2.2.4.3 පොල් ඉඩම්වල සත්ත්ව පාලනය සඳහා ගොවීන් දිරිගැන්වීම

පොල් ඉඩම් වල සත්ව පාලනය සඳහා ගොවීන් දිරිගැන්වීමේ වැඩසටහන සඳහා 2020 වර්ෂයේ සහනාධාර ලබාගන්නා වගාකරුවන්, කප්රුක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කර ඇති වගාකරුවන් හා ශ්‍රමබලකා සාමාජිකයන් මෙම වැඩසටහනට පුහුණුලාභීන්ලෙස තෝරා ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ වැඩසටහන් 4ක් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වා ඇත.මේ සඳහා ගොවීන් 129ක් සහභාගිවී ඇත.

වගු අංක 1.17 2020 වර්ෂයේ පැවැත්වූ පොල් ඉඩම් වල සත්ත්ව පාලනය සඳහා ගොවීන් දිරිගැන්වීම වැඩසටහනෙහි ප්‍රගතිය

	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන පැවැත්වූ දිනය	සහභාගී වූ සංඛ්‍යාව
01	පොළොන්නරුව ගොවීන් සඳහා	8/25/2020	30
02	ගම්පහ ගොවීන් සඳහා	8/21/2020	53
03	මඩකලපුව ගොවීන් සඳහා	8/25/2020	15
04	ගල්කන්ද -අම්පාර ගොවීන් සඳහා	12/10/2020	31
	එකතුව		129

1.13.2.2.4.4 පොල් ඉඩම් වල ජලසම්පාදනය සඳහා ගොවීන් දිරිගැන්වීම

පොල් ඉඩම් වල ජලසම්පාදනය සඳහා ගොවීන් දිරිගැන්වීමේ වැඩසටහන සඳහා 2020 වර්ෂයේ සහනාධාර ලබාගන්නා වගාකරුවන්, කප්රුක ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කර ඇති වගාකරුවන් හා ශ්‍රමබලකා සාමාජිකයන් මෙම වැඩසටහනට පුහුණුලාභීන් ලෙස තෝරා ගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ වැඩසටහන් 5ක් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පවත්වා ඇත.මේ සඳහා ගොවීන් 233ක් සහභාගිවී ඇත.

වගු අංක 1.18 2020 වර්ෂයේ පැවැත්වූ පොල් ඉඩම් වල සත්ත්ව පාලනය සඳහා ගොවීන් දිරිගැන්වීම වැඩසටහනෙහි ප්‍රගතිය

	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන පැවැත්වූ දිනය	සහභාගීවූ සංඛ්‍යාව
01	කුරුණෑගල ගොවීන්	7/20/2020	38
02	මොණරාගල ගොවීන්	3/13/2020	40
03	මාතලේගොවීන්	9/18/2020	32
04	අනුරාධපුරයගොවීන්	9/17/2020	45
05	හම්බන්තොට ගොවීන්	9/15/2020	78
එකතුව			233

1.13.2.2.5 <u>**පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වූ වෙනත් පුහුණු වැඩසටහන්**</u>

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පහකසුම් සපයාගෙන පොල් වගාකිරීමේ මණ්ඩලයේ හා වෙනත් ආයතන මඟින් පුහුණු හා වෙනත් සාකච්ඡා හා රැස්වීම් 5ක් පවත්වා ඇත. එහි විස්තර පහත පරිදි වේ.

වගු අංක 1.19 2020 වර්ෂයේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වූ වෙනත් පුහුණු වැඩසටහන්හි ප්‍රගතිය

	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන පැවැත්වූ දිනය	සහභාගී වූ සංඛ්‍යාව
01	පොල් ඉඩම් වර්ගීකරණය පිළිබඳ වැඩමුළුව	6/26/2020	10
02	නේවාසික තවාන් භාර රැස්වීම - 2020	7/24/2020	41
03	පො.ව.ම.යේ ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ මාසික සමාලෝචන රැස්වීම	7/30/2020	39
04	පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හාකර්මාන්ත කරුවන් සඳහා කොහුබත් උපස්ථර නිෂ්පාදනය පිලිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	9/10/2020	60
05	ලංකා කාර්මික මණ්ඩලයේ නිළධාරීන් හා කර්මාන්තකරුවන් සඳහා රබර් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩමුළුව	9/22/2020	46
එකතුව			196

1.13.3 2020 වර්ෂයේ රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන

ජාතික ව්‍යාප්ති වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පැළෑටි සංරක්ෂණ වැඩසටහන් 2020 වර්ෂයේදී පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් පහත සඳහන් පළිබෝධ හා රෝග කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහිදී පොල් වගාවට හානි සිදුකරන ප්‍රධාන පළිබෝධ හා රෝග මර්ධනය කෙරෙහි වඩාත් සැලකිල්ලක් දක්වනු ලැබේ. මෙහිදී ප්‍රධාන පළිබෝධ මර්ධනය සඳහා ඒකාබද්ධ පළිබෝධ මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවාට අවශ්‍ය යෙදවුම් නිෂ්පාදනය හා ලබාදීම සිදුකරන අතර හානි වර්ධන අවස්ථාව අනුව පෞද්ගලික උපදෙස් ලබාදී කඩිනමින් එහි තත්ත්වයන් පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙනු ලැබේ.මෙම ප්‍රධාන වැඩසටහන් 2020 වර්ෂයේ ද පහත පරිදි ක්‍රියාත්මතක කරන ලදී.

1.13.3.1 මයිටා මර්දන වැඩසටහන

පොල් වගාවේ මයිටාවන් ඉෙව විද්‍යාත්මක මර්ධනයට යොදා ගන්නා විලෝපික මයිටාවන් අභිජනනය කර හානි ක්ෂේත්‍ර වලට මුදා හැරීම සඳහා පවත්වාගෙන යනු ලබන විද්‍යාගාර 10 මඟින් මයිටාපැකට් 268,521ක් වගාකරුවන් වෙත සහනදායී මිලකට ලබා දී ඇත.

1.13.3.1.1 විලෝපික මයිටාවන් අභිජනනය කර ක්ෂේත්‍රයට නිදහස් කිරීමේ ක්‍රියාවලිය

පොල් මයිටාමර්ධන සඳහා විලෝපික මයිටාවන් අභිජනනය කර ක්ෂේත්‍රයට ලබාදීම පිණිස පිහිටුවා ඇති මයිටා විද්‍යාගාර 10මඟින් 2020වර්ෂය සඳහා ලබා දී ඇති මයිටාපැකට් ප්‍රමාණය හා එමඟින් ආවරණය කරන ලද අක්කර ප්‍රමාණය පහත දැක්වේ.

වගු අංක 1.20 2020 වර්ෂයේදී විලෝපික මයිටා අභිජනන විද්‍යාගාර මඟින් විලෝපික මයිටා පැකට් නික්තුකිරීමේ ප්‍රගතිය

විලෝපික මයිටා අභිජනන විද්‍යාගාරය	2020 නිෂ්පාදිත ප්‍රමාණය (පැකට්)	ක්ෂේත්‍රයට නිදහස් කළ ප්‍රමාණය (පැකට්)	ආවරණය කළ අක්කර
ඩෙඩිවැලි	59,717	51,141	3,196.31
වාරියපොළ	27,145	21,882	1,367.62
හම්බන්තොට	16,750	17,132	1,070.75
මඩකලපුව	31,940	25,836	1,614.75
අම්පාර	33,244	30,232	1,889.5
හඳපානාගල	18,650	16,231	1,014.43
අලම්පිල්	12,900	9,250	578.12
පලෙයි	14,200	12,232	764.5
කෑගල්ල	55,553	49,579	3,098.68
ගම්පහ	40,377	35,006	2,187.87
එකතුව	310,476	268,521	16,782.53

1.13.3.1.2 විලෝපික මයිටා අභිජනන විද්‍යාගාර පරීක්ෂාව

විලෝපික මයිටා විද්‍යාගාරවල ගුණාත්මක බව තබාගැනීම සඳහා මයිටා විද්‍යාගාර විටින් විට පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. විලෝපික මයිටා විද්‍යාගාර වල තත්ත්ව නිසි ලෙස පවත්වා ගැනීම

පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ වාර 24 ක් සැලසුම් කර ඒ අනුව විද්‍යාගාර 10ක් වාර 24 කදි අධීක්ෂණය කර ඇත.

1.13.3.2 ජාතික මට්ටමේ රතු කුරුමිණි මර්දන වැඩසටහන්

1.13.3.2.1 එකාබද්ධ රතු කුරුමිණි හානි කළමනාකරණ වැඩසටහන් පැවැත්වීම

රතු කුරුමිණි හානිය පොල් වගාවේ ප්‍රධාන හානියක් වන අතර දිවයිනේ සෑම පොල් වගා ක්ෂේත්‍ර වලින්ම වාර්තා වේ. මෙම හානිය පොල් ගස් වලට මාරාන්තික වන අතර එමඟින් වාර්ෂිකව නැති වී යන ගස් සංඛ්‍යාවද සැලකිය යුතු මට්ටමක පවතී. මෙම තත්ත්වය කළමනාකරණය කරගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් එකාබද්ධ රතු කුරුමිණි වැඩසටහන් ප්‍රාදේශීය කාර්යාල 19 ආවරණය වන පරිදි සැලසුම් කරන ලදී.

එතෙක් පැවති වාතාවරණය මත මෙම වැඩසටහන් වලින් 4ක් පමණක් වසරේ අවසාන කාර්තුවේදී ක්‍රියාත්මක කරන ලද එම වැඩසටහන් පොළොන්නරුව, හම්බන්තොට, වව්නියාව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල හා හානි තීව්‍ර ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී වෙනත් වර්ෂ වලට වඩා ක්‍රමවේදය තුළ වූ ක්‍රියාකාරකම වෙනස් කර කුඩා කණ්ඩායම් හා පෞද්ගලික හමුවී ඉඩම් වලදී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන් වලදී පහත සඳහන් අරමුණු ඉටු කරගන්නාලදී.

i. රතු කුරුමිණි මර්දන වැඩසටහන ආවරණය කරන ප්‍රදේශය පුරා වගාකරුවන් දැනුවත් කිරීම හා ඔවුන්ගේ සහභාගීත්වය ලබාගැනීම.
ii. එකවර සමූහ උගුල් රැඳවීම මඟින් කෘමි ගහනය කෙටි කාලයකදී අවම කරගැනීම.

ඒ අනුව වැඩසටහන් 4ක් ක්‍රියාත්මක කරන ලද අතර ලැබී තිබූ මුදල් ප්‍රතිපාදන මත ප්‍රාදේශීය කාර්යාල 4ක වැඩසටහන් සඳහා පමණක් උගුල් ලබා දීමට හැකියාව ලැබිණි. උගුල් ලබාදුන් ආකාරය හා වගාකරුවන් වෙත ලබාදුන් උගුල් සංඛ්‍යාව පහත වගුවේ පරිදි වේ. සමස්ථ වැඩසටහන් සඳහා වැයවූ මුදල රු. 925,600ක් වේ.

වගු අංක 1.21 2020 වර්ෂයේදී රතු කුරුමිණි උගුල් ලබාදීමේ ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශය	ලබාදුන් උගුල් හා පෙරමෝන සංඛ්‍යාව
හම්බන්තොට	වීරකැටිය	1000
පොළොන්නරුව	මින්නේරිය	1000
වයුනියාව	වයුනියාව	1000
ත්‍රිකුණාමලය	සේරුනුවරර	1000

ඒකාබද්ධ මර්ධන ක්‍රමවේදයේ අවසාන පියවර ලෙස එකවර කෘමීගහනය අඩුකර ගැනීම සඳහා පෙරමෝන උගුල් හානික් ෂේත්‍රවල යෙදවීම කරනු ලැබේ. මෙහිදී එක් එක් වැඩසටහන් සඳහා පෙරමෝන උගුල් 1000ක් හා පෙරමෝන 1000 නොමිලේ ලබාදී ඇත.

1.13.3.2.2 2020 වර්ෂයේ මොනක්‍රොටපොස් නිකුත් කිරීම්

රතුකුරුමිණි හානිය පාලනය සඳහා යොදාගන්නා මොනක්‍රොටපොස් කෘමිනාශක 2,000ක් වසරේදී ආනයනය කරන ලද අතර එම ප්‍රමාණයන් වගාකරුවන් අතර ලීටර 1987.6ක් මුදලට ලබාදීමට කටයුතු කර ඇත.

1.13.3.2.3. රතුකුරුමිණි පෙරමෝන නිෂ්පාදනය

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති පෙරමෝන නිෂ්පාදන ඒකකය මඟින් පෙරමෝන නල16,972ක් නිපදවා ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදුකරන ලද රතුකුරුමිණි වැඩසටහන් වලට හා සෘජුවම වගාකරුවන් වෙත ලබාදී ඇත. 2020 වර්ෂයේ මුළු නිෂ්පාදනයෙන් නල 12,972ක් ලබාදී ඇති අතර එයින් ලද මුළු ආදායම රු. 1,167,480කි.

1.13.3.3 කළුකුරුමිණි මර්දන වැඩසටහන්

1.13.3.3.1 කළුකුරුමිණි පෙරමෝන

කළුකුරුමිණි හානිය පාලනය සඳහා කළුකුරුමිණි පෙරමෝන 1000ක් ඉන්දියාවෙන් ගෙන්වන ලද අතර ප්‍රාදේශිය කාර්යාල මඟින් වගාකරුවන්ට පෙරමෝන මිලදී ගැනීමට අවස්ථාව ලබාදී ඇත. පෙරමෝන භාවිතය නිසා කෘමී ගහනය අඩුවීම හේතුවෙන් මෙම පෙරමෝනය වගාකරුවන් අතර ජනප්‍රියවී ඇත. වගාකරුවන් මිලදීගත් ප්‍රමාණය 840ක් වන අතර ආදායම රු. 735,000.00ක් වේ.

1.13.3.4 පොල් දළඹු හානිය ජෛව විද්‍යාත්මකව මර්දනය කිරීම

පොල්දළඹු හානිය වසරේ කාලානුරූපීව හටගන්නා පළිබෝධ තත්ත්වයක් වන අතර 2020 වසරේදී පුත්තලම, පොළොන්නරුව, කුරුණෑගල, දිස්ත්‍රික්කයේ ප්‍රධාන වශයෙන් වාර්තා විය. මෙහිදී මෙම හානිය පාලනය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පොල්දළඹු පරපෝෂිත ඒකක 3 වන හම්බන්තොට, මුන්දලම, මඩකලපුව යන මධ්‍යස්ථාන මඟින් පරපෝෂිත නල 1,500ක් නිපදවා 1,227ක් ක්ෂේත්‍රවලට නිදහස්කර ඇත. මෙය නොමිලේ සපයන සේවාවකි. තවද, හානිතීව්‍රලෙස වාර්තාවූ හානි ඉඩම් සඳහා පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශමත මොනක්‍රොටපස් කෘමිනාශකය එන්නත් කර හානිය සාර්ථකව පාලනය කර ඇත. පොල්දළඹු හානි ප්‍රදේශවල වගාකරුවන් දැනුවත් කරහැකි හානි කළමණාකරණ පිළිවෙත් යෙදීමට වගාකරුවන් සංවිධානය කරගැනීමේ අරමුණින් වැඩසටහන් 5ක් සංවිධානයකර 3ක් සාර්ථකව නිමකර ඇත.

1.13.3.5 කාලී නව හටගත් සුළුපළිබෝධ පාලනය

2020 වර්ෂයේ ප්‍රධාන වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හටගත් කහ තිත් පළහැටි උවදුර වසංගත ආකාරයට පත් නොවීම සඳහා නිර්දේශිත මර්ධන ක්‍රම යොදන ලද අතර හානියෙන් බේරාගත් භූමි ප්‍රමාණය අක්කර 365ක් වේ. මේ සඳහා රු.12,987 වැයකර ඇත. සුළු පළිබෝධ පවතින ප්‍රදේශවල වගාකරුවන් දැනුවත් කරහැකි හානි කළමනාකරණ පිළිවෙත් යෙදීමට වගාකරුවන් සංවිධානය කරගැනීමේ අරමුණින් වැඩසටහන් 5ක් සංවිධානයකර 4ක් සාර්ථකව නිමකර ඇත.

1.13.3.6 බෝග සායන පැවැත්වීම

වගාකරුවන්ගේ වගා ක්ෂේත්‍රවල පවතින රෝගපළිබෝධ හා පෝෂණ ඌනතා ආදී ගැටළු ඍජුවම විසඳාගැනීම සඳහා අවශ්‍ය මහපෙන්වීමට බෝග සායන පැවැත්වීම තුළින් සිදුකරනු ලැබේ. මෙය ක්ෂේත්‍රය තුළදී සංවිධානය කරනු ලබන අතර ඒ ඒ ගැටළුවලට විසදුම් ලබාදීමට විෂය පිළිබඳ නිපුණතා නිලධාරීන් කටයුතු කරනු ලැබේ. බෝග සායනයට ප්‍රථමව ගාකරුවන්ගේ ගැටළු පිළිබඳ තොරතුරු හැකිතාක් දුරට ලබාගෙන ලබාදෙන වියදම් පිළිබඳව පූර්ව සූදානමින් කටයුතු කරනු ලැබේ. මෙම අරමුණු ඇතිව 2020 වසරේදී පහත සඳහන් ස්ථාන වලදී පවත්වන ලදී.

1. ඉබ්බගමුව
2. වාරියපොළ
3. ගම්පහ - ඌරපොල

   මේසඳහා රු.42.074 ක මුදලක්වැය විය.

1.13.3.7 නව, නැවත, යටි වගා සහනාධාර වැඩසටහන් යටතේ ප්ලේසිස්පා හා කළු කුරුමිණි හානි මර්ධන වැඩසටහන

නව, නැවත, යටි වගා සහනාධාර වැඩසටහන් යටතේ ප්ලේසිස්පා හා කළු කුරුමිණි හානි මර්ධන වැඩසටහන යටතේ වැඩසටහන් 50 සංවිධානය කල අතර පැවති වසංගත තත්ත්ව යටතේ වැඩසටහන් 25 සාර්ථකව නිම කිරීමට හැකි විය. මේ සඳහා රු. 104,052ක මුදලක් වැය වී ඇත.

1.13.4 ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන -2020

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයෙහි ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වනුයේ:

- පොල් වගාකිරීමේ මණ්ඩලය පිළිබඳව හා එමඟින් සිදුකරන ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම
- පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ කෘෂිකාර්මික ව්‍යාප්තිය පිළිබඳව දැනුම හා ආකල්ප සංවර්ධනය
- පොල් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම බෙදා හැරීමමෙන්ම පොල් වගාකරුවන්ගේ ආකල්ප සංවර්ධනය
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් වලට අවශ්‍ය ව්‍යාප්ති ආධාරක නිර්මාණය, සැකසුම හා බෙදාහැරීම මෙන්ම අවශ්‍ය අනෙකුත් සහයෝගය ලබාදීම ආදියයි.

මෙම අරමුණු සාක්ෂාත්කරගැනීම සඳහා 2020 වර්ෂයේ පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1.13.4.1 ජාතික මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීම හා අවශ්‍ය උපකරණ සකස් කිරීම

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා දායකත්වය ලබා දීම සෑම වර්ෂයකම සිදුකරයි. මෙම ප්‍රදර්ශන පැවැත්වීම මඟින් පොල් වගාව ආශ්‍රිත තාක්ෂණය වගාකරුවන්ට ලබා දීම, පොල් වගාකිරීමේ මණ්ඩලය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා වගා කරුවන්ගේ වගා ගැටළු පිළිබඳ හා ආයතනය පිළිබඳව ප්‍රතිපෝෂණය ලබා ගැනීම අරමුණු විය. එමෙන්ම ප්‍රදර්ශන කුටියට පැමිණි වගාකරුවෙකුට පොල් සංවර්ධන නිලධාරි කාර්යාලයකදී ලබාගත

හැකි සේවා සියල්ල ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී.මෙම ප්‍රදර්ශන සඳහා අවශ්‍ය සහයෝගය ප්‍රාදේශිය කාර්යාල මඟින් ද ලබා ගැනුණි.

2020 වර්ෂයේ ජාතික මට්ටමේ ප්‍රදර්ශන 6ක් මෙහෙය වීමට අවශ්‍ය සහාය හා දායකත්වය ලබා දෙන ලදී.

වගු අංක 1.22 2020 වර්ෂයේ ජාතික මට්ටමේ ප්‍රදර්ශන පැවැත්වීමේ ප්‍රගතිය

පැවැත්වූ දිනය	ප්‍රදර්ශනය	පැවැත්වූ ස්ථානය
2020.01.24සිට 2021.01.26 දක්වා	යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය	නගර සභා ක්‍රීඩාංගණය, යාපනය
2020.02.10සිට2020.02.11 දක්වා	ආඩිමුණේ විදුහලේ 60 වන සංවත්සරය වෙනුවෙන් අධ්‍යාපනික ප්‍රදර්ශනය	පු/ ආඩිමුණේ දෙමළ මහා විද්‍යාලය
2020.02.24 සිට2020.02.26දක්වා	ලබුදුව සිරිධම්ම විද්‍යාලයේ 25 වන සංවත්සරය ‘රිදී අබිසෙස්’ අධ්‍යාපනික ප්‍රදර්ශනය	ලබුදුව සිරිධම්ම විද්‍යාලය, ගාල්ල
2020.09.02	ජාත්‍යන්තර පොල් දින සැමරුම	පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල
2020.09.08	ජාත්‍යන්තර පොල් දින සැමරුම - සමාප්ති වැඩසටහන්	පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය පොල් පැළ තවාන හා කජුවත්ත අරලගන්විල ක්ෂේත්‍ර පරිශ්‍රය
2020.09.17 සිට 2020.09.18 දක්වා	පේරාදෙණිය විශ්වවිද්‍යාල සිසුන් සඳහා ක්ෂේත්‍ර ආදර්ශනය	ඩෙසිවැලි, ආදර්ශ පොල් උයන

1.13.4.2 <u>වර්ණ අත්පත්‍රිකා මුද්‍රණය</u>

පොල් වගාව ආශ්‍රිත තාක්ෂණය වගාකරුවන්ට ලබා දීම සඳහා වර්ණ අත්පත්‍රිකා නිර්මාණය පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කරයි. ජාතික ව්‍යාප්ති වැඩසටහන් වලදී මෙම අත්පත්‍රිකා නොමිලේ වගාකරුවන්ට බෙදා හැරීම සිදු කරයි. 2020 වර්ෂයේ දී අත්පත්‍රිකා වර්ග 15ක් නිර්මාණය කරන ලදී. ඒවා නම්,

- පොල් පැළ සිටුවීම
- පොල් ඉඩම් වල පාංශු සහ තෙතමන සංරක්ෂණය
- පොල් වගාවේ රසායනික පොහොර පොහොර භාවිතය
- පොල් වගාව සඳහා කාබනික පොහොර භාවිතය
- කාබනික පොල් වගාව
- පොල් වගාවේ ඒකාබද්ධ පෝෂක කළමනාකරණය

- ප්ලෙසිස්පා කෘමි හානිමර්ධනය
- පොල් වගාවේ කළු කුරුමිණි හානි මර්ධනය
- කළු කුරුමිණි හානිය පාලනයට පෙරමෝන භාවිතය
- පොල් වගාවට මාරාන්තික රතු කුරුමිණි හානි මර්ධනය
- රතු කුරුමිණි හානිය පාලනයට පෙරමෝන භාවිතය
- පොල් මයිටා හානි මර්ධනය
- මයිටා මර්ධනය සඳහා විලෝපික මයිටාවන් යොදා ගැනීම
- පොල් දළඹු හානි මර්ධනය
- පොල් වගාවේ වන සත්ව හානි පාලනය

2020 වර්ෂයේ දී අත්පත්‍රිකා 580,500 ප්‍රමාණයක් මුද්‍රණය කල අතර මෙම අත් පත්‍රිකා සියල්ල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ www.cdtc.lk වෙබ් අඩවිය මඟින් නොමිලේ භාගතකර ගත හැකිය.මෙම අත් පත්‍රිකා අවශ්‍ය ප්‍රමාණවලින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාල සඳහා බෙදා හරින ලදී.

1.13.4.3 "CDTC පුවත්" ප්‍රවෘත්ති පත්‍රය මුද්‍රණය

පොල් වගාවේ සංවර්ධනය සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කෙරෙන ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් පිළිබඳව තොරතුරු බෙදා හැරීම මෙන්ම නව තාක්ෂණික කරුණු පිළිබඳව පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා CDTC පුවත් ප්‍රවෘත්ති පත්‍රය මුද්‍රණය කරයි. මෙය අර්ධ වාර්ෂිකව මුද්‍රණය කරන අතර, 2020 වර්ෂයේ දී ප්‍රවෘත්ති පත්‍ර කලාප 02 ක් සඳහා ප්‍රවෘත්ති පත්‍ර 500 ක ප්‍රමාණයක් මුද්‍රණය කරන ලදී.එම ප්‍රවෘත්ති පත්‍රය පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන්, අධ්‍යාපනික ආයතන හා අනෙකුත් කෘෂිකාර්මික ආයතන අතර බෙදාහරින ලදී.

1.13.4.4 ප්‍රදර්ශන සඳහා පුවරු හා බැනර් සකස් කිරීම

ජාතික ප්‍රදර්ශනය සඳහා මෙන්ම ක්ෂේත්‍ර ආදර්ශන කටයුතු සඳහා ද අවශ්‍ය පුවරු හා බැනර් සකස් කිරීම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදු කරයි. පොල් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු ඇතුළත් මෙම පුවරු හා බැනර් මඟින් මහජනතාව දැනුවත් කිරීම අපේක්ෂා කරන ලදී. 2020 වර්ෂයේ පුවරු හා බැනර් 36ක ප්‍රමාණයක් මුද්‍රණය කරන ලද අතර, එම සකස් කරන ලද පුවරු හා බැනර් ආදියෙහි මෘදු පිටපත් ප්‍රාදේශිය කාර්යාල සඳහා ද ලබා දී ඇත. එම මෘදු පිටපත් භාවිත කර ප්‍රාදේශිය කාර්යාල සඳහා අවශ්‍ය පුවරු හා බැනර් සකස් කිරීමේ හැකියාවක් පවතී.

1.13.4.5 වෙබ් අඩවිය නඩත්තු කිරීම www.cdtc.lk

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු හා ව්‍යාප්ති කටයුතු වල තොරතුරු මෙන්ම පොල් වගාකරුවන්ට අවශ්‍ය නව තොරතුරු ඇතුළත් www.cdtc.lk වෙබ් අඩවිය නඩත්තු කිරීම 2020 වර්ෂයේදී පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී. මෙම වෙබ් අඩවියෙහි පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් ජනතාවට ලබාගත හැකි සේවා පිළිබඳව හා නවතම ප්‍රවෘත්තින් ද පල කෙරේ. පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සමාජ ජාල වෙබ් අඩවිද (Facebook, YouTube ආදිය) නඩත්තු කරන අතර ඒකකයේ තොරතුරු ද www.cdtc.lk වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය. මීට අමතරව ඕනෑම අයෙකුට තම ගැටළු පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව ද වෙබ් අඩවිය සතුව පවතී.

1.13.4.6 පුහුණුකරුවන් සඳහා සහතික පත් මුද්‍රණය

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ පැවැති පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවූ වගාකරුවන්ට ප්‍රදානය කිරීමට සහතික පත් මුද්‍රණය කරන ලදී.

1.13.4.7 පෝස්ටර් නිර්මාණය හා බෙදා හැරීම

රෝග හා පළිබෝධ පාලනය පිළිබඳ පෝස්ටර් 10000 ක් මුද්‍රණය කර ප්‍රාදේශීය කාර්යාල සඳහා බෙදා හරින ලදී.

2.0 ආදර්ශ පොල් උයන්

පොල් වගාකිරීමේ මණ්ඩලය සතුව ආදර්ශ පොල් උයන් 12 ක් පවතින අතර ඒවායින් අටක් වයඹ පළාතේද තුනක් නැගෙනහිර පළාතේද එකක් උතුරු පළාතේද පිහිටා ඇත.එක් එක් ආදර්ශ පොල් උයන්වල පිහිටීම,කෘෂි දේශගුණික කලාපය හා භූමි ප්‍රමාණය පහත වගුවෙහි දක්වා ඇත.

වගු අංක 2.1 පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් පිළිබඳ තොරතුරු

ආදර්ශ පොල් උයන	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ කොට්ඨාශය	කෘෂි දේශගුණික කලාපය	මුළු අක්කර ප්‍රමාණය
ලේනව	කුරුණෑගල	ඉඹබාගමුව	අතරමැදි වියළි	483.31
ඩෙසිවැලි	කුරුණෑගල	මාවතගම	අතරමැදි තෙත්	306.00
ගර්ටිලන්ඩ්	කුරුණෑගල	පන්නල	අතරමැදි තෙත්	414.61
නාගන්සෝල	කුරුණෑගල	රස්නායකපුර	අතරමැදි වියළි	403.41
රන්දෙනිය	කුරුණෑගල	වාරියපොල	අතරමැදි වියළි	347.62
මහයාය	කුරුණෑගල	පන්නල	අතරමැදි වියළි	331.25
පලෙයි	කිලිනොච්චි	පච්චිලෙයිපලෙයි	පහතරට වියළි	492.94
කොරෙයි	අම්පාර	තිරුක්කෝවිල්	පහතරට වියළි	469.00
බෝපිටිය	කුරුණෑගල	පන්නල	අතරමැදි තෙත්	135.90
පාසිකුඩා	මඩකලපුව	කෝරලේපත්තු නැගෙනහිර	පහතරට වියළි	238.86
කොහොඹාන	අම්පාර	උහන	පහතරට වියළි	152.92
මුන්දලම	පුත්තලම	මුන්දලම	අතරමැදි වියළි	14.25
		එකතුව		**3,790.07**

ආදර්ශ පොල් උයන්වල ප්‍රධාන භෝගය පොල් වගාව වන අතර ආදර්ශ පොල් උයන්වලින් උපරිම ලාභයක් ලබාගැනීමේ අරමුණින් ආදායම් උත්පාදන ව්‍යාපෘති ලෙස අතුරු වගා කිරීම, සත්ව පාලනය, කොහු නිෂ්පාදනය, කොප්පරා නිෂ්පාදනය, සංචාරක නිවාස පවත්වාගෙන යාම, පොල් කටු අඟුරු නිෂ්පාදනය, පොල් ලෙලි චිප්ස් නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය, පොල් පැල නිෂ්පාදනය, අතුරු වගා පැල නිෂ්පාදනය, කප්තුරුපාය අලෙවිසැල් පවත්වාගෙනයාම සිදුකරයි. එසේම ආදර්ශ පොල් උයන් වල විභවය අනුව වී වගා කිරීම, රබර් වගා කිරීම, විලෝපිත මයිටා පැකට් නිෂ්පාදනය, පොල් සංචාරක ව්‍යාපෘතිය හා ග්ලිරිසීඩියා වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. පොල් වගා පාදක ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශන මට්ටමින් ආදර්ශ පොල් උයන් පවත්වාගෙනයාම ප්‍රධාන අරමුණවේ. එසේම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් පොල් වගාකරුවන්, පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල නිලධාරීන් හා කෘෂි කාර්මික සංවිධාන වල සමිති සාමාජිකයින් සඳහා සිදු කරනු ලබන පුහුණු වැඩසටහන් වලදී දැනුවත් කිරීම් සිදු කරයි. එසේම මෙම ආදර්ශ පොල් උයන් මඟින් පුහුණුවන්නන්ට පොල් වගාව ලාභදායීව පවත්වාගැනීම පිළිබඳ ප්‍රායෝගික මඟපෙන්වීම හා පුහුණුව ලබාදීමසිදු කරයි.

ආදර්ශ පොල් උයන්වල නිමැවුම් ලෙස උසස් තත්වයේ බීජ පොල් ,පොල් පැල ,මාළු පොල් ,කොප්පරා ,පොල් කටු අඟුරු ,එළ කිරි ,මී කිරි ,යෝගට් ,කිරි ටොෆී , බිත්තර, එළවළු, පලතුරු, කුළු

බඩු, රබර්, අතුරු භෝග පැල, වී හා විලෝපිත මයිටා පැකට් පාරිභෝගිකයින් වෙත නිකුත් කරනු ලැබේ.

ආදර්ශ පොල් උයන්වල ප්‍රධාන බෝගය පොල් වගාව වන අතර භූමි භාවිතය පිළිබඳ තොරතුරු පහත වගුවෙහිදක්වා ඇත.

වගු අංක 2.2 පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන්හි භූමි භාවිතය

ආදර්ශ පොල් උයන	මුළු ඉඩම් ප්‍රමාණය (අක්.)	පොල් වගාව (අක්.)	ගල් පර්වත (අක්.)	ගොඩනැගිලි/ මාර්ග(අක්.)	ජලාශ (අක්.)	කුඹුරු (අක්.)	වන වගා (අක්.)	වෙනත් (අක්.)	වගා කළ හැකිමෙතෙක් වගා නොකළ (අක්.)
ලේනව	483.31	283.92	51.00	40.31	2.00	25.00	4.00		-
ඩෙසිවැලි	306.00	222.00	6.00	5.00	-	-	-		-
ගර්ටිලන්ඩ්	414.61	205.00		27.66		16.50	1.88		-
නාගන්සෝල	403.41	321.20	3.00	5.00	6.00	26.20	18.00		-
රන්දෙනිය	347.62	201.00	19.62	8.00	-	19.00	-		-
මහයාය	331.25	190.00	-	15.00	13.00	13.00	13.00	8.00	-
පලෙයි	492.94	120.50		13.00	20.00	-	10.00		7.81
කොරෙයි	469.00	82.00		6.43				75.00	-
බෝපිටිය	135.90	72.33	10.15	7.79	-	1.00		16.75	9.51
පාසිකුඩා	238.86	61.50		16.00			2.00		60.00
කොහොඹාන	152.92	72.00	0.50	7.00	1.00	1.00	24.50		17.92
මුන්දලම	14.25	14.00		0.25					-
එකතුව	**3,790.07**	**1,845.45**	**90.27**	**151.44**	**42.00**	**101.70**	**73.38**	**99.75**	**95.24**

2.1.1 පොල් නිෂ්පාදනය



රූපය2.1 ප්‍රධාන කාර්යාලයේ කජ්තුරුපාය වෙළඳසැලේ සහනදායී, සාධාරණ මිලට අලෙවි කිරීමට බෝපිටිය ආදර්ශ පොල් උයනේන් ලෙලි ගසන ලද මාළුපොල් තොගයක්



රූපය 2.2 බෝපිටිය ආදර්ශ පොල් උයනේ පිදී ඵල දරන යටි වගාවේ ගසක මාළු පොල් සඳහා නෙලීමට ප්‍රමාණවත් ලෙස මෝරා ඇති පොල් ඉත්තක් සහ ඊට ඉහළින් ඇති ළපටි පොල් ඉත්තක්

2020 වර්ෂයේ ගෙඩි 5,024,242 ක පොල් අස්වැන්නක් ආදර්ශ පොල් උයන් මඟින් ලබා ඇත. 2019 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 6,496,399 වන අතර එයට සාපේක්ෂව 2020 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 1,472,157 කින් අඩුවී ඇත. 2020 වර්ෂයේ ගෙඩියක නිෂ්පාදන වියදමේ සාමාන්‍ය රු. 18.35 කි. ගෙඩියක විකුණුම් මිලේ සාමාන්‍ය රු.32.97වන අතර ගෙඩියකට ලැබූ ලාභයේ සාමාන්‍ය රු.14.62 කි.

2020 වර්ෂයේ ආදර්ශ පොල් උයන් සියල්ලේම මුළු ආදායම වගුවේ පරිදි රු.214,190,786.69 කි. එය මෙම ආදායම ගණනය කිරීමේ දී වර්ෂය තුළ පොල් වෙනුවෙන් ලැබුණු සියළු ආදායම්ද බීජ පොල් ආදායම්ද. කොප්පරා ආදායම්ද යන සියල්ල එකතු වී ඇති අතර වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස තිබූ පොල් තොගයේ වටිනාකම සහ බීජ පොල් තොගයේ වටිනාකම මෙම ආදායමෙන් අඩු කර වර්ෂ අවසානයේ ශේෂය ලෙස ඉදිරි වර්ෂයට රැගෙන යන පොල් තොගයේ වටිනාකම, බීජ පොල් තොගයේ වටිනාකම සහ කොප්පරා තොගයේත් වටිනාකම එකතු වීමෙන් මෙම සමස්ත ආදායම සකස් වී ඇත.

මෙම වගුව අනුව සමස්ත වියදම 119,199,005.64 ක් වේ. වතු වල පොල් වගාවේ වියදම් ගණනය කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීම්, වාර්ෂික ක්ෂය වීම් සහ වැඩුණු පොල් වගාවේ වටිනාකම වාර්ෂික 2% කපා හැරීමේ මුළු එකතුවෙන් වැඩුණු පොල් වගාවේ වියදම් ලෙස ගණනය කරනුයේ එක් එක් වත්තට අනන්‍ය වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් අනුමත කර ඇති ප්‍රතිශතයක් පමණි.එසේම මුල්‍ය ප්‍රකාශනයේ සඳහන් රු322,321,824.00 යනු වසරට අදාළ මුල්‍ය වටිනාකම නොවන අතර, අදාළ වර්ෂයේ තොග ගැලපීම් කිරීමට පෙර සියළු ආදායම් වල එකතුව පමණි.

වගු අංක 2.3 ආදර්ශ පොල් උයන් වල පොල් අස්වැන්න, ආදායම, වියදම හා ලාභය (වෙන්දේසියේ අළෙවිය, මාළුපොල් අළෙවිය, බීජ පොල් වටිනාකම සහ කොප්පරා වටිනාකම ඇතුළත්)

ආදර්ශ පොල් උයන	වාර්ෂික ඉලක්කය (ගෙඩි)	වාර්ෂික නිෂ්පාදනය (ගෙඩි)	පසුගිය වසරේ ප්‍රගතිය (ගෙඩි)	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)	COP (ගෙඩියක නිෂ්පාදන පිරිවැය)	NSA (සාමාන්‍ය විකුණුම් මිල)	ගෙඩියක ලාභය
ලේනව	950,000	726,637	975,402	36,647,797.60	17,452,283.15	19,195,514.45	17.89	37.57	19.68
සෙසිවැලි	930,000	658,698	980,035	27,666,641.12	15,510,403.11	12,156,238.01	15.83	28.23	12.40
ගර්වලන්ඩ	800,000	649,830	797,456	27,841,703.87	13,340,186.00	14,501,517.87	16.73	34.91	18.18
නාගන්සෝල	825,000	663,314	750,225	26,125,182.67	12,449,459.61	13,675,723.06	16.59	34.82	18.23
රන්දෙනිය	800,000	600,900	824,026	23,453,036.83	15,946,707.00	7,506,329.83	19.35	28.46	9.11
මහයාය	850,000	621,705	854,039	30,301,007.36	14,048,936.21	16,252,071.15	16.45	35.48	19.03
පලෙයි	280,000	142,544	215,456	5,092,654.96	6,532,419.26	(1,439,764.30)	30.32	23.64	(6.68)
කොරෙයි	320,000	268,957	293,533	10,521,972.23	5,498,525.52	5,023,446.71	18.73	35.85	17.11
බෝපිටිය	325,000	261,920	295,007	11,785,451.17	6,951,701.72	4,833,749.45	23.56	39.95	16.39
පාසිකුඩා	260,000	146,717	226,353	4,731,410.76	5,409,533.54	(678,122.78)	23.90	20.90	(3.00)
කොහොඹාන	290,000	222,893	201,770	8,137,006.85	5,658,766.08	2,478,240.77	28.05	40.33	12.28
මුන්දලම	80,000	60,127	83,097	1,886,921.27	400,084.44	1,486,836.83	4.81	22.71	17.89
එකතුව	6,710,000	5,024,242	6,496,399	214,190,786.69	119,199,005.64	94,991,781.05	18.35	32.97	14.62



රූපය 2.3 වාර්ෂික පොල් ගෙඩි ඉලක්කය , නිෂ්පාදනය , පසුගිය වසරේ ප්‍රගතිය ප්‍රස්ථාරයේ දක්වා ඇත.



රූපය 2.4 ආදර්ශ පොල් උයන්වල වාර්ෂික පොල් ආදායම ,වියදම හා ලාභය ප්‍රස්ථාරයේ දක්වා ඇත.

2.1.2 කොප්පරා නිෂ්පාදනය

ආදර්ශ පොල් උයන්වල 2020 වර්ෂයේදී කොප්පරා කි.ග්‍රෑ 172195ක් නිෂ්පාදනය කරන ලද අතර එමඟින් රු. 34,873,161.10ක ආදායමක් ලබාගෙන ඇත.වාර්ෂික වියදම රු. 7,543,597.64 ක් වූ අතර රු.27,329,563.46ක ලාභයක් කොප්පරා නිෂ්පාදනයෙන් ලබාගෙන ඇත.ඒ පිළිබඳ විස්තරය වගුව 4 හි දක්වා ඇත.

මෙම කොප්පරා ආදායම්ද ආදර්ශ පොල් උයන් වල පොල් වගාවේ සමස්ත ආදායමට එකතු විය යුතු අතර ඒ අනුව මෙම ආදායම් ඇතුළත් කර අංක 3 වගුව සාදා ඇත. සමහර තවාන් වල තවාන් අසාර්ථක සහ තවාන් ප්‍රතික්ෂේප සහ එල දරන ගස් වල අස්වනු ප්‍රතික්ෂේපද කොප්පරා කිරීම සඳහා සමහර වතු වලට එවනු ලබන අතර පසුගිය වාර්තාවේ දත්ත වල එම තවාන් වල කොප්පරා වලින් ලැබූ ආදායම් සමහරක්ද ඇතුළත් වී තිබූ බවද දන්වා සිටිමි.

වගු අංක2.4 ආදර්ශ පොල් උයන් වල කොප්පරා නිෂ්පාදන ප්‍රමාණය

ආදර්ශ පොල් උයන	නිෂ්පාදනය කල කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ)				ආදායම(රු.)	වියදම (රු.)	ලාභය (රු.)
	නො.01	නො.02	නො.03	එකතුව			
ලේනව	8861	3857	2995	15713	3,375,093.75	554,510.16	2,820,583.59
ඩෙසිවැලි	14828	7885	4445	27158	6,319,580.00	1,336,773.16	4,982,806.84
ගර්ටිලන්ඩ්	9607	3536	6548.5	19691.5	3,439,203.25	760,965.00	2,678,238.25
නාගන්සෝල	7183	4739	6495	18417	3,409,800.25	1,198,568.97	2,211,231.28
රන්දෙනිය	7501	642	5660	13803	3,103,412.16	613,889.70	2,489,522.46
මහයාය	14138	5871.5	6327.5	26337	5,327,529.38	681,231.76	4,646,297.62
පලෙයි	3767	1606	7088	12461	1,562,829.50	688,223.74	874,605.76
කොරෙයි	6157	1951	3814	11922	2,151,582.00	275,399.43	1,876,182.57
බෝපිටිය	3871.5	2095	1232	7198.5	2,206,006.96	329,623.87	1,876,383.09
පාසිකුඩා	1555	1409	3869	6833	1,269,860.85	524,893.05	744,967.80
කොහොඹාන	6671	3168	2657	12496	2,676,837.00	575,854.80	2,100,982.20
මුන්දලම	95	22	48	165	31,426.00	3,664.00	27,762.00
එකතුව	**84234.5**	**36781.5**	**51179**	**172195**	**34,873,161.10**	**7,543,597.64**	27,329,563.46

2.1.3 පොල් කටු අඟුරු නිෂ්පාදනය



රූපය 2.5 සම්ප්‍රදායික ක්‍රමවේදය අනුව බෝපිටිය ආදර්ශ පොල් උයනේ පොල් කටු අඟුරු නිෂ්පාදනය කිරීම.



රූපය 2.6 සම්ප්‍රදායික ක්‍රමවේදය භාවිතා කරමින් නිෂ්පාදනය කරන ලද පොල් කටු අඟුරු බෝපිටිය ආදර්ශ පොල් උයන

එක් එක් ආදර්ශ පොල් උයන් මඟින් නිෂ්පාදනය කරන ලද අඟුරු ප්‍රමාණය වගුව 5 හි දක්වා ඇත. ඒ අනුව නිෂ්පාදනය කල අඟුරු ප්‍රමාණය කි.ග්‍රෑ. 60696 ක් වන අතර ලාභය රු. 1,922,507.43

වගු අංක 2.5 ආදර්ශ පොල් උයන් වල පොල් කටු අඟුරු නිෂ්පාදන ප්‍රමාණය

ආදර්ශ පොල් උයන	නිෂ්පාදනය කල අඟුරු (කි.ග්‍රෑ.)	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ලේනව	4,885	273,470.00	50,360.00	223,110.00
ඩෙසිවැලි	4,130	230,500.00	19,606.58	210,893.42
ගර්ටිලන්ඩ්	5,286	-	185,428.43	(185,428.43)
මහයාය	5,957	358,310.00	53,108.61	305,201.39
පලෙයි	560	175,140.00	6,720.00	168,420.00
කොරෙයි	3,748	405,060.00	31,141.29	373,918.71
බෝපිටිය	8,900	630,160.00	136,652.82	493,507.18
පාසිකුඩා	23850	150,920.00	48,319.70	102,600.30
කොහොඹාන	3,380	243,360.00	13,075.14	230,284.86
එකතුව	**60696**	**2,466,920.00**	**544,412.57**	**1,922,507.43**

2.1.4 බීජ පොල් නිෂ්පාදනය

2020 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් තෝරා ගෙන ඇති මව් ගස් වලින් PP1 වර්ගය එම බීජ පොල් 318,117ක් නිෂ්පාදනය කරන ලද අතර බීජ නිෂ්පාදන ඒකකයේ නියෝග අතර පොල් වගා කිරීමේ මණ්ඩලයේ තවාන් වෙත යොමු කර ඇත.එම විස්තර පහත දැක්වේ.

වගු අංක 2.6 2020 වර්ෂයේ ආදර්ශ පොල් උයන් වල නිෂ්පාදනය කර ඇති බීජ පොල් සඳහා ලැබුණු ආදායම (මෙම ආදායම් සමස්ත පොල් ආදායම් පිළිබඳ අංක 2.3 වගුවට ඇතුළත් කර ඇත.)

ආදර්ශ පොල් උයන	නිෂ්පාදනය කල බීජපොල් ප්‍රමාණය (ගෙඩි)	බීජ පොල් සඳහා ලැබූ ආදායම (රු.)
ලේනව	48,924	3,510,852.70
ඩෙසිවැලි	33,565	1,363,002.00
ගර්ටිලන්ඩ්	29,944	2,068,548.02
නාගන්සෝල	34,238	2,118,062.00
රන්දෙනිය	28,221	1,139,147.10
මහයාය	15,604	615,814.40
පලෙයි	29,700	1,258,025.00
කොරෙයි	18,599	1,185,618.66
පාසිකුඩා	36,500	651,153.80
කොහොඹාන	30,110	1,577,923.50

මුන්දලම	12,712	586,504.53
එකතුව	318,117	16,074,651.71

2.1.5 අගය වැඩි කළ නිෂ්පාදන

ආදර්ශ පොල් උයන් වලින් ලැබෙන පොල් ලෙලි කෘෂි කාර්මික කටයුතු වලට භාවිතා කිරීමෙන් පසු ඉතිරි වන අතිරික්ත පොල් ලෙලි , පොල් ලෙලි යොදා ගනිමින් පවතින සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් මණ්ඩලයේ තවාන් සඳහා බදුන් මාධ්‍ය වශයෙන් කොහු බත් සහ පොල් ලෙලි චිප්ස් නිපදවා තවාන් වෙත සාධාරණ මිලකට අලෙවි කරනු ලබයි. ඒ සඳහා ලේනව සහ නාගන්සෝල ආදර්ශ පොල් උයන් වල පොල් ලෙලි චිප්ස් නිපදවීමේ ව්‍යාපෘති දෙකක් ඇති අතර, ගර්ටිලන්ඩ්, රන්දෙනිය සහ පාසිකුඩා ආදර්ශ පොල් උයන් වල කොහු මෝල් ව්‍යාපෘති ඇත. කොහු මෝල් ව්‍යාපෘති වලදී ලැබෙන කොහු අලෙවි කිරීමෙන් අතිරේක ආදායමක් ලැබේ.

2.1.6 පොල් ලෙලි චිප්ස් නිෂ්පාදනය.

පැල නිෂ්පාදනය සඳහා පෙර සිට භාවිතා වන කොහුබත් වෙනුවට ආදේශකයක් ලෙස පොල් ලෙලි චිප්ස් භාවිතා කල හැක. කොහුබත් මිලට ගැනීම සඳහා වාර්ෂිකව වැය වන මුදල අඩු කිරීම සඳහා ආදර්ශ පොල් උයන් සතු පොල් ලෙලි වලින් චිප්ස් කැබලි කපා කොහුබත් වෙනුවට භාවිතා කිරීම සිදුකරන අතර මුදලට අලෙවිය කිරීමත් සිදු කරනු ලබයි.

වගුව 2.7 - 2020 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් ලෙලි කැබලි නිෂ්පාදනය, ආදායම සහ ලාභය.

ආදර්ශ පොල් උයන්	නිෂ්පාදිත ප්‍රමාණය (කියුබ්)	ප්‍රමාණය (සණ අඩි)	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ලේනව	177.5	17750	1,264,750.00	842,931.05	421,818.95
නාගන්සෝල	67	6700	435,500.00	312,542.74	122,957.26
එකතුව	**244.5**	**24450**	**1,700,250.00**	**1,155,473.79**	**544,776.21**



රූපය 2.7 ලේනව ආදර්ශ පොල් ද්විත්ව කැපීමේ යන්ත්‍රය මඟින් සේවිකාවන් දෙදෙනෙකු විසින් එකවර පොල් ලෙලි චිප්ස් කැපීම.



රූපය 2.8 ලේනව ආදර්ශ පොල් උයනේ නිෂ්පාදිත පොල් ලෙලි චිප්ස් වේලා ගබඩා කිරීමට රැගෙන යාම.

2.1.7 කොහු කෙඳි නිෂ්පාදනය



රූපය 2.9 රන්දෙනිය ආදර්ශ පොල් උයනේ මිශ්‍ර කොහු නිෂ්පාදනාගාරය



රූපය 2.10 රන්දෙනිය ආදර්ශ පොල් උයනේ නිෂ්පාදිත මිශ්‍ර කොහු සහ කොහු බත්



රූපය 2.11 **ගර්ටිලන්ඩ් ආදර්ශ පොල් උයනේ නිෂ්පාදිත කොහු අළෙවිය පිණිස බේල් කර ගබඩා කර ඇති අයුරු**

2020 වර්ෂයේදී ක්‍රියාත්මක වූ කොහු නිෂ්පාදන ව්‍යාපෘතිය ආදර්ශ පොල් උයන් 03 ක ක්‍රියාත්මක වූ අතර එමඟින් රු.2,226,290.00 ක ආදායමක් ද රු.829,541.76 ක ලාභයක් ද උපදවා ඇත.

වගුව 2.8 - කොහු නිෂ්පාදනය , ආදායම, වියදම හා ලාභය

ආදර්ශ පොල් උයන	නිෂ්පාදිත ප්‍රමාණය			ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
	කොහු (කි.ග්‍රෑ)	කොහුබත්				
		(ක්‍රිලෝ)	(කියුබ්)			
රන්දෙනිය	6450	-	143	1,131,450.00	244,519.67	886,930.33
පාසිකුඩා	16300	24450	-	135,480.00	468,372.83	-332,892.83
ගර්ටිලන්ඩ්	10775	9600	-	959,360.00	683,855.74	275,504.26
එකතුව	**33525**	**177050**		**2,226,290.00**	**1,396,748.24**	**829,541.76**

2.1.8 පොල් වගාකිරීමේ වැඩ සටහන

(නව වගාව, යටි වගාව, පුරප්පාඩු සිටුවීම)

2020 වර්ෂයේ අළුතින් පොල් වගාකිරීම, නැවත / යටි වගා කිරීම හා පොල් වගාවේ පුරප්පාඩු සිටුවීම මඟින් පොල් වගාව වැඩි කිරීමත් හා පවතින පොල් වගාවේ ගහන ඝනත්වය වැඩි කිරීමත් සිදු කරන ලදී. ආදර්ශ පොල් උයන් අනුව ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුව 2.9 පොල් නව වගාකිරීම



ආදර්ශ පොල් උයන	නව වගාව	
	අක්කර	පැල
කොරෙයි	11	682
පාසිකුඩා	3	192
කොහොඹාන	43	2775
එකතුව	**57**	**3649**

රූපය 2.12 පළෙයි ආදර්ශ පොල් උයනේ නව වගාකරන ලද අවුරුදු 05 ක් පමණ වයස පොල් පැළයකි.

වගුව 2.10පොල් යටි වගාකිරීම



ආදර්ශ පොල් උයන	යටි වගා කිරීම	
	අක්කර	පැල
නාගන්සෝල	10	640
පාසිකුඩා	55	3560
එකතුව	**65**	**4200**

රූපය 2.13රන්දෙනිය ආදර්ශ පොල් උයනේ අවුරුදු 02ක් වයස යටි වගාව.

වගුව 2.11පොල් වගාවේ පුරප්පාඩු සිටුවීම



ආදර්ශ පොල් උයන	පුරප්පාඩු සිටුවීම (පැළ)
ලේනව	1608
ඩෙසිවැලි	1895
ගර්ට්ලන්ඩ්	1922
නාගන්සෝල	715
රන්දෙනිය	164
මහයාය	678
පලෙයි	2850
කොරෙයි	689
බෝපිටිය	1250
පාසිකුඩා	128
කොහොඹාන	622
මුන්දලම	80
එකතුව	**12601**

රූපය 2.14 නාගන්සෝල ආදර්ශ පොල් උයන් පුරප්පාඩු සිටුවන ලද පැලයක් වටා වසුන් යෙදීම.

2.1.9 ආදර්ශ පොල් උයන්වල ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්

ආදර්ශ පොල් උයන් වල වගාකළ නව වගා ප්‍රමාණයද ඇතුළුව සමස්තයක් ලෙස 2020 වසරේදී අක්කර 57 ක පොල් පැල 3649ක් අළුතින් වගාකර ඇත. මණ්ඩලයේ සියළුම ආදර්ශ පොල් උයන්වල පුරප්පාඩු සිටවූ පැල ගණන 12601 ක් වේ. 2020 වසරේ අක්කර 65ක පැල4200ක් යටි වගා කර ඇත.ආදර්ශ පොල් උයන්වල ඵලදරණ වගාවේ සහ පැල වගාවේසිදු කරණු ලබන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගින් පොල් වගා භූමියේ භෞතික, ජීව විද්‍යාත්මක හා රසායනික තත්වය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම පස සෝදා යාම වැළැක්වීමත්, පසේ තෙතමනය සංරක්ෂණය කිරීමත් මෙම කාර්යයන්ගෙන් සිදුකරනු ලබන අතර රෝග පලිබෝධ මර්ධනය මගින් වගාවේ ආරක්ෂාව තහවුරු කිරීමත් සිදු කෙරේ. 2020 වර්ෂයේ එක් එක් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ආදර්ශ පොල් උයන් අනුව පහත දැක්වේ.

2.1.9.1මාර්ග හා බෝක්කු

සියළුම ආදර්ශ පොල් උයන්වල මීටර් 35412 ක මාර්ග හා බෝක්කු අළුත්වැඩියා කර ඇති අතර ආදර්ශ පොල් උයන් අනුව ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගු අංක 2.12 ආදර්ශ පොල් උයන්වල මාර්ග හා බෝක්කු අළුත්වැඩියා කිරීම

ආදර්ශ පොල්උයන	අළුත්වැඩියා / නඩත්තු කල මාර්ග ප්‍රමාණය (මීටර්)
ලේනව	6530
ඩෙසිවැලි	1395
ගර්ට්ලන්ඩ්	3463
නාගන්සෝල	7740
රන්දෙනිය	3613

මහයාය	760
පලෙයි	3978
කොරෙයි	935
බෝපිටිය	3879
පාසිකුඩා	1704
කොහොඹාන	1205
මුන්දලම	210
එකතුව	**35412**



රූපය 2.15 බෝපිටිය ආදර්ශ පොල් උයනේ අභ්‍යන්තර මාර්ග වල සෝදා පාලුව/ මතුපිට ජලය ගලාගෙන යාම අවහිර කිරීම සඳහා ආනත හරස් වැටි දැමීම.

2.1.9.2 වැට සැකසීම



රූපය 2.16 නඩත්තු කරන ලද පැරණි වැටක් (නාගන්සෝල ආදර්ශ පොල් උයන) වියදම අවම කර ගැනීමට

ආදර්ශ පොල් උයන්වල ආරක්ෂාව සඳහා සිදු කරණු ලබන නව වැටවල් සකස් කිරීම (මීටර් 5439) හා පවතින වැටවල් අළුත්වැඩියා කිරීම (මීටර් 68960) ක් 2020 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල සිදු කර ඇති අතර ආදර්ශ පොල් උයන් අනුව එහි ප්‍රගතිය වගුව 11 හි දක්වා ඇත.

වගුව 2.13- ආදර්ශ පොල් උයන් වල 2020 වර්ෂය වැට සැකසීම ප්‍රගතිය

ආදර්ශ පොල් උයන	නව කම්බි වැට සෑදීම (මීටර්)	කම්බි වැට අළුත්වැඩියාව (මීටර්)
ලේනව	-	15692
ඩෙසිවැලි	-	4086
ගර්ටිලන්ඩ්	-	7173
නාගන්සෝල	-	4351
රන්දෙනිය	-	5505
මහයාය	-	1247
පලෙයි	-	13959
කොරෙයි	5000	5048
බෝපිටිය	439	3879
පාසිකුඩා	-	4340
කොහොඹාන	-	2980
මුන්දලම	-	700
එකතුව	**5439**	**68960**

2.1.9.3 වල් මර්ධනය



රූපය 2.17 රන්දෙනිය ආදර්ශ පොල් උයනේ යටි වගාකරන ලද ක්ෂේත්‍රයක් පොල් පැල වල අතු හානි නොවන ලෙස පිටේ රදවන යන්ත්‍රයක් මඟින් වල් මර්ධනය කිරීම.

ආදර්ශ පොල් උයන්වල වල් මර්ධනය කම්කරුවන් මඟින් ,රසායනික ද්‍රව්‍ය මඟින් ,යාන්ත්‍රික ක්‍රම මඟින් හා සතුන් මඟින් යන ආකාර 4 මගින් සිදුකරණු ලබයි. වසර පුරා වරින් වර සිදු කරන ලද වල් මර්ධන ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුව 2.14 ආදර්ශ පොල් උයන්වල වල් මර්ධනය - 2020

ආදර්ශ පොල් උයන	වල් මර්ධනය (අල්ලි)
ලේනව	227049
ඩෙසිවැලි	27628
ගර්ටිලන්ඩ්	30949
නාගන්සෝල	44156
රන්දෙනිය	34196
මහයාය	37940
පලෙයි	42888
කොරෙයි	20005
බෝපිටිය	11263
පාසිකුඩා	6598
කොහොඹාන	11416
මුන්දලම	2130
එකතුව	**496218**

2.1.9.4 කාණු යෙදීම, ලෙලි වැළලීම



රූපය 2.18 සමෝච්ඡ සහ ජල සංරක්ෂණය කර ගැනීමට යටිවගාක්ෂේත්‍රයේ 2020 වර්ෂයේ කපන ලද සමෝච්ඡ කාණුවක්



රූපය 2.19 පාංශු සහ ජල සංරක්ෂණය සඳහා බෝපිටිය ආදර්ශ පොල් උයනේ 2020 වර්ෂයේ විවෘත කර ඇති 8x4x3 ලෙලි වලක්

පොල් වගාවේ පවතින තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා සමෝච්ඡ කාණු යෙදීම හා ලෙලි වලවල් යෙදීමත් වැඩිපුර ජලය බැසයාම සඳහා ජල බස්නා කාණු යෙදීමත් සිදුකරනු ලබයි.

වගුව 2.15- පොල් වගාවේ කාණු යෙදීම හා ලෙලි වැලලීම

ආදර්ශපොල් උයන	සමෝච්ඡ කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර්)	ජලබස්නා කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර්)	ලෙලි වැලලීම (වලවල් ගණන)
ලේනව	1314	-	400
ඩෙසිවැලි	-	-	682
ගර්ට්ලන්ඩ්	-	502	37
නාගන්සෝල	750	750	300
රන්දෙනිය	906	2603	454
මහයාය	-	1441	935
පලෙයි	-	2018	77
කොරෙයි	-	1460	190
බෝපිටිය	-	1000	1243
පාසිකුඩා	-	375	206
කොහොඹාන	-	1390	288
මුන්දලම	490	-	33
එකතුව	**3460**	**11539**	**4845**

2.1.9.5 ආස්තරණ යෙදීම ,ආවරණ භෝග වගාව හා සී සෑම



රූපය 2.20 ආස්තරණ යෙදීම

2020 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල තෙතමනය සංරක්ෂනය සඳහා පොල් ගස වටා ආස්තරණ යෙදීම එක් වසරක් තුල අවස්ථා කීපයකදී සිදු කරනු ලබයි. එයට අමතරව පොල් වගාවේ ආවරණ භෝග වගාව හා සී සෑම ද සිදු කරනු ලබයි. එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුව 2.16 ආස්තරණ යෙදීම ,ආවරණ භෝග වගාව හා සී සෑම

ආදර්ශ පොල්උයන	සී සෑම(අල්ලි)	ආස්තරණ යෙදීම(ගස්)	ආවරණ භෝගවගාව(අල්ලි)
ලේනව	297	20627	1253
ඩේසිවැලි	1500	5016	-
ගර්ට්ලන්ඩ්	389	18686	-
නාගන්සෝල	91	14997	250
රන්දෙනිය	6650	14658	422
මහයාය	2235	57009	-
පලෙයි	2616	15810	69
කොරෙයි	156	50296	256
බෝපිටිය	1597	3531	797
පාසිකුඩා	1209	11770	-
කොහොඹාන	4535	12648	42
මුන්දලම	50	150	-
එකතුව	**21325**	**225198**	**3089**

2.1.9.6 කාබනික පොහොර යෙදීම



රූපය 2.21 ආස්තරණ යෙදීම

කාබනික පොහොර දමන ලද පොල් ගසක් වටා අඩි 3ක් ඈතින් අඩි තුනක් පලලට අගල් 6ක් ගැඹුරට කපන ලද වැසීමට සුදානම් කාණුව.

පසේ භෞතික තත්වය වැඩිදියුණු කිරීමත් ,එහි පෝෂක සංඝටක වැඩිකිරීමත් පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමත් මඟින් පොල් වගාවේ පාංශු තත්වය දිගුකාලීනව සංවර්ධනය සඳහා වගාවට කාබනික පොහොර යෙදීම සිදු කරයි. ප්‍රදේශයේ සුලභතාවය අනුව කාබනික පොහොර ලෙස කුකුළු පොහොර, ගොම පොහොර ,එළු/බැටළු පොහොර හා කොම්පෝස්ට් යෙදීම සිදු කරයි. මෙහි කාබනික පොහොර ආදායම රු.19,484.00 ක් වේ.

වගුව 2.17 - කාබනික පොහොර යෙදීම ප්‍රගතිය.

ආදර්ශ පොල් උයන	කාබනික පොහොර යෙදූ ප්‍රමාණය	
	ගස් ගණන	කි.ග්‍රෑප්‍රමාණය
ලේනව	2080	62400
ඩෙසිවැලි	300	9000
රන්දෙනිය	1200	36000
මහයාය	1730	13200
පලෙයි	164	14050
කොරෙයි	1735	21000
බෝපිටිය	1879	112560
පාසිකුඩා	1741	52230
කොහොඹාන	302	9060
මුන්දලම	600	18000
එකතුව	**11731**	**347500**

2.1.10අතුරු වගා වැඩසටහන.

පොල් වගාව සිදුකරනු ලබන භූමිවල පොල් වගාවේ පරතරය හේතුවෙන් භූමි භාවිතයෙන් 2/3 ඉඩ ප්‍රමාණයක් ඉතිරිවන අතර මෙම ඉඩකඩ ප්‍රමාණය තුල වෙනත් වගා සිදු කල හැක.අවුරුදු 5 ට අඩු හා අවුරුදු 35 ට වැඩි පොල් වගාව තනි වගාවක් ලෙස සිදු කරන භූමි වල අතුරු වගා කිරීම සිදුකිරීමේ හැකියාව ඇත. ඒ අනුව එම ඉඩකඩ ප්‍රමාණය භාවිතා කොට කෙටිකාලීන භෝග හා දිගු කාලීන භෝග අළුතින් වගාකිරීමත් පවතින අතුරු වගා නඩත්තු කිරීමත් සිදුකර ඇත අතුරු වගා ලෙස කෙටි කාලීන එළවළු වර්ග ,අල වර්ග ,ඖෂධ වර්ග ,කුළුබඩු වර්ග ,මාෂ භෝග ,ධාන්‍ය හා පලතුරු භෝග වගාකර ඇත.2020 වර්ෂයේ අතුරු වගා මඟින් රු.3,750,448.00 ක ආදායමක් ලබා ඇත.



රූපය 2.22 අතුරු වගා ලෙස ද්විත්ව පේලි අන්නාසි



රූපය 2.23 හොඳින් වැවී ඇති මඤ්ඤෝක්කා අතුරු වගාව



රූපය 2.24ද්විත්ව පේළි ක්‍රමයට අලුතින් ආරම්භ කරන ලද ගම්මිරිස් වැල් වගාව.

2.1.11 වී වගාව



රූපය 2.25 **ගර්ටිලන්ඩ් ආදර්ශ පොල් උයනේ අස්වනු කැපීමට අවසන් වී වගාව.**

ලේනව, රන්දෙනිය, ගර්ටිලන්ඩ්, මහයාය, කොහොඹාන හා නාගන්සෝල ආදර්ශ පොල් උයන්වල වී වගා වැඩ සටහන2020වර්ෂයේදී ක්‍රියාත්මක විය. ඉන් ආදර්ශ පොල් උයන් 04ක අක්කර 85 ක වී වගාව අඳ ගොවීන් මඟින් සිදුකර ඇති අතරමහයාය හා කොහොඹාන ආදර්ශ පොල් උයන් මඟින් අක්කර 1.75ක ප්‍රමාණයක වී වගාකර ඇත. සමස්ත වී වගා ලාභයරු.1,260,675.55ක් වන අතර නිෂ්පාදිත වී ප්‍රමාණය කි.ග්‍රෑ27952.5ක් වේ. 2020වර්ෂයේ වී වගා ප්‍රගතිය පහත දක්වා ඇත.

වගු අංක 2.18 ආදර්ශ පොල් උයන්වලවී වගාවේ ප්‍රගතිය

ආදර්ශපොල් උයනි	වගාකල අක්කර ප්‍රමාණය (අක්කර)		නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ.)	අලෙවිකල ඩ ප්‍රමාණය (කි.ග්‍රෑ.)	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
	ආ.පො.ඵ මඟින්	අඳ ගොවීන් මඟින්					
ලේනව	-	25	7260	6977	376,758.00	13,516.55	363,241.45
රන්දෙනිය	-	19	5143.5	5143.5	138,320.00	-	138,320.00
ගර්ටිලන්ඩ්	-	15	5715	5715	296,687.50	3,488.32	293,199.18
මහයාය	0.25	-	846	846	46,475.00	2,525.00	43,950.00
කොහොඹාන	1.5	-	1656	1656	89,424.00	68,817.08	20,606.92
නාගන්සෝල	-	26	7332	7332	401,358.00	-	401,358.00
එකතුව	**1.75**	**85**	**27952.5**	**27669.5**	**1,349,022.50**	**88,346.95**	**1,260,675.55**

2.1.12 පොල් පැළ නිෂ්පාදනය



රූපය 2.26 කොහොඹාන ආදර්ශ පොල් උයනේ බිම් පොල් පැල තවාන් දමන සේවක සේවිකාවන්



රූපය 2.27 ඩෙසිවැලි ආදර්ශ පොල් උයනේ මාස 05ක් වයස බිම් පොල් පැල තවාන



රූපය 2.28 නිකුත් කිරීමට සුදානම් කර ඇති ඩෙසිවැලි ආදර්ශ පොල් උයනේ පොලි බෑග් පැල

2.1.12.1 බීජ පොල් තවාන් කිරීම

2020 වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල බිජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

වගු අංක 2.19 බිජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය

ආදර්ශ පොල් උයන	බිජපොල් ලැබීම හා තවාන් කිරීම
	බඳුන්පැල
ලේනව	22791
ඩෙසිවැලි	25295
ගර්ටිලන්ඩ්	12486
නාගන්සෝල	24000
රන්දෙනිය	11200
මහයාය	12960
පලෙයි	10200
කොරෙයි	9831
බෝපිටිය	13500
පාසිකුඩා	27140
කොහොඹාන	3704
මුන්දලම	6800
එකතුව	**179907**

2020 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල පොල් පැල තවාන්වල පැල නිෂ්පාදන ප්‍රගතිය වගුවෙහි දක්වා ඇත.

වගු අංක 2.20 පොල් පැල නිෂ්පාදන ප්‍රගතිය

ආදර්ශ පොල් උයන	බිම්පැල		බඳුන්පැල		එකතුව
	යල කන්නය	මහ කන්නය	යල කන්නය	මහ කන්නය	
ලේනව	1942	-	1000	21960	24902
ඩෙසිවැලි	-	-	16095	-	16095
ගර්ටිලන්ඩ්	-	-	12486	-	12486
රන්දෙනිය	-	-	11141	11200	22341
පලෙයි	-	-	15329	-	15329
කොරෙයි	-	-	1377	1225	2602
බෝපිටිය	-	-	13500	-	13500
පාසිකුඩා	18285	-	21282	-	39567
කොහොඹාන	-	-	4795	-	4795
මුන්දලම	-	-	5100	-	5100
එකතුව	**20227**	**-**	**102105**	**34385**	**156717**

ආදර්ශ පොල් උයන් මඟින් 2020 වර්ෂයේදී පොල් පැල නිකුත් කිරීමේ ප්‍රගතිය වගුව 19 හා ආදායම් , වියදම් ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගුඅංක2.21 - පැළ නිකුත් කිරීම් ප්‍රගතිය (2020)

ආදර්ශපොල් උයන	නිකුත්කල පොල් පැල ගණන		එකතුව
	බිම් පැල	බඳුන්පැල	
ලේනව	1942	22183	24125
ඩෙසිවැලි	24337	16474	40811
ගර්ටිලන්ඩ්	38961	8011	46972
නාගන්සෝල	18724	3134	21858
රන්දෙනිය	-	16998	16998
මහයාය	3248	21443	24691
පලෙයි	5950	19621	25571
කොරෙයි	4091	6978	11069
බෝපිටිය	15302	20557	35859
පාසිකුඩා	9796	16589	26385
කොහොඹාන	5270	15805	21075
මුන්දලම	2210	6914	9124
එකතුව	**129831**	**174707**	**304538**

වගු අංක 2.22 **පොල් පැල නිෂ්පාදන ආදායම, වියදම හා ලාභය**

ආදර්ශ පොල් උයන	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ලේනව	320,952.72	4,375,732.84	(4,054,780.12)

ඩෙසිවැලි	780,054.14	1,868,985.29	(1,088,931.15)
ගර්ට්ලන්ඩ්	7,256,669.19	1,262,646.07	5,994,023.12
නාගන්සෝල	4,978,899.55	2,630,617.73	2,348,281.82
රන්දෙනිය	1,833,934.43	1,430,123.43	403,811.00
මහයාය	3,928,128.16	922,499.32	3,005,628.84
පලෙයි	1,979,260.31	1,647,955.05	331,305.26
කොරෙයි	1,651,091.42	1,096,230.16	554,861.26
බෝපිටිය	3,308,556.72	1,842,598.15	1,465,958.57
පාසිකුඩා	4,112,124.51	1,779,734.39	2,332,390.12
කොහොඹාන	(138,716.37)	591,648.23	(730,364.60)
මුන්දලම	1,067,445.16	154,948.00	912,497.16
එකතුව	**31,078,399.94**	**19,603,718.66**	**11,474,681.28**

2.1.13 සත්ව පාලන වැඩසටහන



රූපය 2.29 ආදර්ශ පොල් උයන් නිදැලි ගව ව්‍යාපෘතිය



රූපය 2.30මීගව ව්‍යාපෘතිය



රූපය 2.31ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයනේ බැටළු ව්‍යාපෘතිය



රූපය 2.32පාසිකුඩා උයනේ එළු ව්‍යාපෘතිය

ඒකිය භෝගයක් ලෙස පොල් වගාකිරීමට වඩා පොල් වගාව සමඟ අතුරු වගා කිරීම හා සත්ව පාලනය කිරීම මඟින් ආදර්ශ පොල් උයනේ භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම සිදු කරයි. ආදර්ශ පොල් උයනේ පවතින විභවය අනුව තෝරාගත් සත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාවට නංවන අතර ඒ යටතේ එළ ගවයන්, මී ගවයන්, එළුවන් ,බැටළුවන් හා කුකුළන් ඇති කරනු ලබයි. සත්ව නිෂ්පාදන වැඩසටහන යටතේ දියර කිරි ,මුදවපු කිරි, යෝගට් ප්‍රධාන වශයෙන්ද කිරි ටොෆි සුළු වශයෙන්ද නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන අතර අභිජනන කටයුතු සඳහා ගොවීන්ට සහන මිලට සතුන් අලෙවි කරනු ලැබේ. ආදර්ශ පොල් උයනේ කාබනික පොහොර අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක්ද මේ මඟින් සපයනු ලැබේ. විශ්ව විද්‍යාල සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහාද සත්ව පාලන ව්‍යාපෘති උපකාරී වී ඇත.

වගු අංක 2.23 - 2020.12.31 දිනට සත්ව පාලන ව්‍යාපෘතිවල සමස්ත ආදායම ,වියදම හා ලාභය

සත්ව පාලන ව්‍යාපෘතිය	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ගව පාලනය	6,870,812.10	5,173,424.50	**1,697,387.60**
එළු පාලනය	353,760.00	1,166,607.31	**(812,847.31)**
බැටළු පාලනය	384,312.50	396,390.32	**(12,077.82)**
එකතුව	**7,608,884.60**	**6,736,422.13**	**3,292,992.67**

2.1.14 විලෝපිත මයිටා නිෂ්පාදනය හා ආදර්ශ පොල් උයන්වල භාවිතය

ආදර්ශ පොල් උයන්වල ඇති මයිටාවන්ගේ හානිය නිසා අස්වැන්නේ පැහැදිලි අඩුවීමක් සිදුවේ. ගෙඩි කුඩාවීම ,ගෙඩිවල ගුණාත්මය අඩුවීම හා අස්වැන්න අඩුවීම මයිටා හානිය නිසා සිදුවේ. එසේම ලෙලි වල ප්‍රමාණය කුඩා වීම හේතුවෙන් ලෙලි ඉවත් කිරීම අපහසු වීමත් ලෙලිවල ආදායම අඩුවීමත් හේතුවෙන් පොල් අස්වැන්නේ ආදායම අඩුවීම සිදුවේ. මයිටාවන් ජෛව විද්‍යාත්මක ක්‍රම මඟින් මර්ධනය සඳහා විලෝපිත මයිටාවන් භාවිතා කරනු ලබන අතර මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මකවූ රසායනාගාර 10 ක් ඇත.



රූපය 2.33 **නිෂ්පාදිත විලෝපිත මයිටා බෑගයක්**

ආදර්ශ පොල් උයන්වල මයිටා මර්ධනය සඳහා විලෝපිත මයිටාවන් භාවිතා කල අතර එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

වගු අංක 2.24 ආදර්ශ පොල් උයන් වල විලෝපිත මයිටාවන් භාවිතය

ආදර්ශ පොල්උයන	යෙදූ විලෝපිත මයිටා පැකට් ගණන
ලේනව	2900
ඩෙසිවැලි	2000
ගර්ටිලන්ඩ්	3500
නාගන්සෝල	1200
රන්දෙනිය	2980
මහයාය	3000
පලෙයි	5517
කොරෙයි	2350
බෝපිටිය	2200
පාසිකුඩා	1400
මුන්දලම	50
එකතුව	**27097**

2.1.15 කප්තුරුපාය අලෙවිසැල් ව්‍යාපෘතිය

පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිෂ්පාදනය කරනු ලබන බෝග, ද්‍රව්‍ය හා පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම මූලික අරමුණු කරගෙන කප්තුරුපාය වෙළඳසැල් ආරම්භ විය. අවම මිල ගණන් මත ඉහළ ගුණාත්මක තත්වයේ පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම කප්තුරුපාය අලෙවිසැල් තුල සිදු කරයි.



රූපය 2.34 **පාසිකුඩා ආදර්ශ පොල් උයනේ පොල් ආශීත නිෂ්පාදිත**

2.1.16 සංචාරක නිවාස ව්‍යාපෘතිය



රූපය 2.35 **පළෙයි සංචාරක නිවාසය**

වගු අංක 2.25 සංචාරක නිවාසවල දිනකට අයකරන ලද ගාස්තුව - 2020

සංචාරක නිවාසය	ඒකකයක දිනකට ගාස්තුව (රු.)			ලිපිනය
	වායුසමනය කල කාමරය	වායුසමනය නොකල කාමරය	සම්පූර්ණ නිවාසයම	
පාසිකුඩා සංචාරක නිවාස අංක 01	3000.00	2000.00	10000.00	පාසිකුඩා ආදර්ශ පොල් උයන, පාසිකුඩා , කල්කුඩා
පාසිකුඩා සංචාරක නිවාස අංක 02	3000.00	2000.00	10000.00	
පාසිකුඩා සංචාරක නිවාස අංක 03	3000.00	2000.00	10000.00	
පාසිකුඩා සංචාරක නිවාස අංක 04	-	3000.00	15000.00	
පලෙයි සංචාරක නිවාස	2500.00	1500.00	8000.00	පලෙයි ආදර්ශ පොල් උයන, නුවර පාර,පලෙයි
බෝපිටිය සංචාරක නිවාස	-	1500.00	6000.00	බෝපිටිය ආදර්ශ පොල් උයන, කු/බෝපිටිය

කොහොඹාන සංචාරක නිවාස	-	1500.00	3000.00	කොහොඹාන ආදර්ශ පොල් උයන, ගොනාගොල්ල, කොහොඹාන
හඳපානාගල සංචාරක නිවාස	-	200.00	1500.00	හඳපානාගල පොල් පැල තවාන, හඳපානාගල, වෙහෙරයාය
කටුකැලියාව සංචාරක නිවාස	2500.00	1500.00	8000.00	මහිලා මාවත, කටුකැලියාව, අනුරාධපුරය
කතරගම සංචාරක නිවාස	3000.00	-	15000.00	කොකෝවිලා සංචාරක නිවාසය, පොල් වගාකිරීමේ මණ්ඩලය, ඩිපෝව පාර, කතරගම
කුඹුරුපිඩ්ඩි සංචාරක නිවාසය	3000.00	-	12000.00	කුඹුරුපිඩ්ඩි පොල් පැල තවාන, කුඹුරුපිඩ්ඩි, ත්‍රිකුණාමලය
පුලතිසි කොකෝවිලා	3000.00	-	18000.00	සංචාරක නිවාසය, පොල් වගාකිරීමේ මණ්ඩලය, කලහගල පාර, නව නගරය, පොළොන්නරුව.

2.2 තවාන් අංශය

2.2.1 පොල් පැළ නිෂ්පාදන සහ පැළ නිකුත් කිරීමේ වැඩසටහන

දිවයිනේ වගාකිරීමට අවශ්‍ය උසස් තත්වයේ පොල් පැළ නිෂ්පාදනය කර වගාකරුවනට සැපයීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ සැලසුම්වලට අනුව වර්ෂයේ පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් තවාන් වෙත සැපයීමට සැලසුම් කිරීම, මෙහෙයවීම හා සම්බන්ධීකරණය, පැළ නිෂ්පාදනය ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මගින් සිදුකෙරේ. පොල් පැළ නිෂ්පාදන කාර්යය සඳහා ප්‍රාදේශීය කාර්යාල, තවාන්, ආදර්ශ පොල් උයන් හා මීගමුව බීජ පොල් ඒකකය ප්‍රධාන වශයෙන් දායකවේ.

ප්‍රාදේශීය කළමණාකරුවන්ගේ මඟ පෙන්වීම හා නේවාසික තවාන් භාරකරුගේ සෘජු අධීක්ෂණය යටතේ පොල් පැළ නිෂ්පාදනය ප්‍රධාන කාර්යය කරගත් පොල් පැළ තවාන් 39ක් මඟින් හා ආදර්ශ පොල් උයන් කළමණාකරුගේ සෘජු අධීක්ෂණය හා මඟ පෙන්වීම යටතේ ආදර්ශ පොල් උයන් තුල ස්ථාපිත පොල් පැළ තවාන් 12 ක් මඟින් වගාකරුවන්ට අවශ්‍යඋසස් තත්වයේ ගුණාත්මක පොල් පැළ නිෂ්පාදනය කෙරේ.

පොල් වගාකරුවන්ට පහසුවෙන් පොල් පැළ සැපයීමේ අරමුණින් මණ්ඩලයේ පොල් පැළ තවාන් දිවයින පුරා ස්ථාපිත කර ඇති අතර, ඉන් වැඩි ප්‍රමාණයක් පොල් වගාව බහුල ලෙස ව්‍යාප්තව ඇති වයඹ පලාත තුල පවතී. ප්‍රාදේශීය පොල් තවාන්වල කටයුතු ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල මඟින් පාලනය හා නඩත්තුව සිදු කරනු ලබයි. පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් 2020වර්ෂයේදී පොල් පැළ නිෂ්පාදනය කරන ලද ආකාරය පහතින් දක්වා ඇත.

2.2.2. 2020 වර්ෂයේ පොල් පැළ ඉලක්කයන්

2020 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ කළමණාකාරීත්වය මඟින් පොල් පැළ 1.8ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කරන ලදී.

2.2.3. පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් පැළ තවාන් මඟින් නිෂ්පාදනය කර 2020 වසර තුල නිකුත් කරන ලද පොල් පැළ ප්‍රමාණයන්

2020 වසර තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය යටතේ පාලනය වන දිවයින පුරා ව්‍යාප්තව පවතින පොල් පැළ තවාන් මඟින්, ජානමය උසස් පොල් පැළනිෂ්පාදනය කර **පැළ මිලියන 2.41 ක් මුදලට සහ සහනාධාර ක්‍රමය යටතේ** පොල් වගාකරුවන් වෙත ලබා දී ඇත.

2020 වර්ෂයට අදාලව පොල් පැළ මිලියන 1.8 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කළ අතර, ඒ අනුව 2020 වර්ෂයට අවශ්‍ය පොල් පැළ ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත සපයා ඇති සමස්ත බීජ පොල් ප්‍රමාණය 2,189,904 කි. 2020 යල කන්නයේ පැළ ලබා ගැනීම සඳහා 1,421,740 ක් ද 2020 මහ කන්නයේ පැළ ලබා ගැනීම සඳහා 768,164 ක් ද ලෙස තවාන් සහ ආදර්ශ පොල් උයන් වෙත බීජ පොල් සපයා ඇත. මේ අනුව 2020 වසර තුළ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශයෙන් **පොල් පැළ මිලියන 2.41ක්**, (2019 වසරේ ඉතිරි වූ පොල් පැළ ද සමඟ) වගා කරුවන් වෙත ලබා දී ඇත.



රූපය 2.36 එරමිණිගොල්ල තවානේ නිෂ්පාදනය කරන ලද උසස් තත්වයේ බඳුන් පොල් පැළ



රූපය 2.37 පොල්ගහවෙල තවානේ නිෂ්පාදනය කරන ලද බිම් පොල් පැළ

වගුඅංක2.26 ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන් සහ ආදර්ශ පොල් උයන් හා එහි නිෂ්පාදිත පැළ ප්‍රමාණයන්

	තවාන අයත් වන ප්‍රාදේශීය කාර්යාලය	*තවානේ නම*	බිම් පැළ	බදුන් පැළ	මුළු පැළ
1	අනුරාධපුර	කළාවැව	31,380	35,974	67,354
2	අම්පාර	උහන	38,499	40,520	79,019
3	ගාල්ල	ලබුදුව	0	13,317	13,317
		බද්දේගම	34,315	16,356	50,671
4	ගම්පහ	කිරිඳිවැල	29,924	16,259	46,183
		මහයාය	21,175	33,066	54,241
		වල්පිට	22,052	33,316	55,368
5	හම්බන්තොට	මයුරපුර	23,844	10,143	33,987
		මැදමුලන	47,288	20,916	68,204
6	යාපනය	අලම්පිල්	30,580	0	30,580
		අව්වුවේලි	24,282	0	24,282
		කිළිනොච්චි	15,405	530	15,935
		දේවිපුරම්	48,567	3,077	51,644
7	කළුතර	කොරොස්දුව	25,105	44,775	69,880
8	කෑගල්ල	එරමිණිගොල්ල	21,200	21,652	42,852
		පොල්ගහවෙල	14,487	34,689	49,176
		මත්තමගොඩ	23,219	23,479	46,698
9	කුළියාපිටිය	බින්ගිරිය	31,157	17,363	48,520
		දියදොර	20,497	28,707	49,204
		හෙට්ටිපොළ	38,252	4,960	43,212
		කන්දෙටිය	47,303	13,298	60,601
10	කුරුණෑගල	ඉබ්බාගමුව	29,714	66,586	96,300
		වාරියපොළ	38,260	18,917	57,177
		නිකවැරටිය	54,791	29,054	83,845
		වෙන්නොරුව	31,878	40,496	72,374
11	මඩකළපුව	මයිලම්බාවැළි	24,939	27,822	52,761

12	මාරවිල	අට්ටවිල්ලුව	64,588	22,803	87,391
		කිරිමැටියාන	50,066	25,110	75,176
		විල්පොත	76,823	17,591	94,414
13	මාතලේ	දොඩන්ගස්ලන්ද	23,045	35,906	58,951
		පල්ලෙකැලේ	4,245	41,500	45,745
14	මොණරාගල	හඳපානගල	18,728	21,044	39,772
		වැලිපිටිය	33,098	20,691	53,789
15	පොලොන්නරුව	පරාක්‍රමසමුද්‍රය	22,440	26,855	49,295
		උල්හිටිය	14,905	21,084	35,989
16	රත්නපුර	ඇඹිලිපිටිය	46,093	40,124	86,217
17	ත්‍රිකුණාමළය	කුඹුරුපිඩ්ඩි	35,991	21,603	57,594
		සේරුවිල	21,252	6,972	28,224
18	වවුනියා	මඩු	30,012	680	30,692
මුළු පැළ පැළ නිකුත්කිරීම (තවාන්)			**1,209,399**	**897,235**	**2,106,634**
	ආදර්ශ පොල් උයනේ නම		**මුළු බිම්**	**මුළු බඳුන්**	**මුළු පැළ**
1	ලේනව		1,942	22,183	24,125
2	ඩෙසිවැලි		24,337	16,474	40,811
3	ගර්ටිලන්ඩ්		38,961	8,011	46,972
4	නාගන්සෝල		18,724	3,134	21,858
5	රන්දෙනිය		-	16,998	16,998
6	මහයාය		3,248	21,443	24,691
7	පලෙයි		5,950	19,621	25,571
8	කොරෙයි		4,091	6,978	11,069
9	බෝපිටිය		15,302	20,557	35,859
10	පාසිකුඩා		9,796	16,589	26,385
11	කොහොඹාන		5,270	15,805	21,075
12	මුන්දලම		2,210	6,914	9,124
මුළු පැළ නිකුත් කිරීම (ආදර්ශ පොල් උයන්)			**129,831**	**174,707**	**304,538**
මුළු පැළනිකුත් කිරීම(ආ.පො.උ. සහ තවාන්)			**1,339,230**	**1,071,942**	**2,411,172**

පොල් පැළයක නිෂ්පාදන වියදම

බඳුන් පැළයක නිෂ්පාදන වියදම - රු. 312.92
බිම් පැළයක නිෂ්පාදන වියදම - රු. 246.83

2.2.4 2020 වසර තුල තවාන් සංවර්ධන අංශයේ ක්‍රියාත්මක කර ඇති විශේෂිත වූ වැඩසටහන්

- පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහනට සමගාමීව එරමිනිගොල්ල තවාන් භූමියේ ප්‍රයෝජනයට ගත නොහැකි අක්කර ½ ක පමණ භූමියක කුඹුරක් සකසා බිත්තර වී නිෂ්පාදනයට යොදා ගැනීම.
- එරමිණිගොල්ල තවානේ 2020 වර්ෂයේ බිත්තර වී අස්වැන්න නෙලීම සඳහා රන් අස්වනු මංගල්‍යය වැඩසටහන පැවැත්වීම.
- කප්රුකට සවියක් නමින් එරමිණිගොල්ල තවානේ පවත්වන ලද ගම්දොර උදානය නම් වූ ක්ෂේත්‍ර වැඩසටහන මඟින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් මඟින් සිදුකරනු ලබන කාර්යයන් පිළබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීම.
- 2020.09.08 වන දින ජාත්‍යන්තර පොල් දින සැමරුම් උළෙල පරාක්‍රම සමුද්‍රය තවානේ උත්සවාකාරයෙන් පැවැත්වීම.



රූපය 2.38 එරමිනිගොල්ල තවානේ බිත්තරවී වගා කිරීම



රූපය 2.39 පොල්ගහවෙල තවානේ ඉඟුරු වගා කිරීම

- **කොන්ක්‍රීට් තවාන් පාත්ති සැකසීම**





රූපය 2.40 දියදොර තවානේ ඉදිකරන ලද කොන්ක්‍රීට් තවාන් පාත්ති තවාන් පාත්ති සහ ඇඹිලිපිටිය තවානේ ඉදිකරන ලද කොන්ක්‍රීට් තවාන් පාත්ති

2016 වසරේ පරීක්ෂණයක් මඟින්ඉතා සාර්ථක ක්‍රමයක් ලෙස හඳුනාගත් කොන්ක්‍රීට් තවාන් පාත්ති වල පැලවීමේ ප්‍රතිශතය 80% කි. 2020 වසරේ දියදොර තවානේ කොන්ක්‍රීට් තවාන් පාත්ති 03 ක්, ඇඹිලිපිටිය තවානේ කොන්ක්‍රීට් තවාන් පාත්ති 01 ක් ස්ථාපිත කිරීම. මෙම තවාන් පාත්ති ක්‍රමය මඟින් බඳුන් මිශ්‍රණ වලට වැය වන මුදල අවම කර ගත හැකි අතර, අවශ්‍ය වන ජල ප්‍රමාණයද අඩුය.

- **කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කරන ලද තවාන්**

බඳුන් පොල් පැළ නිෂ්පාදනයේදී බඳුන් මාධ්‍ය, පවතින වගාවන් වලට කාබනික පොහොර ලබා ගැනීමට සහ රසායනික පොහොර සඳහා වැයවන මුදල අවම කර ගැනීමේ අරමුණින් උහන, මහයාය, පරාක්‍රමසමුද්‍රය යන තවාන් වල කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කරන ලදි.

- **බඳුන් පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බඳුන් මාධ්‍ය තවාන් තුලම නිපදවා ගැනීම**

හෙට්ටිපොල සහ ඇඹිලිපිටිය තවාන්වලට ලබා දී ඇති මල්ටි චොපර් යන්ත්‍ර භාවිතා කරමින්පොල් ලෙලි කැබලි වලට කපා බඳුන් පැළ නිපදවීම සඳහා බඳුන් මාධ්‍ය ලෙස යොදාගැනීම මඟින් බඳුන් මාධ්‍ය සඳහා වැයවන වියදම අවම කර ඇත.



රූපය 2.41 ඇඹිලිපිටිය තවානේ ඇති මල්ටිචොපර් යන්ත්‍රය මඟින් පොල්ලෙලි කැබලි කිරීම

- **නව ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම**

කුඹුරුපිඬිඩි තවානේ සිටුවා ඇති කහ කුන්දිරා වගාව සඳහා නල ජල සම්පාදන පද්ධතියක් සවි කිරීම.

- **පතස් ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම**

වර්ෂා කාලයේදී ක්ෂේත්‍රයට පතිත වන ජලය වගා භූමියෙන් පිටතට ගලා යානොදී වගා භූමිය තුලම රඳවා ගැනීම සහ වියළි කාලවලදී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ජලය ගබඩා කර ගැනීම සඳහා පතස් උපයෝගී කරගනී.

- උහන තවානේ පවතින පතස වැඩි ජලධාරිතාවක් රඳවා ගතහැකි පරිදි ගැඹුරු කර විශාල කිරීම.

- **පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

ව්‍යාප්ති අංශය මඟින් පැවැත්වෙන පුහුණු වැඩසටහන් වලට සහයෝගය දැක්වීම පිණිස පහත දැක්වෙන තවාන් වල ක්ෂේත්‍ර වැඩ සටහන් පවත්වන ලදි.



රූපය 2.42පොල්ගහවෙල තවානේ පවත්වන ලද පුහුණු වැඩසටහන

<u>පරාක්‍රමසමුද්‍රය තවානේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීමට සකස් කරන ලද ක්ෂේත්‍ර ආදර්ශණ</u>





රූපය 2.43 පරාක්‍රමසමුද්‍රය තවානේ පවත්වන ලද ශ්‍රමික බලකා පුහුණු වැඩසටහන සඳහා සකසන ලද ක්ෂේත්‍ර ආදර්ශණ

දියදොර තවාන

- කෘෂිකර්ම ඩිප්ලෝමා ධාරිනියකට ක්ෂේත්‍ර සහ කාර්යාලයීය කටයුතු සඳහා ප්‍රායෝගික පුහුණුව මාස 06 කට අධික කාලයක් ලබා දීම.

පොල්ගහවෙල තවාන

- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායේ පුහුණු වන පුහුණු ලාභීන් හට එක් දින පුහුණු වැඩසටහන.

උහන තවාන

- පොල් වගාකරුවන් සඳහා පොල් පැළ තවාන් පාලනය, පැළ සිටුවීම, පොහොර යෙදීම, රෝග හා පළිහෝධ හානි අවම කර ගැනීම සඳහා පවත්වන ලද ප්‍රායෝගික පුහුණුව.

මහයාය තවාන

- පේරාදෙනිය විශ්ව විද්‍යාල සිසුන් සඳහා පොල් පැළ තවාන් පාලනය පිලිබඳ පවත්වන ලද ප්‍රායෝගික පුහුණු වැඩසටහන.

හදපානගල තවාන

- වගාකරුවන් දැනුවත් කිරීම සඳහා පොල් පැළ තවාන් පාලනය සහ පොල් වගාව පිළිබඳව පවත්වන ලද ප්‍රායෝගික පුහුණු වැඩසටහන.

පරාක්‍රම සමුද්‍රය තවාන

- ශ්‍රමික බලකාය සඳහා පොල් පැළයක් සිටුවීම, තෙතමන සංරක්ෂණ ක්‍රම, පොහොර යෙදීම ආදිය පිළිබඳව පවත්වන ලද ප්‍රායෝගික පුහුණුව.

ඇඹිලිපිටිය තවාන

- රත්නපුර කරපිංච කෘෂිකර්ම විද්‍යාලයේ ඩිප්ලෝමාධාරීන් සඳහා බීජ පොල් තවාන් කිරීම හා නඩත්තුව පිළිබඳ පවත්වන ලද ප්‍රායෝගික පුහුණුව.

2.2.5. පළතුරු, අපනයන කෘෂිකර්ම භෝග පැළ නිෂ්පාදනය සහ අතුරු බෝග වගාවේ ප්‍රගතිය

2.2.5.1 අතුරු භෝග වගා කිරීම -2020

භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ අරමුණින් තවාන් වල අතුරු භෝග වගා කිරීම ආරම්භ කර ඇත.

වගු අංක 2.27 පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන්වල අතුරු බෝග වගාව

අ/අ	තවානේ නම	අතුරුබෝගයේ නම	වගා කරන ලද අක්කර ප්‍රමාණය		
			අක්කර	පඳුරු / පැළ	කි.ග්‍රෑම්
1	දියදොර	මඤ්ඤොක්කා	1/4	700	
		වී			3
2	හෙට්ටිපොළ	මඤ්ඤොක්කා	1/4	700	
3	කන්දෙටිය	මඤ්ඤොක්කා		400	
4	බිංගිරිය	මඤ්ඤොක්කා	1/4	800	
5	උහන	කව්පි			30.2
		කෙසෙල්		84	
		පැණිදොඩම්		100	
		මඤ්ඤොක්කා		500	
		අන්නාසි		600	
6		ඇපල් පේර	4 1/2	1,350	

	අට්ටවිල්ලුව	දොඩම් පැළ		300	
		බද්ධ කපු	2	60	
7	මයිලම්බාවැලි	බද්ධ කපු		211	
8	කලාවැව	මඤ්ඤොක්කා		120	
		කෙසෙල්		15	
9	පොල්ගහවෙල	කෙසෙල්		50	
		ඉඟුරු			100
		රට පුවක්		200	
10	එරමිණිගොල්ල	කෙසෙල්		100	
		වී	1/2		
		ඉඟුරු			75
		කහ			10
11	මත්තමගොඩ	කුරුඳු		3,600	
		පුවක්		500	
		ගම්මිරිස්		500	
		මඤ්ඤොක්කා		250	
12	වැලිපිටිය	කෙසෙල්		300	
		ගම්මිරිස්		1,400	
		මඤ්ඤොක්කා		1,500	
13	හඳපානගල	පැණිදොඩම්		300	
		ගම්මිරිස්		500	
		මඤ්ඤොක්කා		200	
14	වල්පිට	මඤ්ඤොක්කා		500	
		කෙසෙල්		100	
15	කිරිදිවැල	මඤ්ඤොක්කා		950	
16	මයුරපුර	කෙසෙල්	1	450	
		දෙළුම්	1/2	150	
17		කෙසෙල්	100		

	දොඩම්ගස්ලන්ද	ගම්මිරිස්	200		
		මඤ්ඤොක්කා	100		
18	පල්ලෙකැලේ	කෙසෙල්	1/4	170	
		කහ	1/4	150	
		මඤ්ඤොක්කා		100	
19	පරා.සමුද්‍රය	අඹ (tjc)		120	
		පුවක්		300	
		කිරි අල		100	
		ඉඟුරු			80
		ලෙමන්		100	
		බඩඉරිඟු	1		
		මඤ්ඤොක්කා		50	
20	බද්දෙගම	කුරුඳු		500	
21	වෙන්නොරුව	කෙසෙල්		100	
		පුවක්		400	
		බුලත්		30	
22	ඉබ්බාගමුව	අඹ (tjc)	1/2	68	
		කෙසෙල්	1	300	
		මඤ්ඤොක්කා	1/4	200	
		ගම්මිරිස්	1	400	
23	වාරියපොල	පුවක්		100	
		කුරුඳු		2,000	
		කෙසෙල්		100	
		උඳු			3
24	නිකවැරටිය	පේර		25	
		රටකජු			4
		උඳු			3
25	කොරොස්දූව	කෙසෙල්	1/4	100	

26	මඩු	කව්පි	1/4		
		මඤ්ඤොක්කා	1/2		
		බෝංචි	1/4		
		පැණිකොමඩු	1/4		
		මිරිස්	1/4		
		වම්බටු	1/4		

2.2.5.2 පළතුරු සහ අපනයන කෘෂිකර්ම භෝග පැළනිෂ්පාදන ප්‍රගතිය - 2020




රූපය 2.44 අලෙවි කිරීම සඳහා පොල්ගහවෙල තවානේ ගම්මිරිස් පැළ නිපදවීම හා අලෙවි කිරීම සඳහා පොල්ගහවෙල තවානේ කටු අනෝදා පැළ නිපදවීම

වගුඅංක2.28 පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන්වල පළතුරු සහ අපනයන කෘෂිකර්ම භෝග පැළනිෂ්පාදන ප්‍රගතිය - 2020

තවානේ නම	පැළ වර්ගය									
	බද්ධ අඹ	දෙනි (බීජ)	කටු අනෝදා	ගම්මිරිස්	කුරුඳු	ඩ්‍රැගන් පෲට්	බීජ කහ (Kg)	කි ලෝ පේර	ලෙමන්ලේයර්	රඹුටන්
අම්පාර	55	500								
කලාවැව	170	158								
පොල්ගහවෙල		500	300	8,000						
දොඩම්ගස්ලන්ද				2,000						
මැදමුලන				343	10,000	105				
බද්දේගම					26,000		340			
වෙන්නොරුව			300							

ඉඹ්බාගමුව		500		8,000				400	70	
වාරියපොල		1,000	200							
නිකවැරටිය		250								
කොරොස්දූව					20,000					
වල්පිට				1,000						500
කිරිඳිවැල				2,000						
මුලු පැළ ගණන	**225**	**2,908**	**800**	**21,343**	**56,000**	**105**	**340**	**400**	**70**	**500**

2.3. <u>මීගමුව - බීජ නිෂ්පාදන ඒකකය</u>

දිවයින පුරා වගා කිරීම සඳහා උසස් නිෂ්පාදන හැකියාවෙන් යුත්, උසස් තත්ත්වයේ පොල් පැළ වගාකරුවන් වෙත ලබා දීමේ අරමුණින් පොල් පර්යේෂණ ආයතනයේ අධීක්ෂණය සහිතව උසස් මව් ශාක තෝරා ලබාගන්නා බීජ පොල් සියලුම තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත ප්‍රවාහනය කර සැපයීම ප්‍රධාන කාර්ය වේ.

එයට අමතරව වාර්ෂික බීජ පොල් අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීමට දායකත්වය ලබා දී එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, පොල් වගාකරුවන්ට අවශ්‍ය යෙදවුම් හා සැපයුම් සේවාවන් සඳහා පහසුකම් සැපයීම හා මෙහෙයවීමත් මෙම ඒකකය සතු අනෙකුත් කාර්යයන් වේ. මෙම සියලු කටයුතු සිදු කරනු ලබන්නේ බීජ නිෂ්පාදන ඒකකය විසින් වන අතර, ඒ සඳහා එම ඒකකය සතුව අවශ්‍ය යටිතල පහසුකම් සහ පළපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක්ද අනුයුක්තව සිටී.

ඒ ඒ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලද පොල් වගාකිරීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය වූ පොල් පැළ ප්‍රමාණය ප්‍රාදේශීය කාර්යාල අනුව විවිධ වන අතර, ප්‍රදේශයේ වගාකරුවන්ගේ පොල් පැළ ඉල්ලීමද සලකා බැලූවිට ප්‍රාදේශීය කාර්යාලවල පොල් පැළ අවශ්‍යතාව එකිනෙකට වෙනස්වේ. වාර්ෂිකව තම ප්‍රදේශයේ පොල් පැළ අවශ්‍යතාවය ප්‍රාදේශීය කළමණාකරුවන් විසින් ප්‍රධාන කාර්යාලයට දැනුම් දෙනු ලබන අතර, ප්‍රාදේශීය කාර්යාලවල පොල් පැළ අවශ්‍යතාව හා තවානේ බීජ පොල් ධාරිතාවය, මානව සම්පත් සුලභතාවය හා යටිතල පහසුකම් පවතින ප්‍රමාණය ද සලකා බලා ප්‍රධාන කාර්යාලයෙන් සකස් කරනු ලබන සැලැස්මක් අනුව තවාන් වෙත බීජ පොල් සැපයීම මීගමුව බීජ පොල් ඒකකය මඟින් සිදු කෙරේ.

2020වසරේ යල සහ මහ කන්න තුල මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත සපයා ඇති සමස්ත බීජ පොල් ප්‍රමාණය 1,724,979කි. එම බීජ පොල් ප්‍රමාණයෙන් 2020මහ කන්නයේ පැළ ලබා ගැනීම සඳහා සපයා ඇති බීජ පොල් ප්‍රමාණය 760,346ක් වන අතර, 2021යල කන්නයේ පැළ ලබා ගැනීම සඳහා බීජ පොල් 964,633ක් සපයා ඇත.

වගු අංක 2.29 2020 වර්ෂය තුළ තවාන් සහ ආදර්ශ පොල් උයන් වෙත ලබා දුන් බීජ පොල් ප්‍රමාණයන්

	තවාන අයත් වන ප්‍රාදේශීය කාර්යාලය	*තවානේ නම*	**2020 වර්ෂය සඳහා ලබාදුන් බීජ පොල් ප්‍රමාණය**	**මුළු බීජ පොල් ප්‍රමාණය (2020.01.01-2020.12.31)**	
			2020.01.01-2020.06.30	**2020.7.01-2020.12.31**	
1	අනුරාධපුර	කළාවැව	15,440	47,270	62,710
2	අම්පාර	උහන	27,195	37,144	64,339
3	ගාල්ල	ලබුදුව	9,877	10,500	20,377
		බද්දේගම	30,400	37,600	68,000
4	ගම්පහ	කිරිඳිවැල	14,000	19,804	33,804
		වල්පිට	20,561	22,910	43,471
5	හම්බන්තොට	මයුරපුර	4,000	15,200	19,200
		මැදමුලන	30,200	33,350	63,550
6	යාපනය	අලම්පිල්	-	10,000	10,000
		අච්චුවේලි	18,300	16,500	34,800
		කිළිනොච්චි	10,750	8,250	19,000
		දේවිපුරම්	7,405	19,250	26,655
7	කළුතර	කොරොස්දුව	20,200	21,800	42,000
8	කෑගල්ල	එරමිණිගොල්ල	15,630	14,500	30,130
		පොල්ගහවෙල	17,955	16,075	34,030
		මත්තමගොඩ	24,361	19,650	44,011
9	කුළියාපිටිය	බින්ගිරිය	31,837	13,500	45,337
		දියදොර	19,500	5,850	25,350
		හෙට්ටිපොළ	33,166	10,000	43,166
		කන්දෙටිය	25,999	6,000	31,999
10	කුරුණෑගල	ඉබ්බාගමුව	46,957	26,250	73,207
		වාරියපොළ	11,000	11,043	22,043
		නිකවැරටිය	27,185	17,810	44,995
		වෙන්නොරුව	24,850	25,500	50,350
11	මඩකළපුව	මයිලම්බාවැළි	10,640	23,280	33,920
12	මාරවිල	අට්ටවිල්ලුව	26,107	16,250	42,357
		කිරිමැටියාන	37,586	36,290	73,876
		විල්පොත	20,231	32,682	52,913
13	මාතලේ	දොඩන්ගස්ලන්ද	25,285	22,102	47,387
		පල්ලෙකැලේ	8,550	12,150	20,700
14	මොණරාගල	හඳපානගල	28,814	16,000	44,814
		වැලිපිටිය	21,075	40,948	62,023
15	පොලොන්නරුව	පරාක්‍රමසමුද්‍රය	17,080	29,440	46,520
		උල්හිටිය	2,955	16,250	19,205
16	රත්නපුර	ඇඹිලිපිටිය	17,600	22,940	40,540
17	ත්‍රිකුණාමළය	කුඹුරුපිඩ්ඩි	14,750	17,750	32,500
		සේරුවිල	5,800	5,500	11,300

18	වවුනියා	මඩු	11,250	12,900	24,150
		මහයාය	21,698	9,860	31,558
උපඑකතුව (තවාන්)			**756,189**	**780,098**	**1,536,287**

	ආදර්ශ පොල් උයනේ නම	**2020.01.01-2020.06.30**	**2020.7.01-2020.12.31**	**මුළු බීජ පොල් ප්‍රමාණය (2020.01.01-2020.12.31)**
1	ලේනව ආදර්ශ පොල් උයන	142	26,219	26,361
2	ඩෙසිවැලි ආදර්ශ පොල් උයන	-	25,295	25,295
3	ගර්ටිලන්ඩ් ආදර්ශ පොල් උයන	-	12,486	12,486
4	නාගන්සෝල ආදර්ශ පොල් උයන	-	28,000	28,000
5	රන්දෙනිය ආදර්ශ පොල් උයන	-	11,200	11,200
6	මහයාය ආදර්ශ පොල් උයන	-	12,460	12,460
7	පලෙයි ආදර්ශ පොල් උයන	-	10,200	10,200
8	කොරෙයි ආදර්ශ පොල් උයන	1,875	6371	8,246
9	බෝපිටිය ආදර්ශ පොල් උයන	-	13500	13,500
10	පාසිකුඩා ආදර්ශ පොල් උයන	2,140	25000	27,140
11	කොහොඹාන ආදර්ශ පොල් උයන	-	7004	7,004
12	මුන්දලම ආදර්ශ පොල් උයන	-	6800	6,800
උප එකතුව (ආ.පො.උ)		**4,157**	**184,535**	**188,692**
2020 වර්ෂය තුල තවාන් සහ ආදර්ශ පොල් උයන් වෙත ලබාදුන් මුළු බීජ පොල් ප්‍රමාණය		**760,346**	**964,633**	**1,724,979**

3.0 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය

2020 වර්ෂය තුලදී ජයන්ත වික්‍රමසිංහ මහතා පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. මෙම වර්ෂය තුලදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 08ක් පවත්වා ඇත.

2020.01.01 දින සිට 2020.01.22 දින දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) ආර්.ඒ.ඩී.ඒස්.රණතුංගමහතාද, 2020.01.23 සිට 2020.11.04 දින දක්වා එම අමාත්‍යාංශයේම අධ්‍යක්ෂ එම්.ජේ.එස්.රවිසිංහමහතාද සාමාන්‍යාධිකාරී තනතුරේ වැඩබැලීමේ කටයුතු කළ අතර, 2020.11.05 වන දින කේ.එල්.මානෙල් කුලරත්න මහත්මිය සාමාන්‍යාධිකාරී තනතුරේ නව පත්වීම් ලබාගන්නා ලදී.

3.1 කාර්ය මණ්ඩල ව්‍යුහය

2020 වර්ෂය තුලදී මණ්ඩලයේ ඉලක්ක සපුරාගැනීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය දායක වී ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාර	02
කළමනාකාර	36
කනිෂ්ඨ කළමනාකාර	44
ක්‍රියාත්මක කිරීමේ/ උපදේශණ සේවා	0
කළමනාකරණ සහකාර (තාක්ෂණ)	249
කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	208
ප්‍රාථමික ශ්‍රේණිය(අර්ධ ශිල්පීය)	01
ප්‍රාථමික ශ්‍රේණිය(ශිල්පීය)	42
ප්‍රාථමික ශ්‍රේණිය(ශිල්පීය නොවන)	81
දැනට තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවතින තනතුරු	04
වතුපාලන සේවයේ සේවකයින් (ස්ථීර)	101
කොන්ත්‍රාත්	01
චෙක්රෝල්	829
එකතුව	**1598**

3.2 බඳවා ගැනීම්

2020පැවති ජනාධිපතිවරණය හා මහ මැතිවරණය හේතුවෙන් මුදල් අමාත්‍යාංශයේ 2019.11.20 දිනැති ලිපිය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක-01/2020 චක්‍රලේඛය, මැතිවරණ කොමිෂන් සභාවේ 2020.06.22 දිනැති ලිපි හා චක්‍රලේඛ මඟින් සියලුමබඳවාගැනීම් අත්හිටුවා ඇති

අතර, විධිමත් පරිදි බඳවාගැනීම් කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත්තේ මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක-02/2020 හා 2020.10.26 දිනැති ලිපිය මඟිනි. ඒ අනුව මෙම වර්ෂයේදී කිසිදු බඳවාගැනීමක් සිදු නොකළ අතර, අදාල බඳවාගැනීම් කටයුතු සිදුකිරීම සඳහා මූලික පියවර පමණක් ගෙන ඇත.

3.3 දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්

2020 වර්ෂයේදී මණ්ඩලයේ විවිධ අංශ වල සේවයේ නියුතු නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දේශීය වශයෙන් පවත්වන ලද විවිධ සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු සහ උපාධි පාඨමාලා සඳහා 31 දෙනෙකු බාහිර ආයතන වෙත යොමුකර පුහුණු අවස්ථා සලසා දී ඇත. එසේම අන්තර්ජාලය හරහා දුරස්ථ පාඨමාලා (ZOOM) හැදෑරීමේ අවස්ථාවන් සලසා දීමටද කටයුතු කරන ලදී. තවද මණ්ඩලයේ අනුග්‍රහය යටතේ විවිධ සම්පත් දායකත්වයන් තුලින් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සමඟ එක්ව නිලධාරීන් 84ක් දේශීය පුහුණු පාඨමාලා/වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා යොමුකල අතර රට තුළ සහ ගෝලීය වශයෙන් පැවති COVID -19වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් විදේශ පුහුණු අවස්ථාවන් සලසා දීමට අවස්ථාවක් නොලැබී ඇත.

වගු අංක 3.1 2020 වර්ෂයේ දේශීය පුහුණු ප්‍රගතිය

සාමූහික දේශීය පුහුණු සැසිවාරයන්	පුහුණුලාභීන් සංඛ්‍යාව
1. විනය කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් මණ්ඩලයේ කණිෂ්ඨ කළමනාකරණ සහ ඉන් ඉහළ සේවා ගණයන්හි නිළධාරීන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය.	35
2. පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව	49
එකතුව	**84**

3.4 ඵලදායිතාවය ප්‍රවර්ධනය

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් මෙහෙයවනු ලබන 2020 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ලියාපදිංචි වී ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.





රූපය 3.1 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය

3.5 මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය ස්ථාපනය

මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය ස්ථාපනය සඳහා වූ මූලික ක්‍රියාවලිය සහ ඒ සඳහා මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය යන ක්‍රියාවලීන් අවසන් කරමින් අවසන් මට්ටමට ප්‍රවේශ වීම.

3.6 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

මණ්ඩලයේ හා වතු පාලන සේවාවේ සේවයේ නියුතු නිලධාරීන් 213ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත පවරන ලදී. ඒ අනුව කෝරෝනා වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද එයින් 90% ගේ කඩඉම් විභාගයන් පවත්වා අවසන් කරගැනීමට හැකි විය.

3.7 විශ්‍රාම ලබාගැනීම්

මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා තම හැකියාවන් හා දක්ෂතාවයන් කැපකරමින් කාර්යක්ෂමව මනා සේවාවක් ඉටුකර වයස අවු:60 සම්පූර්ණ වීම නිසා නිලධාරීන්/ සේවකයින් 16 දෙනෙකු මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම නිලධාරීන්/ සේවකයන් හට හිමිවිය යුතු පාරිතෝෂික සහ අනෙකුත් ප්‍රතිලාභයන් නියමිත කාලයන්තුලදී නොපමාව ඔවුන් වෙත ලබාදීමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය අදාල පියවර ගන්නා ලදී.

3.8 ප්‍රවාහන සංචිතය

2020 වර්ෂයේ ක්‍රියාත්මකවූ ප්‍රවාහන සංචිතය පහත පරිදිවේ.

ලොරිරථ	17
ඩබල්කැබ්	44
ට්‍රැක්ටර් (රෝද 02)	26
ට්‍රැක්ටර් (රෝද 04)	50
ට්‍රැක්ටර්ටෙලර්	90
වෑන්රථ	1
බස්රථ	3
ජීප්රථ	4
මෝටර්රථ	3
ත්‍රී රෝද රථ	1
යතුරුපැදි	60
බැකෝයන්ත්‍ර	2
එකතුව	**301**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සංවර්ධන කාර්යයන් සපුරාගැනීම සඳහා ඉහත සඳහන් ප්‍රවාහන සංචිත සතු සම්පත් අඩු පිරිවැයකින් යොදවා ගැනීමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය කටයුතු කරඇත.

එසේම ප්‍රවාහන සංචිතය මඟින් සේවක සුභසාධනය හා අභිප්‍රේරණය වෙනුවෙන් පහත සඳහන් පරිදි කටයුතු කර ඇත.

- සේවකයින්ගේ සහ ඥාතීන්ගේ අවමංගල්‍ය කටයුතු සඳහා සහන පදනම යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම.

- වාර්ෂික අධ්‍යාපන, සුභද හමු හා විනෝද චාරිකාවෙනුවෙන් සහන පදනම යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම.

- සේවකයින්ගේ විශේෂ අවශ්‍යතා (විවාහ උත්සව) සඳහා සහන මිළ ගණුන් අයකර ගැනීමේ පදනම යටතේ සංචිත වාහන ලබාදීම.

- ව්‍යාපෘති කටයුතු සඳහා සංචිත වාහන යොදවා එම කටයුතු සාර්ථක කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරඇත. (වැලිගම ව්‍යාපෘතිය)

- මණ්ඩලයසතු J.C.B යන්ත්‍රමඟින් ආදර්ශ පොල්උයන් හා තවාන් සංවර්ධන කටයුතු ඉටුකර දීම හරහා කුලීපදනම යටතේ මෙම යන්ත්‍ර ලබාගැනීමට යන විශාල පිරිවැය ඉතිරි කිරීමට කටයුතු කර ඇත.

3.9 ප්‍රසම්පාදන කටයුතු

පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් සිදු කරනු ලබන ව්‍යාප්ති සේවාවන් අඛණ්ඩව සිදු කිරීමට මෙන්ම ගුණත්වය වැඩිකිරීමට අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ මෙන්ම මුද්‍රිත යෙදවුම් මිල දි ගැනීම , පොල් පැල නිෂ්පාදන සඳහා අවශ්‍ය යෙදවුම් මිල දී ගැනීම , ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ප්‍රාදේශිය කාර්යාල, ආදර්ශ පොල් උයන් හා තවාන් හි සේවය කරනු ලබන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ හා සේවාවන් මිල දී ගැනීමට අදාලව 2020 වර්ෂයේ දී රුපියල් මිලියන 35 ක ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කර ඇත.

3.10 ඉදිකිරීම් අත්පත් කර ගැනීම්

මණ්ඩලීය ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම හා ප්‍රාග්ධන වත්කම්වල නඩත්තු කටයුතු මේ යටතේ ආවරණය කෙරේ. ඒ අනුව, පහත දක්වා ඇති ප්‍රධාන ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂය තුලදී ආරම්භ කර නිම කිරීමට හැකි විය.

- මාතලේ නව කාර්යාල ගොඩනැගිල්ලේ 2වන අදියරේ ඉදිකිරීම නිමකර කාර්යාලය එම ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීම.

- පොලොන්නරුව නිලධාරී නිලනිවාසය විවෘත කිරීම.

- ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරයේ වැසිකිළි පද්ධතිය, කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම.

- කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ වහලය සහ සිවිලිම අළුත් වැඩියා කිරීම

- ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදුකිරීම

- ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය සහ එයට අයත් නිලනිවාස, වැට මායිම්, භූමි අලංකරණය සිදුකර අංගසම්පූර්ණ අළුත් වැඩියාවක් සිදුකිරීම.

- ප්‍රාදේශීය කාර්යාලයන් හිවැසිකිළි පද්ධති, කාර්යාල ගොඩනැගිලි, නිලනිවාස අළුත්වැඩියා කිරීම.

මේ අනුව පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය, 2020 වර්ෂය තුල සේවකයින් පුහුණු කිරීම හා අභිප්‍රේරණ කටයුතු කරමින්ද, ප්‍රාග්ධන ඉදිකිරීම් අත්පත් කර ගැනීම් සංවර්ධනය හා පහසුකම් අළුත්වැඩියා කිරීමේ කටයුතු හා නඩත්තු සේවා පවත්වාගැනීමට කටයුතු කරමින්ද, පවතින

අවම සම්පත් උපරිම ලෙස කළමනාකරණය කරමින්ද,කෝවිඩ්වසංගතඅභියෝගමුවේවුව ද එමබාධාවන් ද මැඩපවත්වාගනිමින් මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යයභාරය වන පොල් වගාව ව්‍යාප්ත කරලීමේ කටයුත්ත සඳහා මනා සහයෝගයක් ලබාදීමට කටයුතු කර ඇත.

04. අභ්‍යන්තර විගණන අංශය

4.1 අභ්‍යන්තර විගණනයේ අරමුණ

පොල් වගාකිරීමේ මණ්ඩලය ළඟාකර ගැනීමට අපේක්ෂිත දැක්ම,මෙහෙවර, පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා සංවිධානයේ කටයුතු කර තිබේද යන්න සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වර්ෂය පුරා කාර්යක්ෂමව හා ඵලදායීව තිබේද යන්න හා වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදමින් ප්‍රාදේශිය ඒකක අතර මනා සම්බන්ධිකරණයක් පවත්වාගෙන යන්නේදැයි පිළිබඳව සිදුකරනු ලබන ඇගයීමකි.

4.2 මෙම වර්ෂය තුළ සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන විෂය පථයට අදාළ කාර්යභාරය හා රාජකාරි ඉතාමත් ගුණාත්මක තත්වයකින් අඛණ්ඩ පදනමක් මත 2020 වර්ෂය තුල ඉටුකර ඇත.

1. කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය - වාර්ෂික විගණන කටයුතු
2. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය - වාර්ෂික විගණන කටයුතු
3. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ රාජ්‍ය දේපල අවභාවිතය සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය
4. මැදමුලන තවාන - විශේෂ විගණන පරීක්ෂණය
5. බිංගිරිය තවාන - වාර්ෂික විගණන කටයුතු
6. පොල්ගහවෙල තවාන - වාර්ෂික විගණන කටයුතු
7. එරමිණිගොල්ල තවාන - වාර්ෂික විගණන කටයුතු
8. මත්තමගොඩ තවාන - වාර්ෂික විගණන කටයුතු
9. පොල් පැළ නිකුත්කිරීමේ ප්‍රතිශතය 70% ට වඩා අඩුවීම පිළිබඳ විශේෂ විගණන පරීක්ෂණය
10. උහන තවාන - වාර්ෂික විගණන කටයුතු
11. නාගන්සෝල ආදර්ශ පොල් උයන - පොල් ගස් ඉවත්කිරීම සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය
12. රන්දෙණිය ආදර්ශ පොල් උයන - පොල් තොග ගණනය කිරීමේ විශේෂ විගණන පරීක්ෂණය
13. නාගන්සෝල ආදර්ශ පොල් උයන - වාර්ෂික විගණන කටයුතු
14. මුන්ලදම ආදර්ශ පොල් උයන - වාර්ෂික විගණන කටයුතු
15. මහායාය ආදර්ශ පොල් උයන - වාර්ෂික විගණන කටයුතු
16. වතුපාලන සේවාවට අයත් සේවකයින්ට අතිකාල ගෙවීම - විශේෂ විගණන පරීක්ෂණය
17. බෝපිටිය ආදර්ශ පොල් උයන - වාර්ෂික විගණන කටයුතු
18. කොහොඹාන ආදර්ශ පොල් උයන - වාර්ෂික විගණන කටයුතු
19. වැටුප් විශමතා පරීක්ෂාව
20. මුදල් පොත් පරීක්ෂාව

ඉහත සඳහන් ඒකක වල සිදුකරන ලද විගණන කටයුතුවලදී අනාවරණය වූ වැරදි හා අඩුපාඩු සභාපතිතුමා වෙත වාර්තා කර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.තවද මෙම විගණන නිරීක්ෂණයන් හා පිළිතුරු විගණන හා කළමනාකරණ කමිටුවටද ඉදිරිපත් කර එම කමිටු නිර්දේශයන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අවශ්‍ය තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

4.3 එසේ අනාවරණය වූ පොදු වැරදි හා අඩුපාඩු

1. ආදර්ශ පොල් උයන් වල පොත්පත් ලේඛන නිසියාකාරව නඩත්තු නොවීම සහ නිලධාරීන්ගේ අධීක්ෂණ ගැටළු නිසා මූල්‍ය පාලනය දුර්වල වූ අවස්ථා නිරීක්ෂණය විය.
2. ආදර්ශ පොල් උයන් වල වැටුණු පොල් සහ කඩන ලද පොල් ලේඛනගත කිරීමේ ගැටළු සහ ඊට අදාළ අධීක්ෂණ කටයුතු සමහර ආදර්ශ පොල් උයන් වල දුර්වල මට්ටමක පැවතීම.
3. පොල් පැළ තවාන් වල පොත්පත් නඩත්තුව සම්බන්ධ ගැටළු පැවතීම.
4. වතු නිෂ්පාදන අලෙවි කිරීමේදී ටෙන්ඩර් ක්‍රමවේදය සහ ප්‍රධාන කාර්යාලීය අනුමැතිය ලබාගැනීම ගැටලු සම්බන්ධ ක්‍රියාවලියේ අඩුපාඩු සමහර අවස්ථා වල නිරීක්ෂණය වීම.
5. ඉන්වෙන්ට්‍රි ලේඛන හා ලොග් සටහන් පොත්, දැව ගස් සංඝණන කටයුතු සම්බන්ධ අඩුපාඩු.
6. තවාන් වල චෙක්රෝල් සේවක බඳවාගැනීම් සම්බන්ධ ලිපිගොනු නඩත්තු කිරීමේ අඩුපාඩු.
7. ප්‍රාදේශීය කාර්යාල වල පොල් සංවර්ධන නිලධාරී විසින් සිදුකරනු ලබන අලෙවි කිරීම් වලදී මුදල් ප්‍රාදේශීය කාර්යාලයට බැඳීමේදී ඇතිවන ගැටළු
8. ප්‍රාදේශීය කාර්යාල වල සාමාන්‍ය පරිපාලන කටයුතු හා පොල් පැළ අලවිය හා සහනාධාර සම්බන්ධ ලේඛන නඩත්තු කිරීමේ අඩුපාඩු
9. තවාන් වල කන්න තුලනය කිරීමේ අඩුපාඩු හා නිකුත්කිරීමේ ගැටළු
10. ප්‍රධාන කාර්යාල මුදල් පොත් පරීක්ෂාවේදී ගෙවීම් වවුචර් වල අඩුපාඩු

4.4 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

4.4.1 මෙහි අරමුණ

අභ්‍යන්තර හා බාහිර විගණන මඟින් හෙළිදරව් වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය වෙත මඟපෙන්වීමක් සිදුකිරීම සහ මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම විගණන කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ.
මෙම වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

	පැවැත්වූ දිනය
❖ 2020/01 රැස්වීම	2020.06.15
❖ 2020/02 රැස්වීම	2020.09.22
❖ 2020/03 රැස්වීම	2020.11.24
❖ 2020/04 රැස්වීම	2020.12.08

4.4.2 කමිටු සංයුතිය

1. තිලකා ජයසුන්දර මහත්මිය — සභාපති
   අතිරේක ලේකම් ,
   වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,

2. තරංගා ලියනගේ මහත්මිය — සාමාජික
   අධ්‍යක්ෂ ,
   ජාතික අයවැය දෙපාර්තමේන්තුව

3.	සරත් පෙරේරා මහතා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික	සාමාජික
4.	කේ.එල්.මානෙල් කුලරත්නමහත්මිය සාමාන්‍යාධිකාරී , පොල් වගාකිරීමේ මණ්ඩලය	ලේකම්/කැඳවුම්කරු
5.	එස්.යූ.ඩී.මානවසිංහ මහතා (විගණන අධිකාරී)	නිරීක්ෂක
6.	බී.ඒ.ඩබ්.බමුණුආරච්චි මහතා (පොල් වගාකිරීමේ මණ්ඩලය)	අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණන පරීක්ෂණ වලින් හෙලිදරව් වන වැරදි අඩුපාඩු හා රජයේ විගණන අංශයේ විගණන විමසුම් ද විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.

05. මූල්‍ය කළමණාකරණ අංශය

5.1ගිණුම් ප්‍රකාශය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථකාර්යයන් 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ විධිවිධානයන්ටඅනුකූලව, නියමිත චක්‍රලේඛ මුදල් රෙගුලාසි වලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව 2020.12.31 දිනෙන් අවසන් වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

දීපව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල 19 ක්ද පුහුණු මධ්‍යස්ථාන 3 ක් ද සහිත සම්බන්ධීකරණ ජාලයක් තුළ තවාන් 39කින් සහ ආදර්ශ පොල් උයන් 12කින් සපුරාගත යුතු ඉලක්ක සාක්ෂාත් කරගැනීමටද ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උචිත වන්නාවූ මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම, සැළසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම, ලේඛනගත කිරීම වාර්තා කිරීම හා පුරෝකථනය කිරීම මූල්‍ය කළමනාකරණ අංශයේ ප්‍රමුඛ ක්‍රියාදාමයයි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මූල්‍ය කළමනාකරණ)ගේ මෙහෙයවීම හා මගපෙන්වීම යටතේ මූල්‍ය කළමනාකරණ අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී(මූල්‍ය කළමනාකරණ), ගණකාධිකාරී (මූල්‍ය), ගණකාධිකාරී (ආදර්ශ පොල් උයන්), ගිණුම් නිලධාරී වශයෙන් හා සහායක කාර්යය මණ්ඩලය දීපව්‍යාප්තවප්‍රාදේශීය කාර්යාල තුළ මූල්‍ය කටයුතු මෙහෙය වීම, වාර්තා කිරීම හා පාලනය කිරීම සිදු කරනු ලබයි.

2020 වර්ෂයේ මණ්ඩලයේ ඇස්තමේන්තු වලට අදාළවපුනරාවර්ථන වැය ශීර්ෂ යටතේ රු. මිලියන 479.00 ක්සහ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ රු. මිලියන 800.00 ක් මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන ලබාදී ඇත.වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙනුවෙන් පොල් වගාව නගා සිටුවීම සඳහා වූ ව්‍යාපෘතිය පවත්වා ගෙන යාමට පොල් වගාකිරීමේ මණ්ඩලය කටයුතු කරයි. ඒ අනුව වැලිගම පොල් කොළ මැළවීම හා කුණුවීමේ මර්දන වැඩසටහන සඳහා රු. මිලියන18.702ක්ද, වැවිලි සවිය ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 01 ක්ද , මයිටාව්‍යාපෘතිය සඳහා රු. මිලියන 5.00 ක්ද වශයෙන් ප්‍රතිපාදන පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදී ඇත. ඊට අමතර වශයෙන් තැඹිලි වගා ප්‍රවර්ධනය වෙනුවෙන් පොල් සංවර්ධන අධිකාරිය මඟින් රු.මි. 25 ක් පොල්වගාකිරීමේ මණ්ඩලයට ලබාදී ඇත.

ගාල්ල මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුළ ව්‍යාප්ත පොල් වගාවසම්බන්ධයෙන් පැතිර ඇති කොළ මැළවීමේ රෝගය මර්දනය කිරීමට හා මැඩ පැවැත්වීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබාදෙන ප්‍රතිපාදන යටතේරු. මිලියන 17.948 ක මුදලක් වැය කරන ලදි. එය පිළිවෙලින් ගාල්ල දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 3.989 ක්ද, මාතර දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 12.215 ක්ද හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන1.743 කි. මෙම රෝග මර්දනයට හා පැතිරීම වැළැක්වීමට පොල් වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පමණක් නොව නව ව්‍යාපෘතිය හා සංවර්ධන කටයුතු මඟින් විශාල පිටුවහලක් වගාකරුවන් වෙත ලබාදී ඇත. එසේම වැලිගම රෝගය මැඩ පැවැත්වීම සඳහා ලබා දුන් අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් ගාල්ල, හම්බන්තොට සහ මාතර ප්‍රාදේශීය කාර්යාල සඳහා ප්‍රාග්ධන භාණ්ඩ මිල දී ගැනීම සඳහා රු.මි. 0.7551 ක් ද වියදම් දරා ඇත.

ස්වයං මූල්‍ය ඒකකය යටතේ 2020.12.31 දිනට තවාන් හා සංවර්ධන අංශය රු. මිලියන (48.23) ඌණතාවයක් ද එම අංශයට අදාළව ක්‍රියාත්මක වන මීගමුව බීජ නිෂ්පාදන ඒකකය රු. මිලියන (38.473) සේවා වියදමක්ද දරා ඇති අතර ආදර්ශ පොල් උයන් මඟින් රු. මිලියන 42.28ක අතිරික්තය ක් ද උපයා ඇත. පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 වර්ෂය තුළ සමස්ථ මෙහෙයුම් වලට අදාළව රු. මිලියන 42.057 ක විවිධ ආදායමක් උපයා ගැනීමට හැකි වී තිබේ. එසේම 2020.12.31 දිනට සමස්ථ අතිරික්තය රු. මිලියන 131.470 කි.

2020 වර්ෂය තුළ දරණ ලද පුනරාවර්ථන වියදම රු. මිලියන 577.111 වූ අතර පොල් ක්ෂේත්‍රයේ ව්‍යාප්ති හා සංවර්ධන සේවාව වෙනුවෙන් පොල් වගාකරුවන්ට සංවර්ධන ආධාර ලෙස රු. මිලියන

489.599 ක් හා ප්‍රාග්ධන හා ඉදිකිරීම් හා මිලදී ගැනීම සඳහා රු. මිලියන 28.421 ක් වැය කොට ඇත. ඒ අනුව මණ්ඩලය සතු වත්කම් වල සමස්ථ වටිනාකම රු. මිලියන 2,555.612 කි.

පොල් වගාකිරීමේ මණ්ඩලය,
9/428, ඩෙන්සිල් කොඞ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

Coconut Cultivation Board
Statement of Financial Position for the year ended as at 31st December 2020

	Note		2020 Rs.		2019 Rs.
Assets					
Non- Current Assets					
Property, Plant and Equipment	02	817,326,105		665,174,683	
Work In Progress	03	42,436,413		174,112,090	
Investment (LT)	04	5,345,358		2,276,677	
Kapruka Refinance Investment (LT)	04	1,013,194,606		934,182,917	
Biological Assets (Differed Expenditure	05	359,988,832		347,232,766	
Biological Stock	06	35,328,456	2,273,619,769	40,209,100	2,163,188,234
Leased Land	07	5,173,467	5,173,467	5,320,315	5,320,315
Current Assets					
Inventories / Stocks	08	273,215,198		503,971,959	
Trade and other Receivables	09	65,121,933		109,629,767	
Prepayments	10	949,715		539,387	
Deposits (ST)	11	3,300,007		3,275,007	
Investment (ST)	12	47,850,286		27,760,517	
Cash and Cash Equivalents	13	326,310,063		77,959,657	
Account Current (M/G)	14	(25,315,430)		(33,022,771)	
			691,431,771		690,113,522
Total Assets			2,970,225,007		2,858,622,071
Less : Liabilities					
Current Liabilities					
Payable	15	129,063,831		193,645,981	
Accrued Expenses	16	25,608,284		51,523,065	
Short -term Provision	17	36,313,372		34,167,381	
		190,985,487		279,336,427	
Non-current liabilities					
Long Term Provision	17	223,627,041		204,253,611	
		223,627,041		204,253,611	
Total liabilities			414,612,528		483,590,037
Total Net Assets			2,555,612,479		2,375,032,033
NET ASSETS/EQUITY					
Accumulated Fund					
Capital Fund	18	378,615,051		385,296,153	
General Fund	19	971,250,903		861,250,487	
Capital Fund - Kapruka	20	852,588,426		803,453,625	
Credit Guarantee Fund - Kapruka	21	111,724,000	2,314,178,380	83,597,670	2,133,597,935
Reserves					
Capital Reserves	22	68,192,461		68,192,461	
Revenue Reserves - CMG	23	173,241,637	241,434,098	173,241,637	241,434,098
Total Net Assets /Equity			2,555,612,479		2,375,032,033

The Accounting Policies and Notes on Page Nos.01 to 44 are integral part of these Financial Statements.The board of directors is responsible for the Preperation and presentation of these financial statements.

G.D.T.S. Perera
Deputy General Manager
Finance Management
Coconut Cultivation Board

K.L. Manel Kularathna
General Manager
Coconut Cultivation Board

R.P. Kasthuriarachchi
Director General
State Ministry of Coconut, Kithul, and Palmirah Cultivation Promotion and Related Industrial Product Manufacturing & Export Diversification.
Board of Director
Coconut Cultivation Board

A.V.K. Madhavie Herath
Chairman
Coconut Cultivation Board

Coconut Cultivation Board
Statement of Financial Performance for the year ended
31 st DECEMBER 2020

Rs.

	Note		2020		2019
Government Recurrent Grant			479,000,000		460,000,000
Government Capital Grant			692,827,236		511,505,223
Ministry of Plantation Industries - Weligama Wilt			18,701,522		12,285,900
Ministry of Plantation Industries - Kapruka Purawara			-		1,005,000
Ministry of Plantation Industries - Wawilisaviya			1,000,000		15,855,411
Ministry of Plantation Industries - Insect Project			-		1,000,000
Ministry of Plantation Industries - Mite Project			5,000,000		1,000,000
Ministry of Plantation Industries - C cap Project			-		7,570,376
Coconut Development Authority - King Coconut			25,000,000		-
Total of Revenue (A)			**1,221,528,757**		**1,010,221,909**
Other Income					
Profit on Nurseries Unit	24	(48,230,434)		(30,128,215)	
Negambo seed Unit	24	(38,473,531)		(20,735,437)	
Sundry Income	25	42,057,409		33,458,192	
Profit on Sales of Fixed Assets	26	-		99,087	
Profit on Model Garden Unit	27	42,285,178		5,532,958	
Circuit Bungalow CMG - 04	31	(441,459)		(77,673)	
Circuit Bungalow GL and RO - 03	31	(2,192,364)		1,452,435	
Mite Project	32	(405,406)		564,021	
Iotal Income of Self Finance (B)			**(5,400,607)**		**(9,834,631)**
Grand Total (A+B)			**1,216,128,150**		**1,000,387,278**
	28		**507,547,074**		**275,279,068**
			708,581,076		**725,108,210**
Personal Emoluments	29	376,346,485		360,282,681	
Traveling & Subsistence	29	3,479,014		4,757,917	
Supplies and Consumable used	29	15,052,976		22,565,737	
Maintenance	29	25,861,030		19,627,358	
Contractual Services	29	19,790,886		34,648,037	
Depreciation and Amortization Expenses	29	67,122,133		44,001,079	
Other Recurrent Expenditure	29	69,458,523		98,137,052	
Total Operating Expenditure			**577,111,046**		**584,019,861**
Surplus/(Deficit)			**131,470,030**		**141,088,348**

Indirect Method cash flow statement

Coconut Cultivation Board
Consolidated Cash Flow Statement for the year ended
31st December 2020

Rs.

		2020		2019
Cash Flows from Operating Activities				
Surplus /(deficit) from ordinary activities		**131,470,030**		**141,088,348**
Adjustment for Item not Involving Movement of Cash				
Depreciation of the Year	64,287,029		38,922,200	
Provision for Gratuity	43,439,544		31,727,577	
Provision for Audit Fees	552,600		650,000	
Interest Income	(1,043,084)		(2,140,443)	
Profit on Sale of Fixed Assets	-		(99,087)	
Mature Plant Depreciation of the Year	7,596,535		6,839,953	
Provision for Bad Debtors	-		-	
Write-off Lease Land	146,849		146,849	
Write-off Capital Depreciation of the Year	(32,179,765)		(26,146,951)	
Provision for cash handling allowane	1,318,391			
Provision for L.R.C. Tax	275,000		29,071,746	
		84,393,099		**78,971,844**
		215,863,129		**220,060,192**
Prior Period Items General Ledger (not 18)	**(21,469,614)**		9,525,998	
Capital fund	**(2,921,704)**			
Kapruka Ledger	4,055,831	**(20,335,487)**	(97,478)	**9,428,520**
Adjustment - Kapruka Fund				
Operational Account Kapruka Surplus (Deficit) Note	(7,262,076)		20,204,106	
Interest Income	(36,296,721)		(40,219,609)	
Credit Guaranty Fund (Kapruka)	1,714,979	**(41,843,819)**	5,057,995	**(14,957,508)**
Operating Profit of Working Capital		**153,683,823**		**214,531,204**
Change in Items of Working Capital				
Stocks (Increase) / Decrease	235,637,405		(11,526,414)	
Debtors (Increase) / Decrease	44,507,834		3,736,871	
Deposit (Increase) / Decrease Short Term	(25,000)		(1,000)	
Current Account (Increase) / Decrease	(7,707,340)		14,862,969	
Investment (Increase) / Decrease Short Term	(20,089,769)		3,222,680	
Prepayment (Increase) Decrease	(410,328)		(213,332)	
Creditors Increase/ (Decrease)	(64,582,149)		14,007,308	
Accrued Expenses Increase / (Decrease)	(25,914,781)	**161,415,871**	5,257,262	**29,346,344**
Net Cash Generated from Operating Activities		**315,099,695**		**243,877,548**
Cash Flows from Investing Activities				
Purchase of Fixed Assets (Increase)	(224,034,986)		(101,482,041)	
Mature Planation	37,829,085			
Pallai Irrigation (02lakes)	11,756,760			
Payment for Lease Land	-		(1,800,000)	
Investment Long Term - Decrease (Increase)	(82,080,369)		(58,158,313)	
Interest Income Received	37,339,806		41,770,444	
Sale of Fixed Assets Income	-		305,820	
Deferred Expenditure	(62,341,910)		(59,863,886)	
Working Progress	131,675,677	**(149,855,938)**	(46,390,462)	**(225,618,438)**
Net cash Used in investing activities		**165,243,757**		**18,259,110**
Cash Flows from Financing Activities				
Capital Grant /Treasury (Kapruka)	78,752,398		29,721,500	
Capital Grant /Treasury	28,420,367		26,773,277	
	107,172,765		**56,494,777**	
Used in cash activities				
L.R.C. Tax Paid	-		(594,166)	
Gratuity Paid	(24,066,114)	83,106,651	(36,817,565)	**(37,411,731)**
		248,350,407		**(19,152,621)**
Net Cash Generate from financing activities				
Net increase/(decrease) in cash and Cash Equivalents		248,350,407		39,134,658
Cash and cash equivalents at beginning of the Year		77,959,657		38,817,499
Cash and cash equivalents at end of the Year		**326,310,063**		**77,952,157**

Coconut Cultivation Board
Statement of Changes in Net Assets for the year ended
31st December 2020

Rs.

	Accumulated Fund	Accumulated Reserve	Translation Reserve	Total
Balance at 31st December 2018	1,939,186,058	241,434,098	-	2,180,620,156
Changes in accounting policy	-	-		-
Adjustment balance	-	-		
	1,939,186,058	**241,434,098**	-	2,180,620,156
Surplus on revaluation of properties	-	-	-	-
Deficit on revaluation of investments	-	-	-	-
Currency translation differences	-	-	-	-
	1,939,186,058	**241,434,098**	-	2,180,620,156
Net gains and losses not recognized in the statement of financial performance	53,414,529	-	-	53,414,529
Surplus/(Deficit) for the period	141,088,348	-	-	141,088,348
Balance as at 31st December 2019	**2,133,688,935**	**241,434,098**	-	2,375,123,033
Deficit on revaluation of properties	-	-	-	-
Surplus on revaluation of investments	-	-	-	-
Currency translation difference	-	-	-	-
	2,133,688,935	**241,434,098**	-	2,375,123,033
Net gains and losses not recognized in the statement of financial performance	49,110,416	-		-
Surplus/(Deficit) for the period	131,470,030	-		-
Balance as at 31st December 2020	**2,314,269,380**	**241,434,098**	-	2,555,703,478

06. විගණකාධිපතිගේවාර්ථාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAL/F/CCB/01/2020/37

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 අගෝස්තු 23 දින

Coconut Cultivation Board
30 AUG 2022
2376
General Manager Division

COCONUT CULTIVATION BOARD
597
29 AUG 2022
CHAIRMAN DIVISION
Received Date .....

පොල් වගාකිරීමේ මණ්ඩලය
30 AUG 2022
3053
මූල්‍ය කළමණාකාර

සභාපති

පොල් වගා කිරීමේ මණ්ඩලය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

GM/CCB
For your information & necessary action

Chairman/CCB

DGM (~~Admin & HRM)/(CMG&ND)/(Ext&D)~~/(FM)
For Your information /NA

General Manager
Coconut Cultivation Board

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- (1) ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
(2) ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAL/F/CCB/01/2020/37 මබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 අගෝස්තු 13 දින

සභාපති

පොල් වගා කිරීමේ මණ්ඩලය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික නියාමනඅවශ්‍යතාපිළිබඳව2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

පොල් වගා කිරීමේ මණ්ඩලයේ2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවසමඟ සංයෝජිතව කියවිය යුතු2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6)ව්‍යවස්ථාවප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්පීත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල එපරිද්දෙන් අයවැයගත සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, ආදර්ශ පොල් උයන් ලෙජරයේ ජංගම ගිණුමේ රු. 29,990,706 ක බැර ශේෂය හා තවාන් ලෙජර ජංගම ගිණුමේ රු.4,675,275 ක හර ශේෂය එකිනෙකට හිලව් කර ශුද්ධ අගය වන රු.25,315,430 ක්සදොස් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ)2013 වර්ෂයේදිදිගු කාලීන ආයෝජනයක් වශයෙන් ආරම්භ කරතිබුණුපාසිකුඩා සංචාරක ව්‍යාපෘතියෙහි ආයෝජිත රු.22,197,339 ක අගයශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 76 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. තවද,මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 07 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 13 හි 42 ඡේදය ප්‍රකාරව එම ආයෝජිත දේපළෙහි සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ඈ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 118 ප්‍රකාරව ස්කන්ධයෙහි හඳුනා ගන්නා එක් එක් ආදායම හා වියදම සහ එක් එක් සංරචකය සඳහා හඳුනාගත් පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම්වල ප්‍රතිඵල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයේ පැහැදිළිව දැක්විය යුතු වුවද, මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදල, පොදු අරමුදල, ප්‍රාග්ධන අරමුදල - කප්රුක සහ ඇප ආවරන අරමුදල ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි වෙන වෙනම දැක්වීමවෙනුවට සමුච්චිත අරමුදල නමින් එක් අයිතමයක් ලෙස දක්වා තිබුණි.එම අයිතමවලට අදාළවසමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණු ගැලපීම්වලශුද්ධ බලපෑම වූ රු.49,110,416 ක් පමණක් ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.එසේම මෙම ගිණුම් 03 ට අදාළ ලෙජර් ගිණුම් ශේෂයන් හා මූල්‍ය ප්‍රතාශනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.501,767,769 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එම වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට අනුකූල නොවන ආකාරයට මුදල් හා මුදල් සමාන දෑ ලෙස සැලකිය යුතු මාස 03 න් කල් පිරෙන රු.11,476,390 ක කෙටි කාලීන ස්ථාවර තැන්පතුවලින්රු.6,131,032 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ද, රු.5,345,358 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ද දක්වාතිබුණු අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු මුදලින් ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු.905,159ක් ද, ලැබිය යුතු පොලිය රු.137,925 ක්ද ආයෝජන ක්‍රියාකාරකම් යටතේදක්වා තිබුණි. එසේමමාස 03 න් කල් පිරෙන කෙටිකාලීන තැන්පතු රු.5,345,358 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණුමුළු පිරිවැය රු.375,410,404 ක් වූ ගොඩනැගිලි, මෝටර් වාහන, පරිගණක හා කාර්යාල උපකරණ දැනටමත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුන ද, එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 වන ඡේදය අනුව වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයට ගලා ඒම අපේක්ෂා කළ හැකි විට ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවද, ආදර්ශ පොල් උයන් 12 හි කොස්, තේක්ක ආදී වර්ග 38 ක දැවමය වටිනාකමක් සහිත ගස් 7,936 ක් හා තවාන් 39 ක වර්ග 46 ක දැවමය වටිනාකමක් සහිත ගස් 5,525 ක් වශයෙන් එකතුව ගස් 13,461 ක් සහ තවාන් 39 ක පොල් ගස් 11,605 ක් ගිණුම්ගත කර නොතිබුණි. 2016 – 2021 අතර කාලය තුළ මේවායින් දැවමය වටිනාකමක් සහිත ගස් 373 ක් කපා ඉවත් කර ඇති බව ද වාර්තා වී තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 16 වන ඡේදය අනුව ජීව විද්‍යාත්මක වත්කමක් මූලිකව හඳුනා ගැනීමේදී හා සෑම වාර්තාකරණ දිනයකදීම මැනිය යුත්තේ විකිණීමට වන පිරිවැය අඩුකර එහි සාධාරන වටිනාකමට වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සතුන්ගේ බර අනුව ගණනය කළ රු.35,328,456 කපශු සම්පත් හා රු.359,988,832 ක ස්ථාපිත කිරීමේ වියදම් ඇතුළත්ජීව විද්‍යාත්මක වත්කම් මැනීමේදී විකිණීමට වන පිරිවැය අඩු කර නොතිබුණි. තවද, එම ප්‍රමිතියේ 44 (අ) හා (ආ) ඡේද අනුව ජීව විද්‍යාත්මක වත්කම්වල ක්‍රියාකාරකම්වල ස්වභාවය හා කාල පරිච්ඡේදය අවසානයේ කෘෂිකාර්මික නිෂ්පාදන නිමැවුම්වල භෞතික ප්‍රමාණයන්ගේ ඇස්තමේන්තු හෙළිදරව් කර නොතිබුණි.

(එ)ප්‍රධාන කාර්යාලය හා ආදර්ශ පොල් උයන්12 ක ගනුදෙනු සම්බන්ධීකරණය සඳහා ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ලෙජර් පාලන ජංගම ගිණුම හා ආදර්ශ පොල් උයන්වලපවත්වාගෙන ගොස් තිබුණුජංගම් අතර රු.73,729,701 ක හර/බැර වශයෙන් වූ වෙනසක් ද, මණ්ඩලයට අයත් පොල් තවාන් 39 හි දෛනික වියදම් පාලනය සඳහා ප්‍රධාන කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් අතර රු.4,675,275 ක වෙනසක් ද නිරීක්ෂණය වූ නමුත් මෙකී වෙනස්කම් පිළිබඳ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඒ)2017 වර්ෂයේ පොහොර සහනාධාර ණයගිම්යන් සඳහා 2018 වර්ෂයේදී ගෙවන ලද රු.7,893,816 ක් ණයගිම් ගිණුමට හර කිරීම වෙනුවට එම වර්ෂයේ වියදම්ගිණුමට හර කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී රු.7,893,816 ක් වෙනුවට රු.13,510,360 ක් ණයගිම් ගිණුමට හර කර පෙර වර්ෂ ගැලපුම් ගිණුමට බැර කර තිබුණි. ඒ හේතුවෙන් ණයගිම්යෝ හා සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.5,616,544 ක් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඔ) පොල් සංවර්ධන අධිකාරියෙන් 2019 වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළලැබිය යුතුතැඹිලි ප්‍රවර්ධන ගාස්තුව පිළිවෙලින් රු.23,433,807 ක් හා රු.23,368,203 ක් වුවද,සමාලෝචිතවර්ෂයේදී

ලැබුණුරු.25,000,000 ක්පමණක් ආදායම ලෙසගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,631,797 ක් වැඩියෙන් ද, ලැබිය යුතු ආදායම රු. 21,802,010 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඕ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ගිණුම් 26 කට අදාළ රු.17,880,698 ක ණයගැති ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කර නොතිබීමෙන් එම ණයගැති ශේෂවල භෞතික පැවැත්ම පිළිබඳව සැහීමකට පත්විය නොහැකිව ඇත.

(ක) බීජ පොල් හා පොල් පැළ මිලදී ගැනීම වෙනුවෙන් රු.17,244,333 ක්පොල් පර්යේෂණ මණ්ඩලයට ගෙවිය යුතු ලෙස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලදක්වා තිබුණද, පොල් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂයරු.28,794,390 ක් වූයෙන් රු.11,550,057 කවෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත් මෙම වෙනස පිළිබඳ සොයා බලාමූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ග) කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයේ"ඇප ආවරණ" තැන්පත් බැංකු ගිණුම්වලටබැර කිරීම සඳහා 2020 දෙසැම්බර් 28 දින නිකුත් කළනමුත් තැන්පත් ගිණුම්වලට බැර නොකර2021 ජනවාරි දක්වා ලඟ තබාගෙනතිබුණුරු.26,411,351 ක් වටිනා වෙක්පත් 07 ක්සදොස් ලෙස ව්‍යාපෘතියේ වියදමක් වශයෙන් ගිණුම්ගත කරතිබීම හේතුවෙන්එම වටිනාක්මින් ව්‍යාපෘතියේ වියදම වැඩියෙන් ද, ඇප ආවරන තැන්පතු ගිණුමේ ශේෂය අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ච) 2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තොග පිළිබඳ භෞතික සමීක්ෂණකටයුතු අවසන් කර තොගවල ශුද්ධ උපලබ්දි අගය හෝ පිරිවැය නිවැරදිව හඳුනාගැනීමකින් තොරව රු.273,215,198 ක තොගවල පොත් අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

(ඡ) පෙර වර්ෂයේ ගොඩනැඟිලි අලුත්වැඩියා සඳහා දරන ලද රු.2,577,450 ක වියදමක් පෙර වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැඟිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබීමෙන් ගොඩනැඟිලි පිරිවැය සහ සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2020වාර්ෂික වාර්තාවේ ඇතුළත්අනෙකුත්තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූමගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවනතොරතුරු, අනෙකුත් තොරතුරුයන්නෙන් අදහස් වේ. මෙමඅනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝමතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින්ලබාගත් මගේ දැනුම අනුවප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පොල් වගා කිරීමේ මණ්ඩලයඅඛණ්ඩවපවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පොල් වගා කිරීමේ මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදීමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පොල් වගා කිරීමේ මණ්ඩලයේවාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍යයැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා මණ්ඩලය පවත්වාගෙන තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(ඉ), (ඊ) හා (ඡ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත්වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතිකවිගණනපනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය** හැරයම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලටඅනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**විස්තරය**
	---	---
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තිය	ස්ථාවර තැන්පතු ආයෝජනයක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු18 ක ආයෝජිත රු.92,394,311ක් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මු.රෙ. 137 සහ 138	ගෙවීම් කිරීමට පෙර බලය ලත් නිලධාරීන් විසින් වවුචර්පත අනුමත කිරීමටත්, නිවැරදි සහ සෑම අතින්ම සම්පූර්ණ බවට සහතික කිරීමටත් කටයුතු කළ යුතු වුවද,රු.301,277 ක් වටිනා වවුචර් පත් 04 ක් අනුමත නොකර සහරු.100,000,000 ක වවුචර්යක් සහතික නොකර ගෙවා තිබුණි.
	(ii) මු.රෙ. 381	මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුම් 10 සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ඇති බවට නිරීක්ෂණය නොවූ අතර සේවකයන්ට උත්සව අත්තිකාරම් හා ආපදා ණය ගෙවීම සඳහා වෙන වෙනම ජංගම ගිණුම් දෙකක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳවද කරුණු ඉදිරිපත් කර නොතිබුණි.
	(iii) මු.රෙ. 395	එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර

	බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙළ කර ගෙවන නිලධාරියා විසින් සහතික කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විගණනයට ඉදිරිපත් කළ බැංකු ගිණුම් 03 කට අදාළ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන 22 ක්බලය ලත් නිලධාරියා විසින් අනුමතකර නොතිබුණි.
(iv) මු.රෙ. 756	2020 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එම වත්කම්වල පිරිවැය රු.1,289,265,602 ක් විය.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) IIවැනි පරිච්ඡේදයේ 13.3 ඡේදය හා 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය	පුරප්පාඩු වී ඇති තනතුරක වැඩබැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස බැවින් එහි උපරිමකාලය මාස 03 ක් පමණක් විය යුතු වුවද, පුරප්පාඩුවී පවතින තනතුරු60 ක් සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු නොකර මාස 03ක සිට අවුරුදු 04 මාස 09 ක් දක්වා කාලයක් වැඩබැලීමේ පදනමින් පවත්වාගෙන ගොස් තිබුණි. මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කළමනාකරණ) තනතුර හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන) තනතුර ද ඒ අතර විය.
(ii) VIIවැනි පරිච්ඡේදයේ 12.2.6 ඡේදය	වැඩබැලීමේ වැටුප් ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ වැඩබැලීමේ වැටුප රු.4,925,474 ක් විය.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර	මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින්අයවැය ලේඛනය අනුමත

චක්‍රලේඛයේ5.2.4 හා 5.2.5ඡේද කර මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර එහිපිටපත් රේඛීය අමාත්‍යාංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුවුවද, අනුමත අයවැය ලේඛනයකින් තොරව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය කටයුතු කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැරමණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2003 අංක 40 දරන පොල් සංවර්ධන (සංශෝධිත) පනතේ 20 වගන්තියේ ඇතුළත් බලතල හා කර්තව්‍ය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟාකර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීමත් තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම මණ්ඩලයේ මෙහෙවර වූ අතර වාර්ෂිකව ඒ වෙනුවෙන් රු.මිලියන 638 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, රටේ ආහාර, පොල් තෙල්ඇතුළු අනෙකුත් නිෂ්පාදන සහ අපනයන සඳහා සාමාන්‍ය අවශ්‍යතාවය වූ පොල් ගෙඩි මිලියන 3,418 කින් පොල් ගෙඩි මිලියන 626 ක හිඟයක් පවතින බවටනිරීක්ෂණය විය.

(ආ) 2003 අංක 40 දරන පොල් සංවර්ධන (සංශෝධිත) පනතින් මණ්ඩලයට නියම වී ඇති කාර්යයන් අනුව නිසි වගා ක්‍රම හඳුන්වා දීම පිණිස මණ්ඩලය විසින් ආදර්ශ පොල් උයන් 12 ක්පවත්වාගෙන යනු ලබනනමුත් ඒවායේ අක්කර 3,790.07ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් පොල් වගා කර ඇති භූමි ප්‍රමාණය අක්කර 3,135.83 ක් ද, ඵලදරන පොල් වගා ඇති අක්කර 1,668.98 ක ඵලදරන පොල් ගස් 106,834 කින් 2020 වර්ෂයේ ඵලදාව ගෙඩි 5,024,208 ක්ද විය. එම ඵලදාව2019 වර්ෂයට වඩා ගෙඩි මිලියන 1.47 ක් හෙවත් සියයට 23 කින් ද,ඇස්තමේන්තුගත පොල් ඵලදාවට වඩා ගෙඩි මිලියන 1.69 කින් ද අඩු අගයක් විය.පොල් උයන් 09 ක පොල් ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 60 කට වඩා අඩුවෙන් පැවතීම,පොල් පැල 24,209 ක් පාලු සිටුවිය යුතු වීම,සියයට 44 ක් වූ ගස් 106,834 ක් ඵල නොදරන ඒවා වීම,මයිටා හානිය හා වෙනත් සාධක හේතුවෙන් සියයට 26 ක් වූ ගෙඩි 1,300,617 ක් ඵලදායී නොවීමයනාදී කරුණු අනුව ආදර්ශ මට්ටමින් පොල් උයන් පවත්වාගෙන නොයන බවට නිරීක්ෂණය විය.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැරමණ්ඩලයේසම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂමලෙසසහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

මීගමුව බීජ පොල් උයනේ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගෙන එම ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන ලියවිලි, සැලසුම් හා ප්‍රමාන පත්‍ර සකස් කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී පෞද්ගලික උපදේශක සමාගමකට ගෙවා ඇති රු.2,149,273 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලයේ සභාපති, සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ගෙන් සමන්විත පාලක සභාවකින් පාලනය වන, පෞද්ගලික විගණකවරුන් විසින් විගණනය කරනු ලබන මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ රාජකාරි කළ නිලධාරිණියන් දෙදෙනෙකු විසින් 2015 - 2021 අතර කාලය තුළ අවස්ථා 50 කදී චෙක්පත් 50 ක් තමන්ගේ නමින් හා ඥාතීන්ගේ නමින් ලියාගෙන රු.73,839,369 ක අරමුදලේ මුදල් වංචා කර ඇති බව විශේෂ විමර්ෂණයක් මඟින් අනාවරණය කරගෙන තිබුණි. අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කොට අභ්‍යන්තරවිගණනයක්සිදු කර නොතිබීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම, මූල්‍ය පාලන බලතල පැවරීමකින් තොරව එකම නිලධාරීන්ට වසර ගණනාවක් තිස්සේ අරමුදලේ කාර්යයන් සිදු කිරීමට ඉඩකඩ සලසා දී තිබීම, අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමු කර නොතිබීම යනාදී කරුණු අනුව අරමුදලේ පාලක සභාව සිය වගකීම නිසි ලෙස ඉටු කර නොතිබීම මෙම වංචාවට හේතු වී ඇති බවට නිරීක්ෂණය විය. වංචා කළ මුදල් අයකරගෙන නොතිබුණු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමීව සිදු කරන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) පාසිකුඩා හා තර්මකර්නි යන ආදර්ශ පොල් උයන් දෙකෙහි2020 වර්ෂයේ රු.16,133,667 ක් වූ ආදායමරු. 8,926,381 කින් ඉක්මවා රු.25,060,048 ක වියදමක් දරා තිබීමෙන් එම පොල් උයන් දෙක දිගින් දිගටම අලාභදායීව පවත්වා ගෙන යනු ලබන බවට නිරීක්ෂණය වූ නමුත් ඊට අවශ්‍ය පිළියම් යොදා ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 – 2018 වර්ෂ අතර කාලය තුළදී ප්‍රාදේශීය කාර්යාල මඟින් ගොවීන් වෙත රු.1,002,721,100 ක පොහොර සහනාධාර මුදල් ගෙවාතිබුණ ද,ඒපිළිබඳව පසු විපරමක්සිදු කර නොතිබීමෙන් රජයේ පොහොර සහනාධාර මුදල් ඵලදායීව යෙදවූ බවට සනාථ කළ නොහැකි විය.

(ඈ) 1997 හා 1999 වර්ෂයන්හි මණ්ඩලයේ පොල් මිලදීගත් පෞද්ගලික සමාගම් දෙකකින් අයවිය යුතු රු.3,808,156 ක්අය කර ගැනීමට නඩු පවරා තිබුණු නමුත් එම නඩු නිසි පරිදි මෙහෙයවා නොතිබීමෙන් වසර 23 ක් හා 24 ක කාලයක සිට එම මුදල් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙයින් රු.2,631,781 ක මුදලක් අයවිය යුතු ඩබ්ලිව්. ටී. වාස් සහ සමාගම සොයාගත නොහැකි බව දන්වා 2017 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුව අවසන් කර තිබුණු නමුත් එම සමාගම 2020 වර්ෂයේ තැරැව්කාර සමාගමක් ලෙස පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී පොල් වෙන්දේසි සඳහා සහභාගී වන බවනිරීක්ෂණය වීමෙන් මේවා මතභේදාත්මක ගනුදෙනු ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඉ) 2013 හා 2014වර්ෂයන්හි වැලිගම රෝග ව්‍යාප්ති වැඩසටහන හා කාබනික පොහොර වැඩසටහන වෙනුවෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572 ක්හා2014 වර්ෂයේදීලංකා සතොසට පොල් විකිණීමෙන් ලැබිය යුතු රු.302,288 ක් වශයෙන් එකතුව රු.6,875,860 ක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඊ) පොල් වගා කිරීමේ මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ පිරිවැය රු.1,513,300,588 ක් වූ දේපළ පිරියත හා උපකරණ තුළ වත්කම් බාණ්ඩ 07 ක පිරිවැය රු.86,383,238 ක වත්කම් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(උ) 2016,2017,2018 හා 2019 වර්ෂවලදීවියදම්වලට හර කළ නමුත් ගොවීන්ගේ බැංකු ගිණුම්අක්‍රීය වීම නිසා නැවත මණ්ඩලයේබැංකු ගිණුමට බැර වී තිබූ රජයේ පොහොර සහනාධාර මුදල් රු. 26,888,839 ක්භාණ්ඩාගාරයට යැවීමට කටයුතු නොකර “අවලංගු චෙක්පත් ” නමින් වගකීම් ගිණුමකට බැර ක්ර නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඌ) දකුණු පළාතේ “වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය” හා “ කොළ කුණුවීමේ රෝගය” පාලනය කිරීම සඳහා ඉවත් කරන ලද රෝගී පොල් ගස් 275,942 ක් සඳහා රු.580,956,180 ක වන්දි මුදලක් ඇතුළුව රෝගය පාලනය කිරීම සඳහා 2013 - 2020 කාලපරිච්ඡේදය තුළ

රු.131,673,048 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, 1999 අංක 55 දරන ශාක ආරක්ෂක පනතේ 4 (2) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන තිබූ රෝගී ගස් 11,240 ක් ගලවා විනාශ නොකිරීම හේතුවෙන් රෝගය මර්ධනය හෝ පාලනය කිරීමට නොහැකි වී තිබුණු බවට නිරීක්ෂණය විය.

(එ) පොල් වගා පාදක ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශන මට්ටමින් ආදර්ශ පොල් උයන් පවත්වාගෙන යමින් උසස් තත්ත්වයේ බීජ පොල්, පොල් පැළ ඇතුළු අතුරු භෝග හා අතුරු නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත බෙදා හැරීමේ අරමුණින් පොල් වගාවට අමතරව කොහු, කොප්පරා,පොල් කටු අඟුරු, පොල් ලෙලි විප්ස්,පොල් තෙල්, පොල් පැළ, අතුරු වගා පැළ හා පොහොර නිෂ්පාදනයත්, අතුරු භෝග වගා කිරීම, සත්ව පාලනය, සංචාරක නිවාස පවත්වාගෙන යාම හා කප්තුරුපාය අලෙවිසැල් පවත්වාගෙන යාමත්, පොල් උයන්වල විභවය අනුව වී හා රබර් වගා කිරීමත්, පොල් සංචාරක ව්‍යාපෘතිය හා ග්ලිරිසීඩියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සිදු කළ යුතු විය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය වන විට පවත්වාගෙන ආ බොහෝ ව්‍යාපෘති නතර කර දමා තිබීමත්,නව ව්‍යාපෘති ආරම්භ කර නොතිබීමත් හේතුවෙන් පොල් උයන් ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශ මට්ටමින් පවත්වාගෙන යන බවට නිරීක්ෂණය නොවීය.

(ඒ) ආදර්ශ පොල් උයන් හා පොල් පැළ තවාන් පවත්වාගෙන යමින් සිදු කරන කාර්යයට අමතරව කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය යටතේ 2000 - 2020 වර්ෂඅතර කාලය තුළ ව්ගාකරුවන් 9,826 දෙනෙකු වෙත ඉඩම් අක්කර 47,927 ක් සඳහා රු. මිලියන 3,195.65 ක ණය නිකුත් කර ඒ සඳහා රු.මිලියන 158.29 ක පොලී සහන ද ලබාදී තිබුණි. එසේ වුවද, 2000 වසරේදී ගෙඩි මිලියන 3,096ක් වූ දිවයිනේ පොල් නිෂ්පාදනය, අතර මැදි වර්ෂයන්හිදී අඩු වැඩි වශයෙන් වෙනස් වෙමින් 2020 වර්ෂයේදී ගෙඩි මිලියන 2,792 ක් වීමෙන් ගෙවී ගිය වසර 20 ක කාලය තුළ පොල් නිෂ්පාදනයේ කැපී පෙනෙන වර්ධනයක් සිදු වී ඇති බවට නිරීක්ෂණය නොවීය.

(ඔ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 07 ක් යටතේ වෙන් කර තිබුණු රු.මිලියන 800 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 226.72 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබීම,පොල් පැළ 1,660,000 ක්සඳහා ලබාදීමට සැලසුම් කළ රු.83,000,000 ක සහනාධාර මුදලින්රු.49,983,200 ක් හෙවත් සියයට 60 ක් ඉතිරි කර තිබීම,නවත් වැඩසටහන් 04 ක ප්‍රගතිය සියයට 5 ත් 64 ත් අතර පරාශයක ප්‍රමාණයක් වීම යන කරුණු අනුව සැලසුම් කළ ප්‍රගතියට ලභා වී නොමැති බවට නිරීක්ෂණය විය.

(ඕ)සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වලින් ලබා ගැනීමට සැලසුම් කළ පොල් ගෙඩි 6,735,000 කින් ලබාගත් ඵලදාව ගෙඩි 5,022,976 ක් වූ අතරකොහු කෙඳි හා කොහු බත් නිපදවීම තුළින්රු.11,781,000 ක් හා සත්ව පාලන ව්‍යාපෘති තුළින්රු.16,914,764 ක් උපයා ගැනීමට සැලසුම් කළ ද, උපයාගත් ආදායම පිළිවෙලින් රු.3,491,040 ක් හා රු.7,608,885 ක් විය. තවද,ආදර්ශ පොල් උයන් 03 ක අතුරු භෝග පැළ අලෙවියෙන්උපයා ගැනීමට සැලසුම් කළ රු.4,878,000 ක ආදායම උපයා ගෙන නොතිබුණු අතරරු.27,158,090 ක ආදායමක් උපයා ගැනීමේ අපේක්ෂාවෙන් රු.12,701,010 ක වියදමක් දරා සිදු කළ අතුරු භෝග වගාවන් තුළින් උපයාගෙන තිබුණු ආදායම රු.4,986,688 ක් විය. මේ හේතුවෙන් ආදර්ශ පොල් උයන්වල සැලසුම්ගත ප්‍රගතියට ලභා වී නොමැති බවට නිරීක්ෂණය විය.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement.

Coconut Cultivation Board

"Kapthurupiyasa"
No. 9/428, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla
011-2861331 / 011-5635623
www.coconut.gov.lk